කාර්ය සාධන වාර්තාව - 2021

සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව



පටුන

			පිටුව
01	අන්තර්ගතය		2 - 2
02	පරිච්ඡේදය 01	ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය	3 - 5
03	පරිච්ඡේදය 02	ප්‍රගතිය හා ඉදිරි දැක්ම	6 - 41
04	පරිච්ඡේදය 03	වසරේ සමස්ත මූල්‍ය කාර්යසාධනය	42 - 68
05	පරිච්ඡේදය 04	කාර්යසාධන දර්ශක	69 - 71
06	පරිච්ඡේදය 05	තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය	72 - 75
07	පරිච්ඡේදය 06	මානව සම්පත් පැතිකඩ	76 - 82
08	පරිච්ඡේදය 07	අනුකූලතා වාර්තාව	83 – 90
09	සංවර්ධන වැඩසටහන්වලට අදාල ඡායාරූප		91 - 91

පරිච්ඡේදය - 01- ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1 හැඳින්වීම

2017 අංක 2 දරණ සමෘද්ධි පනතින් සංශෝධිත 2013 අංක 01 දරණ දිවිනැගුම පනත මඟින් ස්ථාපිත මෙම ආයතනයට පැවරී ඇති ප්‍රධානම කාර්යය වන්නේ දිළිඳු පවුල් ලක්ෂ 18 ට සමෘද්ධි සුභසාධනය සලසමින් සමාජ ආරක්ෂණ අරමුදල මඟින් එම පවුල්වල දෛනික වැදගත් අවස්ථාවලදී ආරක්ෂණය සැලසීමට අදාලව දීමනා ලබාදෙමින්, ශ්‍රී ලංකාවේ දිළිඳුකම මුලින් උපුටා දැමීම සඳහා එම පවුල් සවිබලගැන්වීමට ඔවුන්ගේ ජීවනෝපාය ප්‍රවර්ධනයට අදාළ වැඩසටහන් සහ ප්‍රජාමූල බැංකු 1074 ක් මගින් දිවයින පුරා විසිරී සිටින එම දිළිඳු පවුල්වල සහ අඩු ආදායම්ලාභී පවුල්වලට අවශ්‍ය කරන විවිධ ක්ෂුද්‍ර මූල්‍ය ණය සම්පාදනය කිරීම වේ. මීට අමතරව, දිළිඳු පවුල් සහ අඩු ආදායම්ලාභී ජනතාව, ඒකරාශී කරමින් ප්‍රජාමූල සංවිධාන ජාලයක් ස්ථාපිත කොට පවත්වාගෙන යාමත්, සමාජ සංවර්ධනය උදෙසා විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමත් අරමුණු කෙරේ.

1.2.දැක්ම

"වසර 2030 වන විට දුගී බවෙන් තොර, සවිබලගැන්වූ සමෘද්ධිමත් ශ්‍රී ලංකාවක් බිහිකිරීමට කටයුතු කරන පුරෝගාමී ආයතනය බවට පත්වීම"

1.3.මෙහෙවර

අවාසි සහගත තත්ත්වයට පත් ජනතාව ආර්ථික, සමාජිය ,භෞතික, මානසික, නෛතික, හා පාරිසරික වශයෙන් බලගැන්වීම සඳහා කාර්යක්ෂම හා සඵලදායී වැඩසටහන් ප්‍රජා සහභාගීත්වය ලබා ගනිමින් තිරසාර ක්‍රමවේද ඔස්සේ ක්‍රියාවට නැංවීම.

1.4. ක්‍රියාත්මක ප්‍රධාන ධාරාවන්

2013 අංක 01 දරණ (දිවිනැගුම) සමෘද්ධි පනතේ විධි විධාන අනුව ,දෙපාර්තමේන්තුව පහත පරිදි වන ප්‍රධාන ධාරා තුනක් යටතේ ක්‍රියාත්මක වේ .

1. නිල ව්‍යුහය සහිත දෙපාර්තමේන්තු ධාරාව
2. ප්‍රජාමූල බැංකු පද්ධති ධාරාව
3. ප්‍රජාමූල සංවිධාන ධාරාව

1.4.1 නිල ව්‍යුහය සහිත දෙපාර්තමේන්තු ධාරාව

දෙපාර්තමේන්තුවේ සංයුතිය පහත පරිදි වන නිල තන්ත්‍රයකින් සමන්විත වේ. අධ්‍යක්ෂ ජනරාල් ගේ නිල නායකත්වය යටතේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල් තිදෙනෙකු සහ ප්‍රධාන අංශ 17 ක ප්‍රධානීන් මඟින් ක්‍රියාත්මක වේ. එනම්, පාලන, ආයතන, විමර්ශන, නීති, තොරතුරු තාක්ෂණ, විශ්‍රාම වැටුප්, මානව සම්පත් සංවර්ධන, සමාජ ආරක්ෂණ හා සුබසාධන, ජීවනෝපාය සංවර්ධන, සමාජ සංවර්ධන හා පරිසර, ප්‍රජාමූල සංවිධාන, ව්‍යාවසාය සංවර්ධන, සැලසුම් හා මෙහෙයුම්, ක්ෂුද්‍රමූල්‍ය (බැංකු), මාධ්‍ය, මුදල් හා අභ්‍යන්තර විගණන, යන අංශ භාර ප්‍රධානීන් ප්‍රධාන කාර්යාලයේ හා දිස්ත්‍රික් 25 ආවරණය වන ලෙසින් තම අංශවල රාජකාරී කටයුතු ක්‍රියාත්මක කරනු ලබයි. දිස්ත්‍රික් මට්ටමින් දිස්ත්‍රික් අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන් / දිස්ත්‍රික් ලේකම්වරුන්ගේ මෙහෙයවීම යටතේ ඇති දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරුන් සහ එම කාර්ය මණ්ඩලය මඟින් දිස්ත්‍රික්, ප්‍රාදේශිය

ලේකම් කොට්ඨාශ, කලාප හා ග්‍රාමනිලධාරී වසම් මට්ටමින් සමෘද්ධි (දිවිනැගුම) පනතේ අරමුණු ලඟාකර ගැනීමට අදාල රාජකාරී ක්‍රියාත්මක කරනු ලබයි. ප්‍රජාමූල බැංකු කටයුතු, ප්‍රජාමූල සංවිධාන ගොඩනැගීම සහ සංවර්ධන ව්‍යාපෘති ගම් මට්ටමින් ක්‍රියාත්මක කිරීම ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ මූලිකත්වයෙන් සමෘද්ධි කලමණාකරුවන් සහ සමෘද්ධි සංවර්ධන නිලධාරීන් ඇතුළු අනෙකුත් සියලු කාර්යාල හා ක්ෂේත්‍ර නිලධාරීන් විසින් ඉටු කරනු ලබයි. සමස්ත සේවක සංඛ්‍යාව 24,645 වේ.

1.4.2. ප්‍රජාමූල බැංකු පද්ධති ධාරාව


මෙම අංශයේ කාර්යභාරය වන්නේ, ප්‍රධාන කාර්යාලයේ ක්ෂුද්‍ර මූල්‍ය අධ්‍යක්ෂ යටතේ පාලනය වන කාර්ය මණ්ඩලය මඟින් සහ දිවයින පුරා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 331 ට අදාල මූලස්ථාන කාර්යාල හා ප්‍රජාමූල බැංකු සමිති, කලාප සහ ග්‍රාම නිලධාරී වසම් මට්ටමින් ක්‍රියාත්මක වන බැංකු 1,074 කට අදාල සියලු කාර්ය මණ්ඩලය මඟින් මෙම බැංකු පද්ධතිය ක්‍රියාත්මක කිරීමයි. එම පද්ධතිය මඟින් සමෘද්ධි සහනාධාර බෙදා දීම, ප්‍රතිලාභීන්ගේ අනිවාර්ය ඉතිරි කිරීමේ තැන්පතු පවත්වාගෙන යාම, ප්‍රතිලාභීන්ගේ තැන්පතු පවත්වාගෙන යාම හා ඉතුරුම් වර්ධනය, ප්‍රතිලාභීන්ට හා අඩු ආදායම්ලාභීන්ට ක්ෂුද්‍රමූල්‍ය ණය නිකුත් කිරීම, ඉතිරි අරමුදල් වැඩි ප්‍රතිලාභ ලැබෙන මූලාශ්‍රවල ආයෝජනය කිරීම සහ වෙනත් සමාජ සුබසාධන කටයුතු ක්‍රියාත්මක කිරීම ද කරනු ලබයි.

2021 වර්ෂය තුල දී ජීවනෝපාය සංවර්ධන කටයුතු නිවාස, පාරිභෝගික, ආපදා සහ වෙනත් ණය පහසුකම් අත්‍යවශ්‍ය ග්‍රාමීය ජනතාවට ණය ක්‍රම 19 ක් යටතේ ලබා දී තිබූ මුළු ණය වටිනාකම රු.මි.37,047 කි. ඊට අදාල ව නිකුත් කර ඇති ණය සංඛ්‍යාව 121,055 කි. 1999 සිට 2021 වර්ෂය අවසන් වන විට ප්‍රතිලාභීන්ට ලබා දී තිබූ මුළු ණය වල සමුච්චිත වටිනාකම රු.මි. 394,546.41 කි. ඊට අදාල සමුච්චිත ණය සංඛ්‍යාව 11,669,343 කි. සමස්ත බැංකු ගිණුම් සංඛ්‍යාව 15,410,660 කි. මුළු තැන්පතු මුදල මිලියන 149,373 කි. තව ද මෙම අංශයේ සියළු කටයුතු නව තොරතුරු තාක්ෂණ ක්‍රමවේද ඔස්සේ ක්‍රියාත්මක කර ජනතාවට වඩා කාර්යක්ෂම හා ගුණාත්මක සේවාවක් ඉන් ලබාදීමට අපේක්ෂිතය.

1.4.3. ප්‍රජාමූල සංවිධාන ධාරාව

2017 අංක 02 දරණ සමෘද්ධි පනතින් සංශෝධිත 2013 අංක 01දරණ දිවිනැගුම පනතට අනුව සමෘද්ධි ප්‍රජාමූල සංවිධාන, ප්‍රාදේශීය සංවිධාන හා සමෘද්ධි දිස්ත්‍රික් සංවිධාන පිහිටුවීම සඳහා අවශ්‍ය නියෝග හා ව්‍යවස්ථා (සමෘද්ධි පනතේ 42වන වගන්තිය) ඇතුලත් 2017 මාර්තු 07 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2009/08 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රය ප්‍රකාශයට පත්විය .ඒ අනුව සමෘද්ධි පනතේ මූලික අරමුණ වන දිළිඳුකම තුරන් කිරීම හා සමාජ සාධාරණත්වය ඉටු කිරීම උදෙසා සෑම ග්‍රාම නිළධාරි වසමක්ම ආවරණය වන පරිදි ස්වේච්ඡාවෙන් සංවිධානය වන සමෘද්ධි ප්‍රජාමූල සංවිධාන පිහිටුවීමත් (සමෘද්ධි පනතේ 09 වන වගන්තිය) ප්‍රාදේශීය සංවිධාන පිහිටුවීමත් (සමෘද්ධි පනතේ 15වන වගන්තිය) සමෘද්ධි දිස්ත්‍රික් කමිටු පිහිටුවීමත් (සමෘද්ධි පනතේ 19වන වගන්තිය) සිදුකර ඇත. ප්‍රජා මූල සංවිධාන පිහිටුවා ,ශක්තිමත් කොට ,ප්‍රජාව බලගන්වා ,ඔවුන් ආර්ථික ,සාමාජයීය හා අධ්‍යාත්මික වශයෙන් සංවර්ධනය කරමින්, ප්‍රජා මූල බැංකු හා ජීවනෝපාය වැඩසටහන් සඳහා යොමු කිරීමේ අරමුණින් ,2021 වර්ෂය වන විට ප්‍රජා මූල සංවිධාන 30,211ක් ද ප්‍රාදේශීය සංවිධාන 331ක් සහ දිස්ත්‍රික් කමිටු 25ක් ක්‍රියාත්මකව පවතී .

1.5 දෙපාර්තමේන්තු සංවිධාන ව්‍යුහය



පරිච්ඡේදය – 02 - ප්‍රගතිය හා ඉදිරි දැක්ම

2.1 දෙපාර්තමේන්තුව මඟින් ක්‍රියාත්මක කරන ලද ප්‍රධාන වැඩසටහන්වල ප්‍රගතිය

2.1.1 සමාජ සුභසාධන වැඩසටහන

2.1.1.1 හැඳින්වීම

දිළිඳුකම පිටුදැකීමේ මූලික පරමාර්ථය කේන්ද්‍රකර ගනිමින් ක්‍රියාත්මක වන රජයේ ප්‍රධාන සුභසාධන වැඩසටහන ලෙස 1994 සිට මේ දක්වා සමෘද්ධි ව්‍යාපාරය ක්‍රියාත්මක වෙමින් පවති.මෙම ව්‍යාපාරය ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය හා සමෘද්ධි කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව ලෙස ආයතන දෙකක් යටතේ ක්‍රියාත්මක වූ අතර සහනාධාර වැඩසටහන සමෘද්ධි කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක විය.

එමෙන්ම 2013 අංක 01 දරණ දිවිනැගුම පනතින් ස්ථාපනය කරන ලද දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව 2017 අංක 02 දරණ සමෘද්ධි පනත හරහා සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව ලෙස සංශෝධනය විය. ඒ අනුව සහනාධාර වැඩසටහන මෙම දෙපාර්තමේන්තුවේ සමාජ ආරක්ෂණ හා සුභසාධන අංශය යටතේ දැනට ක්‍රියාත්මක වේ.

2.1.1.2 සහනාධාර වැඩසටහනේ ප්‍රධාන අරමුණු

- දිළිඳු ජනතාවගේ පෝෂණ අවශ්‍යතා සපුරාදීම හා සංවර්ධන අවශ්‍යතා සඳහා ඔවුන් පෙළගැස්වීම.
- නිවාස ලොතරැයි අරමුදල සඳහා දායක කර ගැනීම.
- අනිවාර්යය ඉතුරුම් තුලින් අඩු ආදායම්ලාභියා මූල්‍ය වශයෙන් ශක්තිමත් කිරීම.
- සමාජ ආරක්ෂණ වැඩසටහනට දායක කර ගනිමින් එම පවුල්වල අපේක්ෂිත හා අනපේක්ෂිත අවධානම් අවස්ථාවලදි මූල්‍ය ශක්තිය ලබාදීම.

2.1.1.3 සහනාධාර වර්ගීකරණය

සංඛ්‍යා සටහන - (I)

පවුලේ සාමාජික සංඛ්‍යාව	සහනාධාර වටිනාකම (රු.)	සහනාධාර දීමනාව බෙදියන ආකාරය			
		අනිවාර්යය ඉතිරිකිරීම් (රු.)	සමාජ ආරක්ෂණ (රු.)	නිවාස ලොතරැයි අරමුදල (රු.)	ප්‍රතිලාභියාට ගෙවිය යුතු මුදල (රු.)
04 හෝ 04 ට වැඩි	3500/-	300/-	100/-	80/-	3020/-
03 (තිදෙනෙකුට)	2500/-	200/-	100/-	80/-	2120/-
03 (තිදෙනෙකුට අඩු)	1500/-	100/-	100/-	80/-	1220/-
සවිබලගැන්වූ පවුල්	420/-	240/-	100/-	80/-	-

2.1.1.4 සමෘද්ධි සහනාධාර පවුල

එකම නිවසක් තුල පදිංචි පියා ඇතුළු අවිවාහක දරුවන් හා එම පවුලෙන් යැපෙන වැඩිහිටියන් හා වෙනත් අය එක පවුලක් ලෙස සලකා කටයුතු කරනු ලැබේ.

2.1.1.5 සමෘද්ධි සහනාධාරලාභී පවුලක් තෝරා ගැනීමේදී සළකා බලනු ලබන ප්‍රධාන නිර්ණායක

i. අධ්‍යාපනය

ii සෞඛ්‍යය

iii පවුලේ ආර්ථික මට්ටම

iv වත්කම්

v නිවාස තත්වය

vi පවුලේ ජන විකාශනය

2.1.1.6 සහනාධාර අනුමත කිරීම

වසම් මට්ටමින් ලබා ගන්නා නාමලේඛන සැලකිල්ලට ගැනීමෙන් අනතුරුව, ග්‍රාමීය කමිටුවේ නිර්දේශය ලබා, බැංකු කළාප කළමණාකරු විසින් අදාළ ප්‍රාදේශීය ලේකම් වෙත යොමු කරනු ලබන ප්‍රතිලාභී ලේඛණ සලකා බලා ඉල්ලුම්කරු වෙත සමෘද්ධි සහනාධාර හිමිකම ලබාදීමේ බලය ප්‍රාදේශීය ලේකම් වෙත පවරා ඇත.

2.1.1.7 අභියාචනා / විරෝධතා

සහනාධාර ලැබීමට තමාට සුදුසුකම් තිබියදීත් නොලැබී ඇති බව හැඟීයන්නේ නම් ඒ පිළිබඳ අභියාචනා දිස්ත්‍රික් ලේකම් වෙත ඉදිරිපත් කල යුතුය. එහිදී ගනු ලබන තීරණය පිළිබඳව සෑහීමකට පත් නොවන්නේ නම් ප්‍රධාන කාර්යාලයේ සමෘද්ධි අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කළ හැකිය.

2.1.1.8 සමෘද්ධි සහනාධාර නොලැබී යන අවස්ථා

I. රජයේ හෝ පෞද්ගලික අංශයේ ස්ථිර රැකියාවක් කරන සාමාජිකයෙකු පවුල් ඒකකය තුළ සිටීම.

II. රජයේ රැකියාවක නිරත වීම හේතුවෙන් විශ්‍රාම වැටුපකට හිමිකම් කියන්නෙකු පවුල් ඒකකය තුළ සිටීම.

III. ආදායම් උත්පාදන ක්‍රියාදාමයක් තුළින් ඉහළ ආදායම් උපයන සවිබලගැන්වී ඇති පවුල්.

IV. රැකියා සඳහා විදේශ ගතවී මාස 06ක් ඉක්මව ගොස් ඇති අය සහිත පවුල්.

V. ග්‍රාමීය කමිටුව විසින් හඳුනාගනු ලබන සැලකිය යුතු දෛනික ආදායම් ලබන පුහුණු ශ්‍රමිකයන් සහිත පවුල්.

2.1.1.9 පූජ්‍ය පක්ෂය වෙත සහනාධාර ලබාදීම

පූජ්‍ය පක්ෂයට හිමි සහනාධාරය වන්නේ තනි පුද්ගලයන්ට හිමි රු.1500/- යේ සහනාධාර වටිනාකමයි. වයස අවුරුදු 18 ට අඩු පූජ්‍ය පක්ෂයට හිමි සහනාධාර මුදල් ආයතනයේ නීත්‍යානුකූල භාරකරුවන්ගේ ගිණුම් වලට බැර කෙරේ.මෙම ආගමික ආයතන රජයේ ලියාපදිංචි විය යුතුය.

2.1.1.10 වැඩිහිටි නිවාස/ළමා නිවාස/ආබාධිත නිවාස

පරිවාස හා ළමාරක්ෂක දෙපාර්තමේන්තුවේ හා සමාජ සේවා දෙපාර්තමේන්තුවේ ලියාපදිංචිය ලබා ඇති ප්‍රමාණවත් ආදායමක් නොලබන අය තනි පුද්ගලයන් සේ සලකා රු1500/- ක සහනාධාරයක් නිකුත් කර ඇත.වයස අවුරුදු 18 ට අඩු දරුවන් සඳහා හිමි සහනාධාර අදාළ නිවාස භාර පාලිකාවන් නමින් ලබාදෙන අතර වයස අවුරුදු18ට වැඩි දරුවන් සඳහා කේවල ක්‍රමයට ලබාදේ.

2.1.1.11 සහනාධාර මුදල් ප්‍රතිලාභියා වෙත නිදහස් කිරීම

සහනාධාර දීමනා ගෙවීම සඳහා අවශ්‍ය මුදල් ප්‍රතිලාභී කළමනාකරණ මොඩියුලය හරහා සමෘද්ධි ප්‍රජාමූල බැංකු මට්ටමින් ලබාදෙන මාසික උපරීම වාර්තා පදනම් කර ගනිමින් ප්‍රධාන කාර්යාලය මඟින් සමෘද්ධි ප්‍රජාමූල බැංකුවේ නිල ජංගම ගිණුම වෙත ඉලෙක්ට්‍රොනිකව මුදල් ප්‍රේෂණය කළ පසු ප්‍රතිලාභීන්ගේ ඉතුරුම් ගිණුම් හරහා මුදල් ගෙවීමට කටයුතු කරයි.

2.1.1.12. පසුගිය වසර 05 තුළ සමෘද්ධි සහනාධාර ප්‍රතිලාභීන් සංඛ්‍යාව හා වියදම (2017 - 2021)

සංඛ්‍යා සටහන - (II)

වර්ෂය	ප්‍රතිලාභීන් සංඛ්‍යාව	වියදම (රු).
2017	1,388,242	39,707,051,488.00
2018	1,384,021	39,257,773,920.00
2019	1,800,182	44,676,637,360.00
2020	1,770,086	52,471,893,980.00
2021	1,760,485	51,550,652,440.00

2.1.1.13. 2021 වර්ෂයේ සමෘද්ධි ප්‍රතිලාභීන් සංඛ්‍යාව දිස්ත්‍රික්ක අනුව

සංඛ්‍යා සටහන - (III)

දිස්ත්‍රික්කය	රු.420 /=	රු. 1,500 /=	රු. 2,500 /=	රු. 3,500 /=	මුළු ප්‍රතිලාභීන් සංඛ්‍යාව
කොළඹ	544	25,620	10,150	16,906	53,220
ගම්පහ	3,338	53,678	27,644	51,157	135,817
කළුතර	3,453	31,645	12,922	22,433	70,453
මහනුවර	2,335	44,710	17,197	34,243	98,485
මාතලේ	1,404	23,090	9,784	17,814	52,092
නුවරඑළිය	4,333	24,259	10,932	13,789	53,313
ගාල්ල	4,275	28,899	15,377	31,614	80,165
මාතර	1,225	29,049	13,241	25,818	69,333
හම්බන්තොට	1,487	20,919	13,414	28,705	64,525

දිස්ත්‍රික්කය	රු.420 /=	රු. 1,500 /=	රු. 2,500 /=	රු. 3,500 /=	මුළු ප්‍රතිලාභීන් සංඛ්‍යාව
යාපනය	2	24,829	14,185	39,428	78,444
මන්නාරම	-	6,821	4,244	11,640	22,705
වවුනියාව	299	7,276	4,693	11,251	23,519
මුලතිව්	15	7,800	4,924	11,521	24,260
කිළිනොච්චි	22	7,609	4,254	11,866	23,751
මඩකලපුව	9,258	33,081	18,452	38,435	99,226
අම්පාර	7,218	32,079	15,619	30,036	84,952
ත්‍රිකුණාමලය	1,081	21,805	12,133	25,406	60,425
කුරුණෑගල	5,523	64,540	32,306	66,273	168,642
පුත්තලම	585	28,127	11,805	23,269	63,786
අනුරාධපුරය	1,750	33,669	13,939	22,443	71,801
පොළොන්නරුව	1,900	10,977	8,490	14,603	35,970
බදුල්ල	1,814	31,707	14,952	26,933	75,406
මොණරාගල	3,893	20,751	12,166	20,421	57,231
රත්නපුරය	5,100	35,277	26,524	55,706	122,607
කෑගල්ල	4,484	24,440	13,548	27,885	70,357
එකතුව	**65,338**	**672,657**	**342,895**	**679,595**	**1,760,485**

2.1.2 සමෘද්ධි සමාජ ආරක්ෂණ වැඩසටහන

2.1.2.1 හැඳින්වීම

ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ ලියාපදිංචි අංක 8 දරණ භාරකාර ඔප්පුව මගින් 1997.01.01 දින සිට බල පැවැත්වෙන පරිදි සමෘද්ධි කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව යටතේ සමෘද්ධි සමාජ ආරක්ෂණ අරමුදල නමින් අරමුදලක් ආරම්භ කර පවත්වාගෙන යන ලදි. සමාජ ආරක්ෂණ අරමුදල ලාභ නොලබන පදනමින් සුභසාධන අරමුණ පෙරදැරිව සංස්ථාපනය කොට ඇත. සමෘද්ධි ප්‍රතිලාභීන්ගේ ස්වේච්ඡා මාසික දායකත්වය, බැංකු ආයෝජනයන් සහ සමාජ ආරක්ෂණ අරමුදල මගින් පාලනය වන නිලාවේලි සමෘද්ධි පුහුණු මධ්‍යස්ථානය වැනි ආයතන මගින් ලැබෙන ආදායම් තුලින් සමෘද්ධි සමාජ ආරක්ෂණ අරමුදල ගොඩනැගී ඇති අතර, එම අරමුදල් භාවිතයෙන් සමාජ ආරක්ෂණ වැඩසටහන ක්‍රියාත්මක කෙරේ.

2013 අංක 01 දරණ දිවිනැගුම පනතට අනුව දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව පිහිටුවීමේ දී, සමෘද්ධි කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ කටයුතු එලෙසම ක්‍රියාත්මක කිරීම සඳහා මීට සම්බන්ධ කරන ලදී. ඒ අනුව දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව යටතේ දිවිනැගුම සමාජ ආරක්ෂණ අරමුදල ලෙස ක්‍රියාත්මක වූ අතර, 2017 වර්ෂයේ සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව නමින් දෙපාර්තමේන්තු නාමය සංශෝධනය වීමත් සමග සමෘද්ධි සමාජ ආරක්ෂණ අරමුදල නමින් ක්‍රියාත්මක වේ.

සමෘද්ධි ප්‍රතිලාභීන් විසින් ස්වකැමැත්තෙන් දෙනු ලබන මාසික දායකත්ව මුදල හා එම දායකත්ව මුදලින් ප්‍රතිලාභී ගෙවීම් සිදු කිරීමෙන් අනතුරුව ඉතිරි වන මුදල් රාජ්‍ය බැංකුවල ආයෝජනය සහ එමඟින් උපයා ගන්නා පොලී ආදායම් මඟින් මෙම අරමුදල ගොඩනැගී ඇත. එසේ ගොඩනගාගත් අරමුදල තුලින් සමෘද්ධි ප්‍රතිලාභීන්, අඩුආදායම්ලාභීන් හා අවාසි සහගත තත්වයන්ට පත්වූ පුද්ගලයන්,කණ්ඩායම්, ආයතන සඳහා

ප්‍රතිලාභ දෙනු ලැබේ. ප්‍රධාන වශයෙන් උපත් ,නිවුන් දරු උපත්, විවාහ, රෝහල් ගතවීම, මරණ සහ සිප්දොර ශිෂ්‍යත්ව යන අපේක්ෂිත හා අනපේක්ෂිත සිදුවීම් සඳහා රක්ෂණ ක්‍රමවේදයක් වශයෙන් ප්‍රතිලාභ ලබා දේ. මීට අමතරව සමෘද්ධි සමාජ ආරක්ෂණ භාරකාර මණ්ඩලයේ අනුමැතිය මත සමාජයේ අවාසි සහගත තත්වයට පත් පුද්ගලයින්, කණ්ඩායම්, ආයතන සඳහා මූල්‍යමය සහ ද්‍රව්‍යමය ආධාර ලබා දේ.
එසේම අරමුදලට අයත් ස්ථාවර වත්කමක් වන නිලාවේලි සමෘද්ධි පුහුණු මධ්‍යස්ථානය අභ්‍යන්තර සහ වෙනත් ආයතන වෙත නේවාසික පහසුකම්, පුහුණුවීම්,දේශණ, වැඩමුළු ආදීන් සඳහා ලබා දේ.

2.1.2.2 අරමුදල මගින් දැනට ඉටුකරනු ලබන කාර්යයන්

- සමෘද්ධිලාභී පවුල්වල පළමු, දෙවන හා තෙවන දරු උපත් සඳහා
  රු. 10,000/=ගෙවීම් කිරීම
- ඉහත රු. 10,000/= ට අමතරව නිවුන් දරු උපත් සඳහා පහත පරිදි ගෙවීම් කිරීම
  - දරුවන් දෙදෙනෙකුට මාසික රු. 5,000/= බැගින් වර්ෂයක්
  - දරුවන් තිදෙනෙකුට වැඩි අවස්ථාවක මාසිකව රු. 10,000/= බැගින් වර්ෂයක්
- සමෘද්ධිලාභී පවුල්වල ප්‍රතිලාභියාගේ හා දරුවන්ගේ විවාහ 02 ක් සඳහා
  රු. 10,000/=ගෙවීම් කිරීම

- සමෘද්ධිලාභී පවුල්වල ප්‍රතිලාභියා හෝ කලත්‍රයා සහ පවුලේ අවිවාහක දරුවන් රෝහල් ගත වීමක දී දිනකට රු.350/= බැගින් වර්ෂයේ දින 30 ක් සඳහා
  රු. 10,500/= ලෙස ප්‍රතිලාභ ගෙවීම් කිරීම.

- සමෘද්ධිලාභී පවුල්වල මරණයක් සඳහා රු. 20,000/=ගෙවීම් කිරීම.

- දිවයින පුරා විසිරී සිටින සමෘද්ධිලාභී පවුල්වල අ.පොස. (උ.පෙළ) හදාරන සියළුම සිසු දරු දැරියන්ට මසකට රු. 1,500/= බැගින් වසර දෙකක අධ්‍යයන කාලයක් සඳහා ශිෂ්‍යත්ව මුදල් ලබා දේ. යම් කිසි හේතුවක් මත විභාගය පැවැත්වීමට නියමිත දිනය කල් දැමීමක් සිදු වුවහොත් එලෙස විභාගය පවත්වන මාසය දක්වා ගෙවීම් කිරීමට ද කටයුතු කරනු ඇත.

- සමෘද්ධි සමාජ ආරක්ෂණ භාරකාර මණ්ඩලය මඟින් අනුමත කරනු ලබන වෙනත් අඩු ආදායම්ලාභීන් ඉලක්ක කරගත් සනීපාරක්ෂක වැසිකිලි ඉදිකිරීම් වැනි සමාජ සංවර්ධන ව්‍යාපෘතිද අවස්ථානුකූලව ක්‍රියාත්මක කරනු ලබයි.

2.1.2.3 නිලාවේලි සමෘද්ධි මධ්‍යස්ථානය

මෙම පුහුණු මධ්‍යස්ථානය තුල පුහුණු වැඩසටහන් පැවැත්වීම හා දෙස් විදෙස් සංචාරකයන් හට නේවාසික පහසුකම් ලබාදීමේ කටයුතු සිදු කරනු ලබයි. මධ්‍යස්ථානය තුල පුහුණු ලාභීන් සඳහා දේශන ශාලා පහසුකම් හා නේවාසික පහසුකම් ලබාදෙනු ලැබේ. මෙම පුහුණු මධ්‍යස්ථානය තුල නේවාසිකයින් 115 කු සඳහා

නේවාසික පහසුකම් ලබාදිය හැක. පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා දේශන ශාලා 05 කින් සමන්විත මෙම පුහුණු මධ්‍යස්ථානයේ එක වර පුහුණු ලාභීන් 250 දෙනෙකු සඳහා පුහුණුව ලබාදිය හැක.

2.1.2.4 පොතුවිල සංචාරක බංගලාව

කුරුණෑගල දිස්ත්‍රික්කයේ පොල්පිතිගම ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයට අයිති පොතුවිල ගම්මානය ආශ්‍රිත ඉතා මනරම් පරිසරයක සමාජ ආරක්ෂණ අරමුදල් යොදවා එවකට පැවති සමෘද්ධි කොමසාරි ජනරාල් දෙපාර්තමේන්තුව මගින් මෙම නිවාඩු නිකේතනය ඉදිකර ඇත.

වර්ථමානයේ මෙම සංචාරක බංගලාව මහවැලි ජල සුරක්ෂිත ආයෝජන වැඩසටහන වෙත රු. 30,000.00 මාසික කුලි පදනම මත ලබා දී ඇත.

2.1.2.5 ලබාගත් සමාජ ආර්ථික ප්‍රතිඵල

- ප්‍රතිලාභීන්ගේ ජීවන තත්වය පහත වැටීමට සිදු වන අවස්ථාවල දී මූල්‍යමය හා වෙනත් ආධාර සැපයීම තුලින් ඔවුන්ගේ පවුල් ආරක්ෂා කිරීම.
- අ.පොෂ (සා.පෙළ) සමත් අ.පොෂ (උ.පෙළ) හැදෑරීමට වරම් ලද සමෘද්ධි ප්‍රතිලාභී දරුවන්ගේ ද්විතීක අධ්‍යාපනය බිඳ වැටීමට ඉඩ නොදී සාර්ථක උසස් අධ්‍යාපනයක් සඳහා දිරිගැන්වීම.
- උපත් සහ නිවුන් දරු උපත් හා රෝග සඳහා මූල්‍යමය ප්‍රතිලාභ ලබා දීම තුලින් පෝෂණ මට්ටම ඉහල නංවා සෞඛ්‍ය සම්පන්න සමාජ ආරක්ෂණ පරිසරයක් සඳහා දායකත්වය සැපයීම.
- සමෘද්ධි සහනාධාරලාභීන් සඳහා වූ ප්‍රධානතම සමාජ ආරක්ෂණ ජාලය උදෙසා දායකවීම තුලින් ජනගහන දරිද්‍රතා දර්ශකය පහත හෙළීමට හේතු වී ඇත.
- ඉහල පොලී අනුපාතයන් යටතේ ආයෝජනය කිරීම තුලින් අරමුදලේ මූල්‍ය තත්වය ප්‍රශස්ථ මට්ටමක පවත්වා ගැනීම.

සංඛ්‍යා සටහන - (IV)

සමාජ ආරක්ෂණ ප්‍රතිලාභී ගෙවීම්

2021.01.01 දින සිට 2021.12.31 දින දක්වා

අනු අංකය	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය	උපත්		විවාහ		රෝග		මරණ		ශිෂ්‍යත්ව		නිවුන්දරු උපත්		එකතුව	
		ප්‍රමා	මුදල රු.	ප්‍රමා	මුදල රු.	ප්‍රමා	මුදල රු.	ප්‍රමා	මුදල රු.	ප්‍රමා	මුදල රු.	ප්‍රමා	මුදල රු.	ප්‍රමාණය	මුදල රු.
1	කොළඹ	150	1,500,000.00	611	6,110,000.00	1,422	5,956,900.00	1,409	28,105,000.00	6,913	10,369,500.00	11	55,000.00	10,516	52,096,400.00
2	ගම්පහ	642	6,417,500.00	1,930	19,297,500.00	7,114	29,618,000.00	2,828	56,555,000.00	27,307	40,960,500.00	32	180,000.00	39,853	153,028,500.00
3	කළුතර	203	2,030,000.00	1,070	10,700,000.00	3,117	13,811,700.00	2,259	45,180,000.00	12,153	18,229,500.00	48	240,000.00	18,850	90,191,200.00
4	මහනුවර	456	4,560,000.00	1,427	14,270,000.00	2,781	11,361,550.00	2,354	47,080,000.00	17,097	25,645,500.00	63	370,000.00	24,178	103,287,050.00
5	මාතලේ	494	4,940,000.00	800	8,000,000.00	2,509	10,231,100.00	1,265	25,295,000.00	12,531	18,796,500.00	42	210,000.00	17,641	67,472,600.00
6	නුවරඑළිය	370	3,700,000.00	612	6,120,000.00	1,163	5,054,000.00	1,247	24,940,000.00	14,483	21,724,500.00	17	85,000.00	17,892	61,623,500.00
7	ගාල්ල	360	3,600,000.00	1,331	13,310,000.00	3,407	14,089,500.00	2,077	41,540,000.00	11,132	16,698,000.00	39	195,000.00	18,346	89,432,500.00
8	මාතර	534	5,340,000.00	1,287	12,870,000.00	3,370	13,626,550.00	1,864	37,280,000.00	10,108	15,162,000.00	29	145,000.00	17,192	84,423,550.00
9	හම්බන්තොට	752	7,517,500.00	1,187	11,870,000.00	2,821	11,522,650.00	1,098	21,945,000.00	11,788	17,682,000.00	125	675,000.00	17,771	71,212,150.00
10	යාපනය	1,123	11,220,000.00	1,614	16,140,000.00	3,506	12,932,500.00	1,530	30,600,000.00	18,290	27,435,000.00	74	395,000.00	26,137	98,722,500.00
11	මන්නාරම	387	3,870,000.00	575	5,750,000.00	928	3,370,400.00	297	5,940,000.00	3,481	5,228,500.00	28	140,000.00	5,696	24,298,900.00
12	වව්නියාව	281	2,810,000.00	416	4,160,000.00	545	2,675,400.00	284	5,680,000.00	4,713	7,069,500.00	50	250,000.00	6,289	22,644,900.00
13	මුලතිව්	440	4,400,000.00	522	5,220,000.00	3,598	3,190,150.00	280	5,600,000.00	7,492	11,238,000.00	36	180,000.00	12,368	29,828,150.00
14	කිලිනොච්චි	373	3,730,000.00	452	4,520,000.00	1,455	6,874,000.00	333	6,660,000.00	7,806	11,709,000.00	71	355,000.00	10,490	33,848,000.00
15	මඩකලපුව	1,175	11,750,000.00	2,641	26,410,000.00	5,204	19,087,400.00	1,745	34,900,000.00	17,465	26,197,500.00	125	705,000.00	28,355	119,049,900.00
16	අම්පාර	1,139	11,390,000.00	2,584	25,840,000.00	5,652	21,987,250.00	1,692	33,840,000.00	18,370	27,555,000.00	86	450,000.00	29,523	121,062,250.00
17	ත්‍රිකුණාමලය	1,197	11,970,000.00	1,453	14,530,000.00	1,734	6,678,350.00	979	19,580,000.00	7,587	11,379,000.00	130	930,000.00	13,080	65,067,350.00
18	කුරුණෑගල	977	9,770,000.00	1,876	18,760,000.00	3,845	16,007,400.00	3,322	66,440,000.00	11,087	16,630,500.00	100	590,000.00	21,207	128,197,900.00
19	පුත්තලම	711	7,110,000.00	1,371	13,710,000.00	2,121	9,821,450.00	1,682	33,640,000.00	11,167	16,750,500.00	84	430,000.00	17,136	81,461,950.00
20	අනුරාධපුරය	580	5,800,000.00	1,153	11,530,000.00	2,254	10,261,150.00	1,519	30,380,000.00	10,188	15,432,000.00	95	345,000.00	15,789	73,748,150.00
21	පොළොන්නරුව	447	4,470,000.00	629	6,290,000.00	1,226	4,978,400.00	584	11,680,000.00	4,146	6,222,000.00	31	155,000.00	7,063	33,795,400.00
22	බදුල්ල	673	6,730,000.00	1,389	13,890,000.00	3,774	15,209,600.00	1,819	36,380,000.00	23,876	35,814,000.00	224	675,500.00	31,755	108,699,100.00
23	මොණරාගල	629	6,290,000.00	1,209	12,085,000.00	2,515	10,675,250.00	973	19,450,000.00	12,856	19,284,000.00	100	500,000.00	18,282	68,284,250.00
24	රත්නපුර	1,124	11,240,000.00	2,014	20,140,000.00	5,434	23,170,000.00	2,889	57,780,000.00	18,533	27,799,500.00	139	695,000.00	30,133	140,824,500.00
25	කෑගල්ල	325	3,250,000.00	944	9,440,000.00	3,497	14,884,550.00	2,086	41,735,000.00	13,470	20,205,000.00	49	245,000.00	20,371	89,759,550.00
	එකතුව	**15,542**	**155,405,000.00**	**31,097**	**310,962,500.00**	**74,992**	**297,075,200.00**	**38,415**	**768,205,000.00**	**314,039**	**471,217,000.00**	**1,828**	**9,195,500.00**	**475,913**	**2,012,060,200.00**

2.1.3. ක්ෂුද්‍ර මූල්‍ය වැඩසටහන

2.1.3.1 හැඳින්වීම

1995 අංක 30 දරණ ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරියේ පනත අනුව සමෘද්ධි ජාතික වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා සමෘද්ධි බැංකු සංගම් 1996 දී ආරම්භ කළ අතර, අඩු ආදායම්ලාභීන්ගේ ඉතිරි කිරීම් වර්ධනය කර, ඒ තුලින් ආයෝජන ශක්තිය වැඩි කිරීමටත් නිෂ්පාදන සහ සේවා වර්ධනයට අවශ්‍ය ප්‍රාග්ධනය (ණය පහසුකම්) සැපයීමටත්, අවිධිමත් ණය ගණුදෙනු අඩු කිරීමටත්, එමඟින් ඔවුන් ණය බරින් මුදවාලමින් ලාභදායී ආයතනික රටාවක් ඇතිකිරීමේ අරමුණින්, ප්‍රධාන කාර්යාලයේ ක්ෂුද්‍ර මූල්‍ය අංශය, ප්‍රාදේශිය මට්ටමින් සමෘද්ධි ප්‍රජාමූල බැංකු සමිති 331 ක් හා කලාප මට්ටමින් සමෘද්ධි ප්‍රජාමූල බැංකු 1,074 ක් ක්‍රියාත්මක වේ.

2.1.3.2 අරමුණු

1. බැංකු පද්ධතිය සඳහා නව ණය ක්‍රම හඳුන්වා දීම හා ඒ සඳහා අවශ්‍ය චක්‍රලේඛ හා මෙහෙයුම් නියෝග නිකුත් කිරීම.
2. අනෙකුත් මෙහෙයුම් කටයුතු සඳහා අවශ්‍ය වන්නා වූ මඟ පෙන්වීම්, උපදෙස් නිකුත් කිරීම.
3. තැන්පතු ප්‍රවර්ධන වැඩසටහන් හඳුන්වා දීම හා ඒ සඳහා අවශ්‍ය මඟ පෙන්වීම් හා උපදෙස් නිකුත් කිරීම.
4. බැංකු අරමුදල් ආයෝජනය කිරීම හා ප්‍රාදේශීය මට්ටමින් උපදෙස් නිකුත් කිරීම.
5. ක්ෂුද්‍ර මූල්‍ය රක්ෂණ කටයුතු සිදු කිරීම.
6. සියළු බැංකුවල ජාතික මට්ටමින් විමර්ශණ කටයුතු සිදු කිරීම හා ඒ පිළිබඳ උපදෙස් නිකුත් කිරීම.
7. සමෘද්ධි ප්‍රජාමූල බැංකු හා බැංකු සමිතිවල අවසාන ගිණුම් සඳහා ලබාදෙන විගණන වාර්තා අනුව අවසන් ගිණුම් සහතික කිරීම හා ලාභ විසර්ජනය සඳහා නියෝග ලබාදීම.
8. බැංකු සඳහා ප්‍රතිමූල්‍ය ණය පහසුකම් සැපයීම හා ණය විශ්ලේෂණ කටයුතු සිදු කිරීම.
9. සමෘද්ධි ප්‍රජාමූල බැංකු හා බැංකු සමිති සඳහා ඉඩම් පවරා ගැනීම/ මිලට ගැනීම් කටයුතු සහ බැංකු ගොඩනැගිලි ඉදි කිරීම සඳහා අරමුදල් සැපයීම හා වත්කම් කළමනාකරණය.
10. සමෘද්ධි ප්‍රජාමූල කළමනාකරණ මණ්ඩලය රැස් කිරීම, කළමනාකරණ මණ්ඩල පත්‍රිකා ඉදිරිපත් කිරීම හා එම නියෝග ක්‍රියාත්මක කිරීම.
11. සියළුම ප්‍රජාමූල බැංකු හා බැංකු සමිතිවල අධීක්ෂණ, ප්‍රගති පාලනය, පසු විපරම් කිරීම.
12. සමෘද්ධි ප්‍රතිලාභීන්, ප්‍රජාමූල බැංකු සමිති හරහා පිළිගත් ආයතන හා සංවිධාන මඟින් දියත් කරන ව්‍යාපෘති සමඟ සම්බන්ධීකරණය කිරීම.
13. ජීවනෝපාය හා අලෙවි අංශ ක්‍රියාත්මක කරන වැඩසටහන් සඳහා ප්‍රජාමූල බැංකු සමිතිවල නිර්මාණශීලී දායකත්වය ලබාදීමට කටයුතු කරවීම.

2.1.3.3 බැංකු සාමාජිකත්වය හා කොටස් ප්‍රාග්ධන ප්‍රගතිය

සමෘද්ධි ප්‍රතිලාභීන් හා අඩු ආදායම්ලාභීන් රු.500/- ක කොටසක් මිලදී ගැනීමෙන්, ඔවුනට සමෘද්ධි ප්‍රජාමූල බැංකුවේ සාමාජිකත්වය හිමිවේ. ඒ තුළින් ඔවුන් බැංකුවේ කොටස්කරුවන් බවට පත්වේ.

සංඛ්‍යා සටහන - (V)

සමෘද්ධි ප්‍රජාමූල බැංකු සාමාජිකත්ව ප්‍රගතිය - (2010-2021)


වර්ෂය	ගැහැණු	පිරිමි	එකතුව	පසුගිය වසරට සාපේක්ෂ වර්ධනය	වර්ධනය අනුපාතය %
2010	1,830,840	970,693	2,801,533	213,475	8
2011	1,881,808	987,740	2,869,548	68,015	2
2012	2,079,173	1,078,546	3,157,719	288,171	9
2013	2,199,135	1,121,833	3,320,968	163,249	5
2014	2,389,133	1,214,461	3,603,594	282,626	8
2015	2,503,840	1,253,016	3,756,856	153,262	4
2016	2,543,403	1,248,042	3,791,445	34,589	1
2017	2,624,784	1,266,833	3,891,617	100,172	3
2018	2,680,394	1,276,500	3,956,894	65,277	2
2019	2,913,912	1,399,106	4,313,018	356,124	9
2020	2,751,341	1,341,176	4,092,517	-220,501	-5.1
2021	2,791,244	1,300,942	4,092,186	-331	-0.008

2.1.3.4 බැංකු සංගම් තැන්පතු වැඩසටහන.

සංඛ්‍යා සටහන - (VI)

තැන්පතු (සාමාජික, සමාජික නොවන, සමූහ, ළමා සහ දිරිය මාතා) (2010 – 2021)

වර්ෂය	ගිණුම් සංඛ්‍යාව	ගිණුම් සංඛ්‍යාවේ වර්ධනය	මුදල (රු.මි)	මුදලේ වර්ධනය(රු.මි)
2010	5,505,853	337,999	15,906.77	2,370.12
2011	5,524,025	18,172	18,907.33	3,000.56
2012	6,206,484	682,459	20799.06	1,891.73
2013	6,383,307	176,823	23,916.57	3,117.52
2014	6,822,409	439,102	29,436.10	5,519.53
2015	7,096,317	273,908	36,528.03	7,091.93
2016	7,417,540	321,223	43,716.00	7,187.97
2017	7,800,246	382,706	49,320.02	5,604.02
2018	8,177,216	376,970	55,627.64	6,307.62
2019	8,892,916	715700	65,498.00	9871.00
2020	8,715,703	(177,213)	70,338.00	4,840.00
2021	8,538,191	(177,512)	72,835.00	2,497.00




2.1.3.5 ප්‍රජාමූල බැංකු ණය වැඩසටහන.

- සමෘද්ධි සහනාධාරලාභීන් ඇතුළු අඩු ආදායම්ලාභීන්ගේ ව්‍යවසායකත්ව හැකියාවන් හඳුනාගෙන, ස්වශක්තිය මගින් දුගී බවින් මිදීමට අවශ්‍ය පරිසරය ගොඩනැංවීමට අවශ්‍ය සුළු මූල්‍යකරණ පහසුකම් සපයාදීම ප්‍රජාමූල බැංකු ණය ක්‍රමය යටතේ සිදුවේ.
- සාමාජිකයින්ගේ ප්‍රාග්ධන අරමුදල් හා ක්ෂණික මුල්‍ය අවශ්‍යතා පිරිමැසීම සඳහා වූ විශේෂ ණය වැඩසටහන් කිහිපයක් හඳුන්වා දී දියත් කර ඇත.
- ආදායම් උත්පාදන ව්‍යාපෘති සඳහා රු.25,000 සිට රු.1,000,000 දක්වා විවිධ ණය යෝජනා ක්‍රම යටතේ සමෘද්ධි බැංකු මගින් ණය නිකුත් කෙරේ. ඒ අනුව ජීවනෝපාය සංවර්ධන, වගා, වෘත්තිය පුහුණු වැනි ක්ෂේත්‍රයන් සඳහා මෙන්ම ක්ෂණික ණය අවශ්‍යතා වෙනුවෙන් ද ණය නිකුත් කෙරේ.
- නිවාස, පාරිභෝගික, ආපදා වැනි අවශ්‍යතා වෙනුවෙන් බැංකු ණය පහසුකම් ක්‍රියාත්මක වේ. මේ සඳහා රු.25,000 සිට රු. 500,000 දක්වා උපරිම ණය නිකුත් කෙරේ
- සමෘද්ධි බැංකු ණය වැඩසටහන මගින් සාර්ථක වූ ව්‍යවසායකයින්ගේ ප්‍රාග්ධන මූල්‍ය අවශ්‍යතා සපුරාලීමට රු. 500,000 සිට රු.2,000,000 දක්වා ණය සමෘද්ධි ප්‍රජාමූල බැංකු සමිති මගින් ‘‘ඉසුර’’ සහ නව සමෘද්ධි ව්‍යවසායකත්ව ණය යෝජනා ක්‍රමය යටතේ ණය නිකුත් කෙරේ.
- ක්ෂණික මුල්‍ය අවශ්‍යතාවලදී ගිනි පොලීකරුවන්ගේ ග්‍රහනයෙන් මිදී ඉතා පහසුවෙන් මුදල් අවශ්‍යතා සම්පූර්ණ කරගැනීමට පාරිභෝගික, ආපදා, ස්වශක්ති, සමෘද්ධි අරුණළු, සමෘද්ධි මිතුර ණය යෝජනා ක්‍රම තුලින් සමාජිකයින් සඳහා සහනයක් දී ඇත.
- 2021 වසර අවසන් වන විටදී සාමාජිකයින් 11,669,343 ක් සඳහා රු.මි. 394,546.41 ක මුදලක් සමෘද්ධි බැංකු ණය ලෙස ලබා දී ඇත.


සංඛ්‍යා සටහන - (VII)
ණය නිකුත් කිරීම (2010 - 2021)

වර්ෂය	සංඛ්‍යාව (සමුච්චිත)	සමුච්චිත මුදාහල ණය මුදල (රු.මි.)	වසර තුල ණය නිකුත් කිරීම (රු.මි)
2010	4,160,596	58,531.61	10,178.88
2011	4,682,822	71,721.04	13,189.43
2012	5,085,275	87,046.00	15,324.96
2013	5,360,115	98,056.00	11,010.00
2014	6,388,489	127,805.40	29,749.40
2015	6,851,459	153,989.65	26,184.25
2016	7,536,257	180,229.25	26,239.60
2017	8,202,461	220,873.20	40,643.95
2018	8,868,512	264,519.13	43,645.93
2019	9,562,062	317,915.26	53,396.13
2020	11,790,396	357,496.70	39,581.44
2021	11,669,343	394,546.41	37,049.71



සංඛ්‍යා සටහන - (VIII)
ණය වර්ගීකරණය 2021.12.31 දිනට සමුච්චිත මුදාහල

ණය වර්ගීකරණය	මුදල (රු.මි.)
වගා	23,288.30
පාරිභෝගික	15,500.53
ස්වශක්ති	10,227.36
ආපදා	1,855.01
ජීවනෝපාය චක්‍රිය	9,884.03
ජීවනෝපාය සංවර්ධන	123,047.53
නිවාස යටිතල පහසුකම් සංවර්ධනය	52,480.00
හදිසි ව්‍යාපාරික ණය	1,516.45
දිවිනැගුම අරුණළු	2,965.45
රන් ප්‍රදීප	11.68
සේවක පාරිභෝගික ණය	1,144.58
සහන පියවර	5,285.01
සමෘද්ධි අභිමාන	680.15
උත්සව අත්තිකාරම් ණය	632.37
එකතුව	**248,518.45**




2.1.3.6 ප්‍රජාමූල බැංකු අතිරික්ත අරමුදල් ආයෝජනය (ස්ථිර තැන්පතු හා භාණ්ඩාගාර බිල්පත්)

බැංකුවල වත්කම්වලින් උපරිම ප්‍රතිලාභ ලබාගැනීමේ අරමුණින් ණය ඉල්ලුම්කරුවන්ට ණය මුදා හැරීමෙන් අනතුරුව අතිරික්ත අරමුදල් ප්‍රජාමූල බැංකු සමිති හරහා භාණ්ඩාගාර ඵක්‍රලේඛන ප්‍රකාරව රාජ්‍ය බැංකුවල පමණක් ආයෝජන කිරීමට අවසර ලබාදී ඇත. මේ මඟින් ප්‍රජාමූල බැංකු සමිති මූල්‍යමය වශයෙන් ශක්තිමත් කිරීමද අරමුණ වේ.

සංඛ්‍යා සටහන - (IX)

සමෘද්ධි ප්‍රජාමූල බැංකු හී අතිරික්ත මුදල් ආයෝජනය කිරීම. (2010 – 2020)

වර්ෂය	මුදල(රු.මී)	වර්ධනය(රු.මී)	වර්ධන ප්‍රතිශතය (%)
2010	27,248	3,209	13%
2011	39,048	11,800	43%
2012	42,098	3,050	8%
2013	55,690	13,592	32%
2014	48,309	-7,381	(13)%
2015	55,906	7,597	16%
2016	68,692	12,786	23%
2017	77,978	9,286	13%
2018	85,942	7,964	10%
2019	95173	9231	10%
2020	89,314	(5859)	6.2%
2021	108,233	18,919	21.18%



2.1.3.7 ක්ෂුද්‍ර මූල්‍ය අංශය තුළින් ක්‍රියාත්මක ප්‍රවර්ධන වැඩසටහන්

2000 වසරේ සිට ස්වයං මූල්‍ය ඒකකයක් ලෙස අංශයේ උපයාගත් පොලී ආදායම් තුලින් විවිධ සංවර්ධන වැඩසටහන් සමෘද්ධි ප්‍රජාමූල බැංකු පද්ධතිය ඔස්සේ අඩුආදායම්ලාභී ප්‍රජාව ඉලක්ක කර ගනිමින් සිදු කිරීම ක්ෂුද්‍රමූල්‍ය අංශයේ ප්‍රධාන අරමුණ වේ. මේ සඳහා අංශය තුළ ක්‍රියාක්මක කරනු ලැබූ වැඩසටහන් පහත පරිදි වේ.

- **අළුත් අවුරුදු ඉතුරුම් ප්‍රවර්ධන වැඩසටහන.**

බැංකුවලට ගොනු වී ඇති ගිණුම් හිමියන් සහ අනෙකුත් ජනතාව සඳහා සෑම වසරකම සිංහල/ හින්දු අළුත් අවුරුදු උත්සවයට සමගාමීව සමෘද්ධි බැංකු මඟින් ඉතුරුම් ප්‍රවර්ධන වැඩසටහන් හා අළුත් අවුරුදු උත්සවයක් ජන ක්‍රීඩාවලට මුල් තැන දෙමින් සමෘද්ධි බැංකු 1074 පුරා එකම දිනයක් තුල සාර්ථකව ක්‍රියාත්මක කර, සමෘද්ධි බැංකු නාමය හා සේවාවන් පිළිබඳ ජනතාව වෙත පණිවුඩයක් ගෙනයාමට කටයුතු කරන ලදී. එම කාලය තුල තැන්පත් කරන මුදල් සඳහා ගණුදෙනුකරුවන්ට ප්‍රයෝජනවත් හා වටිනාකමක් ඉහල තිලිණ ලබාදීම සිදු කරන ලදී. මේ තුලින් අදාල කලාප තුල ජනතාව ඒකරාශී වීමත් ප්‍රජාවගේ සංස්කෘතික හැඟීම් ඔප්නැංවීමටත් මෙය අවස්ථාවක් කර ගැනීමට හැකි විය. තවද, සමෘද්ධි බැංකු කටයුතු හා විශ්වාසය තහවුරු කර, අඩු ආදායම්ලාභීන් ඇතුළු ප්‍රජාව තුල සමෘද්ධි බැංකුවෙහි නාමය ප්‍රචලිත කර, ඔවුන් ආර්ථික/ සමාජීය සවිබලගැන්වීමක් අපේක්ෂා කෙරේ.

- **“රන් ප්‍රදීප” රන් උකස් ණය සේවාව**

සමෘද්ධි බැංකු සාමාජිකයින් විසින් හදිසි මුදල් අවශ්‍යතාවය වෙනුවෙන් තමා සන්තයේ පවතින රන් භාණ්ඩ උකස් කර මුදල් ලබාගැනීමේදී ඇති වන දුෂ්කරතා මඟ හරවා සහන පොලි මත කඩිනමින් මුදල් අවශ්‍යතා සම්පූර්ණ කර ගැනීමට පහසුකම් සැලසීම. මේ වන විට රත්නපුර දිස්ත්‍රික්කයේ උඩවලව සමෘද්ධි බැංකුව තුල වැඩසටහන ක්‍රියාත්මක වන අතර බැංකු සාමාජිකයින් 176 දෙනෙකුට රු. මිලියන 4.0 ආසන්න උකස් අත්තිකාරම් ලබාදී දැනට බැංකු සාමාජිකයින් 82 ක් උකස් බේරාගෙන ඇත.

- **සමෘද්ධි ප්‍රජාමූල බැංකු ආශ්‍රිතව "අරුණළු ක්ෂණික ණය" වැඩ සටහන**

සමෘද්ධි ප්‍රජාමූල සංවිධානය මඟින් අරුණළු ක්ෂණික ණය වැඩ සටහන හඳුන්වා දීම. දිවයිනපුරා සියළුම ප්‍රජාමූල සංවිධාන හරහා සාමාජිකයින් වෙනුවෙන් ක්‍රියාත්මක වේ. ප්‍රජා මූල සංවිධාන සාමාජිකයන් විසින් ඔවුන්ගේ හදිසි මුදල් අවශ්‍යතා වෙනුවෙන් අවිධිමත් ක්ෂුද්‍ර මූල්‍ය ආයතන/ පුද්ගල මඟින් ඉහල පොලි අනුපාතයක් හා විවිධ බැඳීම් මත ලබාගන්නා ණය සඳහා විකල්පයක් ලෙස, සහනදායී හා කෙටිකාලීන ණය මුදල් ලබා ගැනීමට පහසුකම් සැලසීම මෙමඟින් සිදුවේ.

- **පුහුණු කටයුතු**

ප්‍රජාමූල බැංකු ජාලයේ 1074 ක හා ප්‍රජාමූල බැංකු 331 හි සමිතිවල සේවය කරන කාර්ය මණ්ඩල බැංකු කටයුතු හා අනෙකුත් විෂයන්ට අදාලව පුහුණු කිරීම් ප්‍රජාමූල බැංකු අරමුදල් මගින් දෙපාර්තමේන්තුවේ පුහුණු අංශය සම්බන්ධීකරණය සිදුකරයි.

ගණුදෙනුකාර ප්‍රජාව වෙත වඩාත් කාර්යක්ෂම ඵලදායී සේවාවක් සැපයීම උදෙසා බැංකු කාර්ය මණ්ඩලය සඳහා දැනුම කුසලතාවය හා යහපත් ආකල්පයන් ප්‍රගුණ කිරීම මෙම ඒකකයේ කාර්ය භාරයයි.

ඒ අනුව බැංකුවේ කටයුතු පිළිබඳ අවබෝධය ලබාදෙන බැංකු කටයුතු හා ගිණුම් ක්‍රියාවලිය පිළිබඳ මූලික පුහුණු පාඨමාලාව සෑම බැංකු නිලධාරියකුටම ලබා දීමට කටයුතු කරයි. මෙයට අමතරව ප්‍රජාමූල බැංකු කටයුතු හා ප්‍රජාමූල බැංකු සමිතියේ ගිණුම් කටයුතු පිළිබඳ නුපුහුණු ප්‍රජාමූල බැංකු/ බැංකු සමිතියේ කාර්ය මණ්ඩලය පුහුණු කිරීමට කටයුතු කර ඇත. 2019 වර්ෂයේ නිලධාරීන් 426 ක් සඳහා බැංකු ගිණුම් පුහුණුව ලබාදී ඇත. මේ වනවිට වසරේ ක්ෂුද්‍ර මූල්‍ය සහතික පත්‍ර පාඨමාලාව අවසන් කළ නිලධාරීන් සංඛ්‍යාව 489 කි.

2020/2021 වර්ෂයේ Covid - 19 වසංගතය හේතුවෙන් පුහුණු ලබාදීමේ බාධාවක් පැවතුන අතර Online තාක්ෂණය ඔස්සේ කෙටිකාලීන දැනුවත් කිරීම් පමණක් සිදු කරන ලදි.

- **කළමනාකරණ තොරතුරු ඒකකය**

1074 ක් වූ සමෘද්ධි ප්‍රජාමූල බැංකුවල තොරතුරු කළමනාකරණය සිදු කෙරෙන්නේ ක්ෂුද්‍ර මූල්‍ය අංශයේ කළමනාකරණ තොරුතුරු ඒකකය මඟිනි. ඒ අනුව සෑම සමෘද්ධි ප්‍රජාමූල බැංකු හා සමෘද්ධි ප්‍රජාමූල බැංකු සමිතියක්ම මාසිකව තම බැංකු ප්‍රගතිය, ලබා දී ඇති ආකෘති මගින් තොරතුරු කළමනාකරණ ඒකකය වෙත වාර්තා කළ යුතු අතර, එම දත්ත සකස් කර සමෘද්ධි ප්‍රජාමූල බැංකුවල පවතින තත්වය විශ්ලේෂණය කර තොරතුරු ඉදිරිපත් කිරීමත්, සමෘද්ධි ප්‍රජාමූල බැංකු ප්‍රගතිය ඇගයීම සඳහා අවශ්‍ය අනුපාත විශ්ලේෂණයන් ගොඩ නැගීම හා ඒ අනුව සමෘද්ධි ප්‍රජාමූල බැංකු ඇගයීම් සිදු කිරීමට සැලසුම් කර ඇත. තවද පරිගණක තාක්ෂණය උපයෝගි කරගෙන සමෘද්ධි ප්‍රජාමූල බැංකු හා බැංකු සමිතියෙහි තොරතුරු ක්ෂුද්‍ර මූල්‍ය අංශය වෙත සම්ප්‍රේෂණය කිරීමට කටයුතු කර ඇත.

සමෘද්ධි ප්‍රජාමූල බැංකු පරිගණකගත කිරීමේ කටයුතු සාර්ථක වීමත් සමග මෙම ඒකකය මගින් තවත් ඵලදායීව හා කාර්යක්ෂම අන්දමින් ප්‍රජාමූල බැංකු පවත්නා තත්ත්වය විශ්ලේෂණය කිරීම හා ඇගයීම් කාර්ය සිදු කිරීමට කටයුතු කරනු ලැබේ. 2019 වසරේ ජාතික මට්ටමින් සමෘද්ධි ප්‍රජාමූල බැංකු ප්‍රගති සමාලෝචන වැඩසටහන් 21 ක් දිස්ත්‍රික්ක මට්ටමින් ක්‍රියාත්මක කරන ලදි. 2020/2021 වසර තුළ දිස්ත්‍රික් මට්ටමින් ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම Covid - 19 වසංගතය හේතුවෙන් අපේක්ෂිත පමණින් සිදුකර ගත නොහැකි විය.

සමස්ථ බැංකු පද්ධතිය තිරසාර මූල්‍ය ඒකක බවට පත්කිරීමේ අරමුණ ඇතිව මෙන්ම සේවක අභිප්‍රේරණය අපේක්ෂාවෙන් බැංකු ශ්‍රේණිගත කිරීම හා ඇගයීම වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට කටයුතු කර ඇත. එම වැඩසටහන සෑම වර්ෂයක් පාසාම වැඩිදියුණු කරමින් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත.

2.1.3.8 2021 වර්ෂයේ ලභාකරගත් ප්‍රධාන ප්‍රතිඵලයන්

1. කොටස් මුදල් ප්‍රමාණය රු.ද.ල.2466.27 කින් වර්ධනය කර ගැනීම.
2. සමෘද්ධි බැංකුවල සාමාජික සංඛ්‍යාව 203.808 කින් වර්ධනය කර ගැනීම.
3. සියළුම තැන්පත් ප්‍රමාණය රු.ද.ල.9871 කින් වර්ධනය කර ගැනීම.
4. 2020 වර්ෂය තුල පමණක් රු.ද.ල.53,396 ක ණය මුදල් ලබාදීමට හැකියාව ලැබීම.
5. ක්ෂුද්‍ර මුල්ය අංශයේ රු.ද.ල. 2087 ක ලාභයක් ලබාගත හැකිවීම.
6. සමෘද්ධි බැංකුවල ලාභදායී බැංකු ප්‍රමාණය පෙර වසරට සාපේක්ෂව බැංකු 520 සිට 1037දක්වා වැඩිකර ගත හැකි වීම.
7. සමෘද්ධි බැංකුවල ලාභදායිත්වය රු.බිලියන 6.6 ක් දක්වා වර්ධනය කර ගත හැකි වීම. (විගණනයට යටත්ව)
8. සමෘද්ධි බැංකු ක්‍රියාකාරිත්වය ඇගයීම සඳහා ‘‘බැංකු හරසර’’ වැඩසටහන ක්‍රියාත්මක කල හැකිවීම.
9. ප්‍රජාමූල සංවිධාන හරහා ප්‍රජාමූල සංවිධාන සාමාජිකයින්ට ‘‘අරුනළු’’ ක්ෂණික ණය ක්‍රමයක් හදුන්වා දෙන ලදි.
10. අනිවාර්ය ඉතිරි කිරීම් සඳහා 6% ක් පොලි ප්‍රතිශතයක් ලබාදිය හැකිවීම.
11. ප්‍රතිමූල්‍ය ණය වැඩසටහන නැවත හදුන්වාදිය හැකිවීම
12. බැංකු අධික්ෂණ ඒකකය නැවත ස්ථාපිත කල හැකිවීම.
13. සමෘද්ධි ප්‍රජාමූල බැංකු හා බැංකු සමිති ලියාපදිංචිය අවසන් කිරීම.
14. සමෘද්ධි ප්‍රජාමූල බැංකු මහා සංගමය පිහිටුවීම.

2021 වසරේ පැවති කොවිඩ් - 19 ව්‍යසනය හමුවේ විශේෂිත ප්‍රවර්ධන වැඩසටහනක් බැංකු මට්ටමින් සිදු නොවූ නමුත් පැවති වැඩසටහන් ඒ ආකාරයෙන්ම අඛණ්ඩව පවත්වාගෙන යාම පමණක් සිදුවුණි.

2.1.4 ජීවනෝපාය සංවර්ධන වැඩසටහන

2.1.4.1 හැඳින්වීම

සමෘද්ධිලාභී පවුල් තම මාසික ආදායම උපයා ගැනීම සඳහා යෙදී සිටින්නාවූ ජීවනෝපායන් වඩාත් වර්ධනය කරමින් ආදායම ඉහළ නංවා ගැනීම සඳහා අවශ්‍ය මූල්‍ය දායකත්වය හෝ දැණුවත් කිරීම් හෝ තාක්ෂණික සේවාවන් ළඟා කර ගැනීම සඳහා අවශ්‍ය සහාය ලබා දීම සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ ජීවනෝපාය සංවර්ධන අංශයේ ප්‍රධානම අරමුණ වනු ඇත.

මෙහිදී සමෘද්ධිලාභියාගේ මූල්‍යමය හෝ ශ්‍රමදායකත්වය සහිතව සමෘද්ධිලාභී පවුල්වල ඔවුන් යෙදී සිටින ආදායම් උත්පාදන කාර්යයන් වඩාත් වර්ධනය කරමින් එම පවුල් ස්ව උත්සහායෙන් වැඩි ආදායම්ලාභීන් බවට පත්කර සවිබලගැන්වීමට කටයුතු කිරීම මෙම අංශයේ කාර්යය භාරය වී ඇත.

ඒ අනුව කොවිඩ් 19 වසංගත තත්ත්වය හමුවේ මහා භාණ්ඩාගාරය මඟින් 2021 වර්ෂයේ දී මෙම දෙපාර්තමේන්තුවට වෙන් කරන ලද සීමිත ප්‍රතිපාදන ප්‍රමාණය හේතු කොට ගෙන ජීවනෝපාය සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා රු.මි. 174 ක් ප්‍රතිපාදන ප්‍රමාණයක් වෙන් කරන ලදි.

එසේ වුවද 2021 වර්ෂයේ අයවැය යෝජනාවන්ට අනුව සමෘද්ධී / අඩුආදායම්ලාභී පවුල් 200,000 ක් කේන්ද්‍ර කරගත් අංග සම්පූර්ණ ගෘහ නේවාසික ආර්ථිකයක් සංවර්ධනය කිරීමේ වැඩසටහන සඳහා රු.මි. 10,000 ක ප්‍රතිපාදන ප්‍රමාණයක් අප අමාත්‍යාංශය වෙත වෙන් කර තිබූ බැවින් එම වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ භාග්‍ය ද අප දෙපාර්තමේන්තුවේ ජීවනෝපාය සංවර්ධන අංශය වෙත පැවරීම තුලින් විශාල වූ කාර්ය භාරයක් ඉටු කිරීමට අපට හැකියාව ලැබිණි.

2.1.4.2 දෙපාර්තමේන්තු ප්‍රතිපාදන හරහා ක්‍රියාත්මක කරන ලද වැඩසටහන්

(අ) සමෘද්ධිලාභීන් සවිබලගැන්වීමේ සැලැස්ම සකස් කිරීම යටතේ සමෘද්ධි ප්‍රතිලාභීන් කාණ්ඩ ගත කිරීමේ සමීක්ෂණය

සෞභාගයේ දැක්මට අනුව දිවයින පුරා සිටින සමෘද්ධිලාභී ප්‍රජාව, ස්වශක්තියෙන් වැඩි ආදායම්ලාභීන් බවට පත් කිරීම උදෙසා සමෘද්ධි සහනාධාරලාභීන්ගේ වත්මන් තත්ත්වය හඳුනා ගැනීම අරමුණ කර ගනිමින් මෙම වැඩසටහන ක්‍රියාත්මක කරන ලදි. මෙහිදී ස්වේච්ඡාවෙන් සවිබලගැන්විය හැකි ප්‍රතිලාභීන්, සවිබලගැන්විය නොහැකි ප්‍රතිලාභීන් හා සවිබලගැන්වීය හැකි ප්‍රතිලාභීන් ලෙස වර්ග කර හඳුනා ගැනීම මේ යටතේ සිදුවිය.

සංඛ්‍යා සටහන - (X)

වෙන් කල මුදල (රු.මි.)	වියදම (රු.මි.)	ස්වේච්ඡාවෙන් සවිබල ගැන්විය හැකි ප්‍රතිලාභීන් සංඛ්‍යාව	සවිබලගැන්විය නොහැකි සංඛ්‍යාව	සවිබලගැන්විය හැකි සංඛ්‍යාව
10.83	10.03	33,989	368,460	335,451

රටේ පැවති කොවිඩ් 19 වසංගත තත්ත්වය හමුවේ මෙලෙස සමෘද්ධි ප්‍රතිලාභීන් වර්ග කර හඳුනා ගැනීම තව දුරටත් සිදු වෙමින් පවති.

(ආ) සමෘද්ධි ප්‍රතිලාභීන් 200,000 ක් සවිබලගැන්වීමේ වැඩසටහන යටතේ තාක්ෂණික පුහුණු හා දැණුවත් කිරීමේ වැඩසටහන

ඉහත පරිදි අමාත්‍යාංශ ප්‍රතිපාදන යටතේ අප දෙපාර්තමේන්තුව ක්‍රියාත්මක කරන ලද සමෘදි / අඩු ආදායම්ලාභී පවුල් 200,000 ක් ඉලක්ක කර ගනිමින් ක්‍රියාත්මක වූ ජීවනෝපාය වැඩසටහනට අදාලව ව්‍යාපෘති ගන්වන ලද ප්‍රතිලාභීන් සඳහා අවශ්‍ය තාක්ෂණික පුහුණුවීම් හා දැණුවත් කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන මෙම වැඩසටහන මඟින් ලබා දෙන ලදි.

මෙහිදි මෙම වැඩසටහන සහාය සේවා ආයතන හා ඒකාබද්ධව ක්‍රියාත්මක කරන ලද ජාතික වැඩසටහනක් වූ නිසා කාබනිත පොහොර නිෂ්පාදන, සත්ත්ව පාලනය, මල් වගාව , මීමැසි පාලනය, හා කුඩා ව්‍යාපාර ආදි ජීවනෝපායන්ට අදාලව තාක්ෂණික පුහුණුව හෝ දැණුවත් කිරීම් අදාල ආයතනය හරහා ලබා දීමට කටයුතු කරන ලදි. එහි ප්‍රගතිය පහත පරිදි වේ.

සංඛ්‍යා සටහන - (XI)

අයිතමය	අනුමත ප්‍රතිපාදන ප්‍රමාණය (රු.මි.)	වියදම (රු.මි.)	ප්‍රතිලාභීන් සංඛ්‍යාව	වැඩසටහන් සංඛ්‍යාව
පවුල් 200,000 ක් කේන්ද්‍ර කර ගත් ජීවනෝපාය සංවර්ධන වැඩසටහන යටතේ තාක්ෂණික සහාය හා දැණුවත් කිරීම් ලබා දීම	6.23	4.81	45,913	389

(ඇ).සෞභාග්‍යා ජාතික ගෙවතු වගා සංවර්ධන වැඩසටහන

ගෝලීය කොවිඩ් වසංගතය මත සංචරණ සීමා පැනවීම හේතුවෙන් ජනතාව නිවෙස් තුලම ගත කිරීමත්, එම කාල සීමාව තුල ගෙවතු වගාවට යොමු කරවමින් එළවළු හා පලතුරු සඳහා යන වියදම් අවම කරවීමත් අරමුණු කර ගනිමින් 2021/2022 මහා කන්නයේදි සමෘද්ධිලාභී ගෙවතු ලක්ෂ 10 ක් සංවර්ධනය කිරීම මෙම වැඩසටහනේදි අපේක්ෂා කරන ලදි.

ඒ අනුව ජීවනෝපාය සංවර්ධන වැඩසටහනට වෙන් කරන ලද සීමා සහිත ප්‍රතිපාදන ප්‍රමාණයෙන් රු.මි. 52.01 ක් මේ වැඩසටහනට වෙන් කරන ලද අතර කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ බීජ සැකසුම් මධ්‍යස්ථානය වෙතින් ඒ ඒ ප්‍රාදේශිය දේශගුණික කලාපයන්ට උචිත එළවළු බීජ වර්ග, දිස්ත්‍රික් සමෘද්ධි කාර්යාල හරහා ලබා දෙමින් සමෘද්ධිලාභී ගෙවතු වගා සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කරන ලදි.

මෙලෙස ප්‍රාදේශිය දේශගුණයට උචිත වර්ග 6 කින් යුතු එළවළු බීජ වර්ග සමෘද්ධි ගෙවතු ලාභියෙකුට ලබා දුන් අතර දඹල, තම්පලා, මෑ, බණ්ඩක්කා, තක්කාලි, මිරිස්, බෝංචි, රාබු හා වම්බටු බීජ මේ යටතේ වගා කරන ලදි. එහි ප්‍රගතිය පහත පරිදි වේ.

සංඛ්‍යා සටහන - (XII)

අයිතමය	**අනුමත ප්‍රතිපාදන ප්‍රමාණය (රු.මි.)**	**වියදම (රු.මි.)**	**බෙදා දෙන ලද බීජ පැකට් සංඛ්‍යාව / ප්‍රතිලාභීන් සංඛ්‍යාව**
සෞභාග්‍යා ජාතික ගෙවතු වගා වැඩසටහන	52.01	51.43	757,407

(ඇ). දිවිනැගුම විශේෂ ජීවනෝපාය සංවර්ධන වැඩසටහන

සමෘද්ධිලාභීන්ගේ ජීවනෝපාය සංවර්ධනයන් වඩාත් වර්ධනය කර ඔවුන් ආර්ථිකව සවිබලගැන්වීම උදෙසා, වෙන් වී ඇති සීමිත ප්‍රතිපාදන යටතේ ජීවනෝපාය විශේෂ ව්‍යාපෘති සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කරන ලදි. මේ යටතේ කෘෂිකර්ම, සත්ත්ව පාලන, ධීවර, කර්මාන්ත හා අලෙවි යන අංශයන් යටතේ තෝරා ගනු ලැබූ එක් ව්‍යාපෘතිලාභීයෙක් වෙනුවෙන් රු. 50,000 ක උපරිමයකට යටත්ව ව්‍යාපෘති ආධාර ලබා දුන් අතර 40% ක ප්‍රජා දායකත්වයක් සහිතව ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන ලදි.

සංඛ්‍යා සටහන - (XIII)

ව්‍යාපෘති / **අයිතමය**	**අනුමත ප්‍රතිපාදන ප්‍රමාණය (රු.මි.)**	**වියදම (රු.මි.)**	**ප්‍රතිලාභීන් සංඛ්‍යාව**
1. කෘෂිකර්ම ව්‍යාපෘති	28.72	25.52	737
2. සත්ත්ව පාලන ව්‍යාපෘති	10.80	15.64	320
3. ධීවර ව්‍යාපෘති	0.70	1.34	30
4. කර්මාන්ත ව්‍යාපෘති	39.80	37.22	817
5. අලෙවි හා සේවා ව්‍යාපෘති	16.60	10.32	310
6. විශේෂ දැණුවත් කිරීම් හා පුහුණු වැඩසටහන්	7.06	3.90	2,496
එකතුව	**103.68**	**93.94**	**4,710**

(ඉ). දෙපාර්තමේන්තු ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක වැඩසටහන් හි සමස්ත ප්‍රගතිය

සංඛ්‍යා සටහන - (XIV)

ව්‍යාපෘතිය / වැඩසටහන	වෙන් කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණය (රු.මි.)	වියදම (රු.මි.)	භෞතික ප්‍රගතිය	ප්‍රතිලාභීන් සංඛ්‍යාව
1.සමෘද්ධිලාභීන් සවිබලගැන්වීම යටතේ සමෘද්ධි ප්‍රතිලාභීන් කාණ්ඩගත කිරීම	10.83	10.03	වැඩසටහන් 01	714,900
2.සමෘද්ධිලාභීන් 200,000 සවිබලගැන්වීම යටතේ දැණුවත් කිරීම් හා කාත්ෂණික පුහුණුව ලබා දීම	6.23	4.81	වැඩසටහන් 1,017	45,913
3.සෞභාග්‍යා ජාතික ගෙවතු වගා සංවර්ධන වැඩසටහන	52.01	51.43	ගෙවතු 757,407	757,405
4.දිවිනැගුම විශේෂ ජීවනෝපාය සංවර්ධන වැඩසටහන	103.68	93.94	2,219	4,710
පරිපාලන වියදම	1.25	0.64	0	0
එකතුව	**174.00**	**160.85**	**2,222**	**1,522,928**

2.1.4.3 අමාත්‍යාංශ ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක වැඩසටහන්

(අ). සමෘද්ධිලාභි / අඩු ආදායම්ලාභී පවුල් 200,000 ක් කේන්ද්‍ර කරගත් අංග සම්පූර්ණ ගෘහ නේවාසික ආර්ථිකයක් සංවර්ධනය කිරීමේ වැඩසටහන

රට හදන සෞභාග්‍යයේ දැක්මේ "එලදායි පුරවැසියෙක් සතුටින් ජීවත්වන පවුලක් " යන ප්‍රමුඛ සංකල්පය යථාර්ථයක් බවට පත් කරමින් ග්‍රාමීය ආර්ථිකය නඟා සිටුවීමට, ග්‍රාමීය සංවර්ධනය හා ජීවනෝපාය වැඩිදියුණු කිරීම ඉලක්ක කර ගනිමින් මෙම වැඩසටහන ක්‍රියාත්මක කරන ලදි.

ඒ අනුව මෙම වැඩසටහන 2021 වර්ෂයේ අයවැය යෝජනාවකට අනුව සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය වෙත වෙන් කරන ලද භාණ්ඩාගාර ප්‍රතිපාදන හරහා මෙම දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරන ලද අතර සමෘද්ධි / අඩු ආදායම්ලාභී පවුල් ලක්ෂ 200,000 ක් සවිබලගැන්වීම තුලින් ග්‍රාමීය සංවර්ධනය වැඩිදියුණු කිරීම මෙහිදී අපේක්ෂා කරන ලදි.

එමෙන්ම මෙම වැඩසටහනේ විශේෂත්වය වුයේ ජීවනෝපාය ක්ෂේත්‍රයන්ට අදාල අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, රාජ්‍ය ආයතන, මෙන්ම දිස්ත්‍රික් හා ග්‍රාමීය මට්ටමේ සියළු ක්ෂේත්‍ර නිලධාරීන් හා ඒකාබද්ධව මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමට කටයුතු කිරීමයි.

මෙහිදී ව්‍යාපෘතිලාභීන් තෝරා ගැනීමේදී ග්‍රාමීය කමිටුව විසින් සුදුසු ප්‍රතිලාභී පවුල් තෝරා ප්‍රාදේශීය හා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවට ඉදිරිපත් කර එකඟතාවය ලබා ගැනීමට කටයුතු කරන ලදි.

එමෙන්ම **CRM** පරිඝණක මෘදුකාංගය හරහා වසම් මට්ටමින් හඳුනා ගනු ලබන ව්‍යාපෘතිලාභීන්ගේ තොරතුරු සමෘද්ධි නිලධාරීන් විසින් ඇතුළත් කරන ලදි. අප දෙපාර්තමේන්තුව විසින් එම තොරතුරු වලට අදාලව අවශ්‍ය ප්‍රතිපාදන අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරන ලද අතර අනතුරුව අමාත්‍යාංශය විසින් එම ප්‍රතිපාදන දිස්ත්‍රික් ලේකම් වෙත නිදහස් කරන ලදි.

ඒ අනුව මෙම වැඩසටහන සඳහා භාණ්ඩාගාරය විසින් අමාත්‍යාංශය වෙත රු.මි. 10,000 ක ප්‍රතිපාදන ලබා දීමට නියමිතව තිබුණි. මෙම වැඩසටහනේ ප්‍රගතිය පහත පරිදි වේ.

සංඛ්‍යා සටහන - (XV)

ව්‍යාපෘති / අයිතමය	**ව්‍යාපෘති සංඛ්‍යාව**	**වියදම (රු.)**	**ප්‍රජා දායකත්වය (රු.මි.)**	**ප්‍රතිලාභීන් සංඛ්‍යාව**
1. කෘෂිකර්ම ව්‍යාපෘති	21,693	486.30	294.52	21,693
2. සත්ත්ව පාලන ව්‍යාපෘති	9,714	314.60	125.60	9,714
3. ධීවර ව්‍යාපෘති	1,688	54.00	21.60	1,688
4. කර්මාන්ත ව්‍යාපෘති	30,099	1,209.50	683.60	30,099
5. අලෙවි හා සේවා ව්‍යාපෘති	11,641	581.10	332.40	11,641
6. වෘත්තීය පුහුණු ව්‍යාපෘති	933	3.90	1.56	933
එකතුව	**75,768**	**2,649.4**	**1,607.74**	**75,768**

(ආ). සෞභාග්‍යා ජාතික ගෙවතු වගා සංවර්ධන වැඩසටහන

ආර්ථික පුනර්ජීවනය හා දරිද්‍රතාවය තුරන් කිරීම සඳහා වන ජනාධිපති කාර්ය සාධන බලකාය විසින් 2021 / 2022 මහකන්නය තුලදි මුළු දිවයිනම ආවරණය වන ලෙස ගෙවතු දශ ලක්ෂයක් සංවර්ධනය කිරීමේ කටයුත්ත සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත පවරන ලදි.

ඒ අනුව දෙපාර්තමේන්තුවේ වාර්ෂික ක්‍රියාත්මක සැලැස්ම තුල සෞභාග්‍යා ගෙවතු වගා සංවර්ධන වැඩසටහන යටතේ එළවළු බීජ ලබා දීමට කටයුතු කළ බැවින් සෞභාග්‍යා ගෙවත්ත තවදුරටත් සංවර්ධනය කිරීම සඳහා පලතුරු පැල, සුළු අපනයන භෝග පැල, පොල් පැල හා කුකුළු පැටවුන් සමෘද්ධි ප්‍රතිලාභීන් වෙත ලබා දීමට අමාත්‍යාංශ ප්‍රතිපාදන යටතේ අප විසින් කටයුතු කරන ලදි.

මෙහිදී වසමකින් ඉඩකඩ පහසුකම් සහිත සමෘද්ධිලාභී පවුල් 3 කට කුකුළු පැටවුන් 10 දෙනෙකු බැගින් ලබා දීමටත් තෝරා ගත් සෑම ප්‍රතිලාභියෙක් වෙනුවෙන්ම පොල් පැලයක් බැගින් ද පලතුරු පැල 1 හෝ 2 ක් ද ලබා දීමට ඒ අනුව කටයුතු කරන ලදි.

ලබා දුන් පලතුරු පැල අතර අනෝදා, බද්ද දෙහි, අලිගැට පේර, අඹ, පැණි දොඩම්, නාරං, රඹුටං, දෙළුම්, උගුරැස්ස, ගස්ලබු, ලෙමන්, ජඹනාරං, අඹරැල්ලා, දූරියන්, සැපතිල්ල, දිවුල් ආදී වේ.

සංඛ්‍යා සටහන - (XVI)

ව්‍යාපෘති / අයිතමය	ප්‍රතිපාදන ප්‍රමාණය (රු.මි.)	මිලදී ගත් පැල / පැටවුන් ප්‍රමාණය	වියදම (රු.මි.)	ප්‍රතිලාභීන් සංඛ්‍යාව
1. පලතුරු පැල	204.71	1,150,488	167.94	712,142
2. කුකුළු පැටවුන්	195.53	287,156	123.39	32,414
3. පොල් පැල	285.00	253,964		• (253,964)
එකතුව	**685.24**	**1,691,608**	**291.33**	**744,556**

- පළතුරු පැළ හා කුකුළු පැටවුන් ලබා දුන් ප්‍රතිලාභීන්ගෙන් 253,964 කට පොල් පැල ද ලබා දී ඇත.

(ඇ). අමාත්‍යාංශ ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක වැඩසටහන් හි සමස්ත ප්‍රගතිය

සංඛ්‍යා සටහන - (XVII)

ව්‍යාපෘතිය / වැඩසටහන	වෙන් කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණය (රු.මි.)	වියදම (රු.මි.)	භෞතික ප්‍රගතිය	ප්‍රතිලාභී දායකත්වය (රු.මි.)	ප්‍රතිලාභීන් සංඛ්‍යාව
1. **සමෘද්ධි / අඩු ආදායම්ලාභී පවුල් 200,000 ක් සවිබලගැන්වීමේ වැඩසටහන**					
➢ කෘෂිකර්ම ව්‍යාපෘති	1,084.65	486.30	21,693	294.52	21,693
➢ සත්තව පාලන ව්‍යාපෘති	685.70	314.6	9,714	125.60	9,714
➢ ධීවර ව්‍යාපෘති	96.40	54.0	1,688	21.60	1,688
➢ කර්මාන්ත ව්‍යාපෘති	1,904.95	1,209.5	30,099	683.60	30,099
➢ අලෙවි හා සේවා ව්‍යාපෘති	782.05	581.1	11,641	332.40	11,641
➢ වෘත්තීය පුහුණු ව්‍යාපෘති	46.65	3.9	933	1.56	933
උප එකතුව	***4,600.91***	***2,649.4***	***75,768***	***1,607.74***	***75,768***
2. **සෞභාග්‍ය ජාතික ගෙවතු වගා සංවර්ධන වැඩසටහන**					
➢ පලතුරු පැල හා අපනයන කෘෂි බෝග පැල	204.71	167.94	712,142	100.76	712,142
➢ කුකුළු පැටවුන්	195.53	123.39	32,414	74.04	32,414
➢ පොල් පැල	285.00	0	253,964	0	253,964
උප එකතුව	***685.24***	***291.33***	***998,520***	***174.8***	***998,520***
මුළු එකතුව	**5,286.15**	**2,940.73**	**4600.91**	**1,782.54**	**1,074,288**

(ඇ). ඉහත කාර්යයන් ඉටු කිරීමේදී මුහුණ දුන් ගැටළු හා අභියෝග

1. කොවිඩ් - 19 වසංගත තත්ත්වය හමුවේ නිලධාරින්ට රාජකාරියට පැමිණීමට පවා නොහැකි කාලවකවානුවක වසර ආරම්භයේදී මහත් උත්සහයෙන් ඉහත වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට සිදුවිම.
2. මෙම කාලවකවානුව තුල ප්‍රතිලාභීන් හමුවීමත් ඔවුනට අවශ්‍ය දැණුවත් කිරීම් හා පුහුණුවීම් ලබා දීමට කටයුතු කල හැකි වුයේද ඉතාමත් අපහසුවෙනි.
3. එමෙන්ම ලක්ෂ 2 ක් සවිබලගැන්වීමේ වැඩසටහනේදී රු.මි. 10,000 ක ප්‍රතිපාදන ලබා දීමට යෝජිත වුවද නියමිත පරිදි ව්‍යාපෘති අවශ්‍යතාවන්ට අනුව ප්‍රතිපාදන ලබා නොදීම නිසා අප නිලධාරින් දැඩි අපහසුතාවයන්ට ලක්විය.
4. එසේම නියමිත පරිදි අදාල කාලවකවානුවේදී භාණ්ඩාගාරයෙන් මුදල් නිදහස් නොකිරීම නිසා ඉහත සංවර්ධන වැඩසටහන් එම මුදල් වර්ෂය තුල වඩාත් ඵලදායි ආකාරයෙන් ක්‍රියාත්මක කිරීමට බාධාවන් ඇතිවිය.
5. ප්‍රතිලාභී මූල්‍ය දායකත්වය ලබා දී තිබුන ද භාණ්ඩාගාර මුදල් නියමිත පරිදි නොලැබීම ඉහත තත්ත්වය වඩාත් තීව්‍ර කිරීමට හේතුවිය.
6. ප්‍රතිලාභීන් 200,000 ක් සවිබලගැන්වීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීමේදී දිස්ත්‍රික්, ප්‍රාදේශීය හා ග්‍රාමීයව සියළු රාජ්‍ය නිලධාරින් ඒකාබද්ධව මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමට සිදුවීම වඩාත් අභියෝගාත්මක විය.
7. සංවර්ධන කළ යුතු වැඩසටහන් හා සහාය ලබා දිය යුතු ප්‍රතිලාභීන් හඳුනා ගැනීමේ සිට වැඩසටහන අවසන් වන තුරු අදාල රාජ්‍ය ආයතනයන් අතර සම්බන්ධතාවයක් හෝ අදාල කාර්යයන් ඉටු කිරීමට වගවීමක් නොමැතිකම අභියෝගයක් විය.
8. එමෙන්ම රටේ පවතින ආර්ථික අර්බුදය හමුවේ ජීවනෝපාය සංවර්ධනය කිරීමට ප්‍රතිලාභී අවශ්‍යතාවය පරිදි ලබාදුන් භාණ්ඩ හෝ උපකරණවල මිල ගණන් දවසින් දවස ඉහළ යෑම හේතුවෙන් නිලධාරින් හා ප්‍රතිලාභීන් දැඩි අපහසුතාවයන්ට ලක්වීම එම වසර පුරා දැකිය හැකි විය.

2.1.5 ව්‍යවසාය සංවර්ධන වැඩසටහන

ව්‍යවසාය සංවර්ධන අංශය මඟින් 2021 වසරේදී ප්‍රධාන වැඩසටහන් 02 ක්‍රියාත්මක කරන ලදි.

1. අලෙවි සංවර්ධන වැඩසටහන
2. සමෘද්ධි නිවාස ලොතරැයි වැඩසටහන

2.1.5.1 අලෙවි සංවර්ධන වැඩසටහන

අඩු ආදායම්ලාභීන්ගේ ජීවන තත්ත්වය උසස් මට්ටමින් පවත්වා ගනිමින් ආර්ථික සංවර්ධන ක්‍රියාවලිය වැඩිදියුණු කිරීම උදෙසා "සෞභාග්‍යයේ දැක්ම" වැඩසටහනට සමගාමීව සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ ව්‍යවසාය සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කර ඇත.

2.1.5.1 (අ). අරමුණ

සමෘද්ධිලාභී ව්‍යවසායකයින්ගේ දැනුම කුසලතා වර්ධනය කිරීම,ව්‍යවසායකයින්ගේ නිෂ්පාදන උසස් ප්‍රමිතියෙන් හා නිමාවකින් යුක්තව සිදු කිරීම, ස්ථාවර වෙලඳපළක් ඇති කර ගැනීම, දීප ව්‍යාප්තව භාණ්ඩ විකිණීම හා ප්‍රචාරණය, තෘප්තිමත් පාරිභෝගික ප්‍රජාවක් ගොඩනැංවීම, නිෂ්පාදනයට සාධාරණ මිලක් ලබා ගැනීම හා පරිසර හිතකාමී හරිත රැකියා අවස්ථා සුලභ කිරීම මගින් ව්‍යවසායකයා ආර්ථික හා සාමාජීය වශයෙන් සවිබල ගැන්වීම තුලින් ජාතික ආර්ථික වර්ධනයට සෘජුව දායක වීම.

2.1.5.1 (ආ). 2021 වර්ෂය තුල ක්‍රියාත්මක කරන ලද වැඩසටහන්

1. සමෘද්ධි සුව බොජුන්හල් හා අලෙවි මධ්‍යස්ථාන වැඩසටහන (අතැති බිල්පත් - 2020)
2. සමෘද්ධි සුව බොජුන්හල් හා අලෙවි මධ්‍යස්ථාන වැඩසටහන.
3. දුම්රිය ස්ථාන ආශ්‍රිතව සමෘද්ධි නිෂ්පාදන අලෙවිසැල් ඉදි කිරීම.
4. සමෘද්ධි ව්‍යවසායකයින්ගේ නිෂ්පාදන හා සේවා අන්තර්ජාල වෙළඳපොලට ප්‍රවේශ කරවීම (Online Marketing)
5. "සමෘද්ධි අභිමානී 2021"වෙළඳ ප්‍රදර්ශන පැවැත්වීම.
6. මුහුණු පොතේ ව්‍යාපාරික ජාලය(Samurdhi Business Directory on Facebook).
7. සමෘද්ධි ව්‍යාපාරික සංගම් ප්‍රතිව්‍යුහගත කිරීම.
8. ව්‍යාපාරික කාන්තාවන් සඳහා වසවිස රහිත ආහාර සැකසීම පිළිබඳ පුහුණුව
9. රූපලාවන්‍ය හා ගෘහ ආශ්‍රිත කර්මාන්ත ප්‍රවර්ධනය
10. විශේෂ අලෙවි වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

2.1.5.1(ඇ). සමස්ථ ප්‍රගතිය පිලිබඳ සාරාංශය

සමෘද්ධි ව්‍යවසාය සංවර්ධන වැඩසටහන සඳහා භාවිතා කරන ලද්දේ භාණ්ඩාගාර සෘජු ප්‍රතිපාදන පමණි. ඒ අනුව 2021වර්ෂය සඳහා වෙන් කළ ප්‍රතිපාදන ප්‍රමාණය රුපියල් මිලියන 151 වන අතර සමස්ථ වියදම රුපියල් මිලියන 135.82 කි.

සංඛ්‍යා සටහන - (XVIII)
අලෙවි සංවර්ධන වැඩසටහන - මූල්‍ය හා භෞතික ප්‍රගතිය

	වැඩසටහන	වෙන් කළ මුදල (රු.මි)	වියදම (රු.මි)	ව්‍යාපෘති වැඩසටහන් සංඛ්‍යාව	ප්‍රතිලාභීන් සංඛ්‍යාව
1	සමෘද්ධි සුව බොජුන් හල් සහ අලෙවි මධ්‍යස්ථාන වැඩසටහන (අතැති බිල්පත්-2019)	0.18	0.17	01	30
2	සමෘද්ධි සුව බොජුන් හල් සහ අලෙවි මධ්‍යස්ථාන වැඩසටහන	107.55	95.5	27 (මධ්‍යස්ථාන)	270
4	"සමෘද්ධි අභිමානී 2021"වෙලඳ ප්‍රදර්ශන පැවැත්වීම.	36.58	36.27	1000	50,000
5	මුහුණු පොතේ ව්‍යාපාරික ජාලය (Samurdhi Business Directory on Facebook)	0.00	0.00	01	5000
6.	ව්‍යාපාරික කාන්තාවන් සඳහා වසවිස රහිත ආහාර සැකසීම පිළිබඳ පුහුණුව	0.3	0.1	03	60
7	රූපලාවන්‍ය හා ගෘහ ආශ්‍රිත කර්මාන්ත ප්‍රවර්ධනය	4.14	3.7	930	930
8	විශේෂ ව්‍යාපෘති	2.15	0.077	02	70
එකතුව		**150.90**	**135.817**	**1,962**	**56,360**

2.1.5.2 සමෘද්ධි නිවාස ලොතරැයි වැඩසටහන

2013 අංක 01 දරණ දිවිනැගුම පනතේ 45 වන වගන්තිය මඟින් සලසා ඇති ප්‍රතිපාදන මගින් 1995 අංක 30 දරණ ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරී පනත යටතේ ක්‍රියාත්මක කරන ලද නිවාස සංවර්ධන ලොතරැයි අරමුදල පහත සඳහන් රෙගුලාසි අනුව ක්‍රියාත්මක කොට නිවාස සංවර්ධන ලොතරැයි දිණුම් ඇදීම පවත්වාගෙන යනු ඇත.සෑම සමෘද්ධි ප්‍රතිලාභී පවුලක් සඳහාම ස්ථීර නිවසක හිමිකම ලබාදීමේ අරමුණින් සමෘද්ධි නිවාස සංවර්ධන ලොතරැයි භාරකාර අරමුදල පවත්වාගෙන යනු ලැබේ. මෙම අරමුදල ගොඩනංවා ඇත්තේ සමෘද්ධි ප්‍රතිලාභී පවුල්වලට ලබාදෙනු ලබන සහනාධාර මුදලින් මාසිකව රු. 80/-ක මුදලක් අරමුදලට බැර කිරීමෙනි. සමෘද්ධි නිවාස ලොතරැයි භාරකාර අරමුදල රෙගුලාසි මාලාවකට අනුකූලව 2002.03.07 දිනැතිව අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් මඟින් අනුමත කරන ලද භාරකාර මණ්ඩලයක් මඟින් පාලනය වේ.

2.1.5.2 (අ). 2021 වර්ෂයේදී ක්‍රියාත්මක කරන ලද වැඩසටහන්

1. නිවාස ලොතරැයි දිණුම් ඇදීම යටතේ නිවාස ලබාදීමේ වැඩසටහන (රු. ලක්ෂ 02 නිවාස ආධාර)
2. රු. ලක්ෂ 02 නිවාස ආධාර වැඩසටහන
3. රු. ලක්ෂ 06 නිවාස ආධාර වැඩසටහන
4. ශ්‍රව්‍යදෘෂ්‍ය මාධ්‍ය මගින් ඉදිරිපත් වන අභියාචනා සඳහා නිවාස ලබාදෙන වැඩසටහන

1. නිවාස ලොතරැයි දිණුම් ඇදීම යටතේ නිවාස ආධාර ලබාදීමේ වැඩසටහන (රු. ලක්ෂ 02 නිවාස ආධාර)

සංඛ්‍යා සටහන - (XIX)
2021 වසර සඳහා දිණුම් අදිණු ලැබූ ජයග්‍රාහකයින් සංඛ්‍යාව හා නිදහස් කළ මුදල

අනු අංකය	දිස්ත්‍රික්කය	ප්‍රා.ලේ. කොා. ගණන	ජයග්‍රාහී ලොතරැයි ගණන	මුදල(රු.)
1	අම්පාර	20	240	48,000,000.00
2	අනුරාධපුර	22	264	52,800,000.00
3	බදුල්ල	15	180	36,000,000.00
4	මඩකලපුව	14	168	33,600,000.00
5	කොළඹ	13	156	31,200,000.00
6	ගාල්ල	19	228	45,600,000.00
7	ගම්පහ	13	156	31,200,000.00
8	හම්බන්තොට	12	144	28,800,000.00
9	කළුතර	14	168	33,600,000.00
10	මහනුවර	20	240	48,000,000.00
11	කෑගල්ල	11	132	26,400,000.00
12	කුරුණෑගල	30	360	72,000,000.00
13	මාතලේ	11	132	26,400,000.00
14	මාතර	16	192	38,400,000.00
15	මොනරාගල	11	132	26,400,000.00
16	නුවර එළිය	5	60	12,000,000.00

අනු අංකය	දිස්ත්‍රික්කය	ප්‍රා.ලේ. කොා. ගණන	ජයග්‍රාහී ලොතරැයි ගණන	මුදල(රු.)
17	පොලොන්නරුව	7	84	16,800,000.00
18	පුත්තලම	16	192	38,400,000.00
19	රත්නපුර	17	204	40,800,000.00
20	ත්‍රිකුණාමලය	11	132	26,400,000.00
21	වවුනියාව	4	48	9,600,000.00
22	යාපනය	15	180	36,000,000.00
23	කිලිනොච්චිය	4	48	9,600,000.00
24	මුලතිවු	6	72	14,400,000.00
25	මන්නාරම	5	60	12,000,000.00
එකතුව		**331**	**3972**	**794,400,000.00**

2. රු. ලක්ෂ 02 නිවාස ආධාර වැඩසටහන

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකට නිවාස 05 බැගින් ලබාදෙන අතර මෙම ප්‍රතිලාභීන්ගේ පවුල් සඳහා සවිස්තරාත්මක තොරතුරු ගොනුවක් පවත්වාගත යුතුය. මෙම නිවාස ඉදිකිරීමේදී ලබාදෙන රු. ලක්ෂ 02ට අමතරව ප්‍රභූ හා ප්‍රජා දායකත්වය එක් කරගනිමින් සම්පූර්ණ නිවසක් ඉදිකිරීමට කටයුතු කළ යුතුය.

සංඛ්‍යා සටහන - (XX)
සෞභාග්‍යා විශේෂ නිවාස වැඩසටහන - 2021.12.31 දිනට ප්‍රගතිය (රු. ලක්ෂ 02)

අනු අංකය	දිස්ත්‍රික්කය	ප්‍රා.ලේ. කොා. ගණන	වෙන් කර ඇති මුදල	අනුමත නිවාස ගණන	ක්‍රියාත්මක නිවාස ගණන
1	අම්පාර	20	22,200,000	111	104
2	අනුරාධපුර	22	22,000,000	110	110
3	බදුල්ල	15	15,200,000	76	74
4	මඩකලපුව	14	14,000,000	70	70
5	කොළඹ	13	16,200,000	81	78
6	ගාල්ල	19	19,200,000	96	96
7	ගම්පහ	13	13,200,000	66	66
8	හම්බන්තොට	12	12,000,000	60	59
9	කළුතර	14	14,200,000	71	70
10	මහනුවර	20	20,200,000	101	100
11	කෑගල්ල	11	11,000,000	55	54
12	කුරුණෑගල	30	30,800,000	154	152
13	මාතලේ	11	13,000,000	65	65
14	මාතර	16	18,600,000	93	89
15	මොනරාගල	11	11,000,000	55	51
16	නුවර එළිය	5	5,000,000	25	24
17	පොලොන්නරුව	7	7,000,000	35	35

අනු අංකය	දිස්ත්‍රික්කය	ප්‍රා.ලේ. කොා. ගණන	වෙන් කර ඇති මුදල	අනුමත නිවාස ගණන	ක්‍රියාත්මක නිවාස ගණන
19	රත්නපුර	17	18,000,000	90	88
20	ත්‍රිකුණාමලය	11	11,000,000	55	54
21	වවුනියාව	4	4,000,000	20	20
22	යාපනය	15	15,000,000	75	75
23	කිලිනොච්චිය	4	4,000,000	20	20
24	මුලතිවු	6	6,000,000	30	30
25	මන්නාරම	5	3,600,000	18	17
එකතුව		**331**	**343,200,000**	**1,716**	**1,678**

3 .රු. ලක්ෂ 06 නිවාස ආධාර වැඩසටහන

සංඛ්‍යා සටහන - (XXI)

සෞභාග්‍යා විශේෂ නිවාස වැඩසටහන - 2021.12.31 දිනට ප්‍රගතිය (රු. ලක්ෂ 06)

අනු අංකය	දිස්ත්‍රික්කය	ප්‍රා.ලේ. කොා. ගණන	වෙන් කර ඇති මුදල	අනුමත නිවාස ගණන	ක්‍රියාත්මක නිවාස ගණන
1	අම්පාර	20	12,600,000	21	18
2	අනුරාධපුර	22	13,200,000	22	21
3	බදුල්ල	15	9,000,000	15	15
4	මඩකලපුව	14	8,400,000	14	14
5	කොළඹ	13	7,200,000	12	10
6	ගාල්ල	19	13,000,000	22	22
7	ගම්පහ	13	15,000,000	25	25
8	හම්බන්තොට	12	7,200,000	12	12
9	කළුතර	14	8,400,000	14	14
10	මහනුවර	20	12,000,000	20	20
11	කෑගල්ල	11	6,600,000	11	11
12	කුරුණෑගල	30	18,000,000	30	30
13	මාතලේ	11	6,600,000	11	11
14	මාතර	16	9,600,000	16	16
15	මොනරාගල	11	6,600,000	11	11
16	නුවර එළිය	5	2,400,000	4	4
17	පොලොන්නරුව	7	4,200,000	7	7
18	පුත්තලම	16	9,600,000	16	16
19	රත්නපුර	17	10,200,000	17	17
20	ත්‍රිකුණාමලය	11	6,600,000	11	11
21	වවුනියාව	4	2,400,000	4	4
22	යාපනය	15	9,000,000	15	15
23	කිලිනොච්චිය	4	2,400,000	4	4
24	මුලතිවු	6	2,400,000	4	4
25	මන්නාරම	5	1,800,000	3	3
එකතුව		**331**	**204,400,000**	**341**	**335**

4. ශ්‍රව්‍ය දෘෂ්‍ය මාධ්‍ය මඟින් ඉදිරිපත් වන හා අභියාචනා සඳහා නිවාස ලබාදෙන වැඩසටහන

සමෘද්ධිලාභීන් හා අඩු ආදායම්ලාභීන්ගේ නිවාස පිළිබඳව පුවත්පත් හා විද්‍යුත් මාධ්‍ය මඟින් ප්‍රචාරය වන නිවාස අවශ්‍යතා හා ජනාධිපති, අගමැති , අමාත්‍යාශ ලේකම් හා මැති ඇමතිවරුන්, අධ්‍යක්ෂ ජනරාල් හා වෙනත් නිලධාරීන් මගින් ඉදිරිපත් වන ප්‍රජාවගේ අභියාචනා වෙනුවෙන් රු. ලක්ෂ 02 හා රු. ලක්ෂ 06 නිවාස යෝජනා පරීක්ෂා කර බලා නිවාස ලොතරැයි භාරකාර මණ්ඩලයේ අනුමැතිය ලැබීමෙන් පසුව මෙම නිවාස යෝජනා සඳහා සුදුසුකම් ලබාදීම සිදුවේ.

2.1.6. සමාජ සංවර්ධන හා පරිසර වැඩසටහන

2.1.6.1 හැඳින්වීම

ශ්‍රී ලංකාවේ දිළිඳුකම පිටුදැකීමේ ජාතික මෙහෙවර සිය ප්‍රමුඛතම කාර්ය කරගත් සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව ප්‍රජාව පුර්ණ සවිබලකරනයකට ලක් කිරීම සඳහා ආර්ථික, සමාජීය, මානසික, දේශපාලනික, සංස්කෘතික,නෛතික හා පාරිසරික යන පුළුල් පරාසය තුළ සිය ක්‍රියාකාරකම් පෙළගස්වා ඇත. 2030 වසර වන විට දුගී බවෙන් තොර, සමෘද්ධිමත් ශ්‍රී ලංකාවක් බිහි කිරීමට කටයුතු කරන පුරෝගාමී ආයතනය බවට පත්වීම, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ දැක්ම වන අතර අතිගරු ජනාධිපතිතුමා විසින් ඉදිරිපත් කළ **සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශනයේ** සඳහන් සමාජ සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කර ගැනීමට අදාලව සමාජයේ සියළු සමාජ කණ්ඩායම් (ළමුන්, තරුණයන්, වැඩිහිටියන් හා කාන්තාවන්) වෙත අවධානය යොමු කරමින් ඔවුන් සමාජීය, මානසික පාරිසරික හා සංස්කෘතිකමය වශයෙන් මුහුණ දෙන ගැටළු හඳුනාගෙන ඒවා අවම කර දැනුම, කුසලතා හා ආකල්ප වලින් පිරිපුන් මානව සමාජයක් බිහි කිරීම සඳහා 2021 වර්ෂයේ දී රුපියල් මිලියන 91 ක් වැයකර වැඩසටහන් රාශියක් ක්‍රියාත්මක කරන ලදි.

2.1.6.2 ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් හා ව්‍යාපෘති

(I) දිරිය පියස නිවාස වැඩසටහන

නිවසක භිමිකම නොමැතිව අනාරක්ෂිත තත්ත්වයේ ජීවත්වන පවුල්වල විශේෂයෙන් ගැහැණු දරුවන්ගේ ජීවිතවලට බාහිර පුද්ගලයන්ගෙන් සිදුවන විනාශය හා පරිසරයෙන් සිදුවන අහිතකර බලපෑම් හේතුවෙන් ඔවුන් දිළිඳු බවේ අන්තයට ළඟාවීම වැලැක්විය නොහැක. මෙම සමාජ අසාධාරණයන් වලක්වා අදාල නිර්ණායකයන් සපුරාලන පවුල් සඳහා රු: 200,000/= ක මුල්‍ය ආධාරයක් ලබා දෙමින් නිලධාරීන්ගේ හා ප්‍රජාවගේ සාමූහික මැදිහත්වීම තුලින් නිවසක් ඉදිකර අවසන් කර දීම "දිරිය පියස" නිවාස වැඩසටහනේ ක්‍රමවේදය වේ. තම නිවස ඉදිකිරීමේදි මෙම ප්‍රතිලාභීන් ලබන අත්දැකීම් සම්භාරය සමාජ වගකීම හා පුද්ගල අභිමානය ගොඩ නැගීම වඩා වැදගත් වේ. නිවාස තෘප්තිය සමඟ තම කුටුම්භය තුල සුරක්ෂිතතාව තහවුරු කර ගනිමින් කායික මානසික සහනයක් ලැබීම තුලින් දරුවන්ගේ අධ්‍යාපනික හා සෞඛ්‍ය මට්ටම් ඉහළ නංවමින් පුද්ගල ආධ්‍යාත්මික සංවර්ධනය, ආර්ථික සංවර්ධනය තුලින් ජීවන තත්වය උසස් කර සවිබලගැන්වීමේ ප්‍රවේශයට යොමුකර ජාතික සංවර්ධන ක්‍රියාවලියට දායක කරගැනීම අපේක්ෂිතය.

2021 වර්ෂයේ රුපියල් මිලියන 35.8 ක් වැය කර දිරිය පියස නිවාස 179 ඉදිකිරීමේ කටයුතු ආරම්භ කරන ලදි. එම නිවාස අතරින් 2021 දෙසැම්බර් 31 වන විට නිවාස 147 වැඩ කටයුතු මුළුමනින්ම අවසන් කිරීමටත්, නිවාස 32 ක ඉදිකිරීම් වල යම් කාර්යයන් ප්‍රමාණයක් නිම කිරීමටත් ඇත. එයට හේතු වුයේ වෙළදපලේ සිමෙන්ති වැනි අත්‍යවශ්‍ය අමුද්‍රව්‍ය වල පැවැති හිඟතාවයන්ය. කෙසේ වුවද මුල්‍ය ප්‍රගතිය 100% කි.

(II) සමෘද්ධිලාභී හා අඩු ආදායම්ලාභීන් සඳහා සනීපාරක්ෂක වැසිකිළි පහසුකම් සැපයීම

2021 වර්ෂයේ ප්‍රජාවගේ සනිපාරක්ෂක පහසුකම් සැපයීම වෙනුවෙන් එක් පවුලකට රුපියල් 30,000/- බැගින් රුපියල් මිලියන 50 ක් වෙන්කර පවුල් 1662 ක් සඳහා වැසිකිලි පහසුකම් සැපයීමට අවශය කටයුතු සංවිධානය කරන ලදි. ඒ අනුව 2021.12.31 දින වන විට වැසිකිලි 1,231 ක ඉදිකිරීම් සම්පූර්ණයෙන්ම අවසන් කර සෞඛ්‍ය සම්පන්න පරිසරයක් නිර්මාණය කර ඇත.

(III) සමෘද්ධි කැකුළු ළමා සමාජ පුස්තකාල සංවර්ධන වැඩසටහන

සමෘද්ධි කැකුළු ළමා සමාජ පදනම් කරගෙන මෙම වැඩසටහන ක්‍රියාත්මක කරන අතර ඒ වටා ගොනු වී ඇති ළමුන් තුළ කියවීමේ රුචිකත්වය වර්ධනය කර කායික හා මානසික වශයෙන් නිරෝගී, පරාර්ථකාමී, මානව ගුණධර්ම වලින් පිරිපුන්, පරිසරය හිතකාමී ළමා පරපුරක් නිර්මාණය කිරීමට අදහස් කෙරේ. ඒ අනුව සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ සමාජ සංවර්ධන අංශය විසින් 2021 වර්ෂයේ රුපියල් මිලියන 2.046 වැයකර දිස්ත්‍රික් මට්ටමින් කැකුළු ළමා සමාජ පුස්තකාල 82 ආරම්භ කිරීමට කටයුතු කරන ලදි. එහි මූල්‍ය ප්‍රගතිය 99% කි.

(IV) දිස්ත්‍රික් හා ජාතික මට්ටමින් ප්‍රගති සමාලෝචන වැඩමුළු පැවැත්වීම

ප්‍රාදේශිය ලේකම් කාර්යාල මට්ටමින් ක්‍රියාත්මක කරනු ලබන සමාජ සංවර්ධන වැඩසටහන් වල ඉලක්ක සාක්ෂාත් කර ගැනීමත්, ප්‍රගතිය ජාතික මට්ටම දක්වා නිසි වේලාවට ලබාදීමේ අරමුණ ඇතිව දිස්ත්‍රික් හා ජාතික මට්ටමින් ප්‍රගති සමාලෝචන වැඩමුළු 153 ක් රුපියල් මිලියන 1.43 ක් වැයකර පැවැත්වීමට සැලසුම් කර තිබුණි. පැවැති අයහපත් සෞඛ්‍ය තත්ත්වය නිසා පැවැත්වීමට හැකි වුයේ වැඩමුළු 67 ක් පමණි. වැය වූ මුදල රුපියල් මිලියන 0.809 කි. මූල්‍ය ප්‍රගතිය 56% කි.

(V) සමෘද්ධි සමාජ සංවර්ධන නිළධාරින්ගේ හැකියා වර්ධන වැඩමුළු පැවැත්වීම

ප්‍රජාව මුහුණ දෙන විවිධ සමාජ ගැටළුවලට විසඳුම් ප්‍රජාව වෙත ගෙනයන නිළධාරින්ගේ දැනුම ද යවත්කාලීන විය යුතුය. ඒ අනුව සමෘද්ධි සමාජ සංවර්ධන නිළධාරින්ගේ හැකියා වර්ධනය අරමුණු කරගෙන 2021 වර්ෂයෙ රුපියල් මිලියන 1.65 වැය කර වැඩසටහන් 26 ක් පැවැත්වීමට සැලසුම් කර තිබුණි. ඉලක්ක ගත වැඩමුළු සංඛ්‍යාව පැවැත්වුවත් වැය වූ මුදල 89% ක් හෙවත් රුපියල් මිලියන 1.48 කි.

2.1.7 ප්‍රජාමූල සංවිධාන වැඩසටහන

2.1.7.1 හැඳින්වීම

සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව යටතේ සංවර්ධන කාර්ය භාරයන් දියත් කිරීම සඳහා ප්‍රජාව සම්බන්ධ වන පහලම සංවිධානාත්මක ඒකකය ප්‍රජාමූල සංවිධානයයි. සමෘද්ධි ප්‍රජාමූල සංවිධානයක් යනු සමෘද්ධි පනතින් යෝජිත මෙහෙයුම් ක්‍රියාවලියේදී ප්‍රජාව සම්බන්ධ වන ග්‍රාමීය මට්ටමේ සංවිධානයකි. මෙම ඒකකය පදනම් කොටගෙන සමෘද්ධි ප්‍රාදේශීය සංවිධාන, සමෘද්ධි දිස්ත්‍රික් කමිටු සහ සමෘද්ධී ජාතික සම්මේලනය යනාදී වශයෙන් සමස්ත සංවිධාන ව්‍යූහය ගොඩනැඟී ඇත.

සමෘද්ධි පනතට අනුව සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් ඉටුකල යුතු සියලු සංවර්ධන කාර්යයන් හා ප්‍රජාව සම්බන්ධවන පහලම සංවිධානාත්මක ඒකකය වන ප්‍රජාමූල සංවිධාන මූලික කොට ගෙන ප්‍රජාවගේ පූර්ණ සහභාගිත්වයෙන් ඉටු කරනු ඇත. ප්‍රජාමූල සංවිධාන පිහිටුවීමත් එයට සමගාමීව ප්‍රාදේශීය සංවිධාන හා දිස්ත්‍රික් කමිටුද පිහිටුවා පවත්වා ගෙන යාම සිදු කෙරේ. මේ වන විට ප්‍රජාමූල සංවිධාන 30,211 ක් පිහිටුවා ඇත.

සමෘද්ධි ප්‍රජාමූල සංවිධානවල කර්තව්‍ය ප්‍රාදේශීය මට්ටමින් අධීක්ෂණය කිරීම,පරීක්ෂා කිරීම සහ ඇගයීමේ කාර්ය සඳහා ප්‍රජාමූල සංවිධාන වල සභාපතිවරුන්ගේ සහභාගිත්වයෙන් **සමෘද්ධි ප්‍රාදේශීය සංවිධාන** පිහිටුවා ඇත. ඒ අනුව සමෘද්ධි ප්‍රාදේශීය සංවිධාන 331 ක් පිහිටුවා ඇත.

දිස්ත්‍රික්කයක් ඇතුළත ක්‍රියාත්මක වන සියලු සමෘද්ධි ප්‍රාදේශීය සංවිධාන සභාපති හා ලේකම් නියෝජනය කරමින් **සමෘද්ධි දිස්ත්‍රික් කමිටු** පිහිටුවනු ලැබේ. මෙම දිස්ත්‍රික් කමිටු සෑම තුන් මසකට වරක් රැස්වීම් කැඳවීම සහ පැවැත්වීම සිදුකල යුතුය.

සියලු සමෘද්ධි ප්‍රජාමූල සංවිධානවල අනුයෝජිතයන්ගෙන් සමන්විත වන පරිදි **සමෘද්ධි ජාතික සම්මේලනය** පිහිටුවනු ලැබේ. අමාත්‍යවරයා සමෘද්ධි ජාතික සම්මේලනයේ සෑම රැස්වීමකම මුලසුන දැරිය යුතුය.

ජාතික මට්ටමින් සමෘද්ධි සංවර්ධන වැඩසටහන් සම්බන්ධීකරණය කිරීමේ ජාතික ප්‍රතිපත්තියක් සැලසුම් කිරීම සඳහා අවශ්‍ය වන යෝජනා සහ මත සමාලෝචනය කිරීම සහ සමෘද්ධි සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා නායකත්වය සැපයීම සමෘද්ධි ජාතික සම්මේලනයේ පරමාර්ථ වේ.

මෙම සියලු සංවිධාන පිහිටුවා යාවත්කාලීන කිරීම, පවත්වාගෙනයාම හා කළමනාකරණය කිරීම මෙන්ම එම සංවිධානවල සියලු කටයුතු අධීක්ෂණය කිරීම ප්‍රජාමූල සංවිධාන අංශය මඟින් සිදු කරනු ඇත.

2.1.7.2 ප්‍රජාමූල සංවිධාන අංශය මඟින් සිදුකරනු ලබන ක්‍රියාකාරකම්

- ❖ සමෘද්ධි ප්‍රජාමූල සංවිධාන හා ප්‍රාදේශීය සංවිධාන පිහිටුවීම.
- ❖ සමෘද්ධි ප්‍රජාමූල සංවිධාන හා ප්‍රාදේශීය සංවිධාන ලියාපදිංචි කිරීම.
- ❖ සමෘද්ධි ප්‍රජාමූල සංවිධාන හා ප්‍රාදේශීය සංවිධාන ලියාපදිංචිය අලුත් කිරීම.
- ❖ සමෘද්ධි ජාතික සම්මේලනය වාර්ෂිකව පැවැත්වීම.
- ❖ ප්‍රජා නායකයින් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.
- ❖ ප්‍රජාමූල සංවිධාන හා ප්‍රාදේශීය සංවිධානවල ගිණුම් කටයුතුවලට අදාලව මුද්‍රිත ලිපි ද්‍රව්‍ය සැපයීම.
- ❖ ආර්ථික සංවිධාන පිහිටුවීම.
- ❖ ව්‍යාපාර සංවිධාන පිහිටුවීම.
- ❖ සමෘද්ධි කොඩි වැඩසටහන ක්‍රියාත්මක කිරීම.
- ❖ සංවිධාන අරමුදල් වර්ධනය කිරීමට අවශ්‍ය විවිධ වූ ක්‍රියාමාර්ග හඳුන්වා දීම.
- ❖ සමෘද්ධි ප්‍රතිලාභී පවුල්වල ජාතික හා අන්තර් ජාතික මට්ටමින් ක්‍රීඩා දක්ෂතාවයන් දක්වන දරුවන්ට ක්‍රීඩා සංවර්ධන ආධාර ලබාදීම.
- ❖ දෙපාර්තමේන්තුවේ දක්ෂතාවයන් දක්වන කාර්ය මණ්ඩලය රාජ්‍ය සේවා ක්‍රීඩා තරඟ හා ජාතික හා අන්තර්ජාතික ක්‍රීඩා තරඟ සඳහා ඉදිරිපත් කිරීම.

- ➢ පිහිටුවා ඇති සමෘද්ධි ප්‍රජාමූල සංවිධාන සංඛ්‍යාව 30,211
- ➢ පිහිටුවා ඇති සමෘද්ධි ප්‍රාදේශීය සංවිධාන සංඛ්‍යාව 331
- ➢ ත්‍රෛයි මාසිකව රැස්වන දිස්ත්‍රික් කමිටු සංඛ්‍යාව 100
- ➢ ප්‍රජාමූල සංවිධානවල මුළු සාමාජික සංඛ්‍යාව මිලි. 20

2.1.7.3 පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

2013 අංක 01 දරණ සමෘද්ධි පනතේ 04 වන වගන්තියේ (උ) හා (ඌ) හි සඳහන් පරමාර්ථ ඉටුකර ගැනීම සඳහා 05 වන වගන්තියේ (ඕ) හි සඳහන් බලතල ප්‍රකාරව 06 වන වගන්තියේ (ඈ) හා (ඒ) හි සඳහන් කර්තව්‍යයන් ක්‍රියාත්මක කිරීමට අනුකූලව කටයුතු කිරීම සඳහා ප්‍රජාව දැනුවත් කිරීම කල යුතු වේ.

2.1.7.4 දිස්ත්‍රික් කමිටු රැස්වීම් පැවැත්වීම.

සමෘද්ධි ප්‍රජාමූල සංවිධානවල ,ප්‍රාදේශීය සංවිධානවල වැඩසටහන් අධීක්ෂණය කිරීම , නියාමනය කිරීම, සහ ඇගයීම. දිස්ත්‍රික්කය තුළ සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට අදාල යෝජනා ඉදිරිපත් කිරීම, වැඩසටහන් සම්බන්ධීකරණය කිරීම.

ස්ථානය - දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

සහභාගීත්වය -ප්‍රාදේශීය සංවිධානවල සභාපතිවරු, ලේකම්වරු, ප්‍රජාමූල බැංකු සමිති ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන්, දිස්ත්‍රික්කය භාරව සිටින දෙපාර්තමේන්තු නිලධාරියා, අධ්‍යක්ෂ ජනරාල් විසින් නම් කරනු ලබන දිස්ත්‍රික්කයේ සංවර්ධන කටයුතුවල යෙදී සිටින තැනැත්තන් තුන්දෙනෙකු

සෑම වර්ෂයකම තුන් මසකට වරක් රැස්වීම් පවත්වන අතර වර්ෂයකට රැස්වීම් 04 ක් පැවැත්වේ.

දිස්ත්‍රික්කය තුළ සමෘද්ධි සංවර්ධන වැඩසටහන් කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීම සඳහා වූ යෝජනා සහ මත සලකා බැලීම සහ ඒවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීම. දිස්ත්‍රික් මට්ටමේ රාජ්‍ය, රාජ්‍ය නොවන සහ පෞද්ගලික ආයතන සමග සම්බන්ධීකරණය පැවැත්වීම සිදු කෙරේ.

2.1.7.5 සමෘද්ධි කොඩි වැඩසටහන

2013 අංක 01 දරණ සමෘද්ධි පනතේ 10 (ඒ) ඡේදයට අනුව සමෘද්ධි ප්‍රතිලාභීන්ගේ ආත්ම විශ්වාසය, සමාජය කෙරෙහි සාමූහික වගකීම, යහපත් ගුණංග හා ගුණ ධර්ම ප්‍රවර්ධනය කිරීම ප්‍රජාමූල සංවිධානවල එක් පරමාර්ථයක් වන අතර පනතේ 16(ඉ) ඡේදයට අනුව සමෘද්ධි ප්‍රතිලාභීන්ගේ මානව පෞර්ෂය, සාමූහික ක්‍රියාකාරකම් දැහැමි හා ආධ්‍යාත්මික ගුණාංග වැඩි දියුණු කිරීම සමෘද්ධි ප්‍රාදේශීය සංවිධානවල එක් පරමාර්ථයක් වේ.

මෙම පරමාර්ථ ඉටුකර ගැනීම සඳහා ජාත්‍යන්තර දුම්වැටි හා මත් විරෝධී දිනට සමගාමීව සමෘද්ධි කොඩි වැඩසටහන සමෘද්ධි ප්‍රජාමූල සංවිධාන හා සමෘද්ධි ප්‍රාදේශීය සංවිධාන හරහා ක්‍රියාත්මක කරනු ලැබේ. තම වසමට අයත් ප්‍රජාමූල සංවිධානවල සභාපති, ලේකම්, භාණ්ඩාගාරික ඇතුළු විධායක සභාව මෙන්ම සාමාජිකයන් සමඟ එක්ව සමෘද්ධි ප්‍රතිලාභීන් මගින් කොඩි හා ස්ටිකර් පිළිගැන්වීම දුම් වැටි හා මත්ද්‍රව්‍ය භාවිතයෙන් වැලකී සිටීමේ පණිවුඩය ජනතාව වෙත ලබා දෙමින් අරමුදල් රැස් කිරීම මින් බලාපොරොත්තු වේ.

සමෘද්ධි ප්‍රතිලාභීන්ගේ හා අඩු අදායම්ලාභීන්ගේ සමාජ සුභසාධන කටයුතු සඳහා මෙම අරමුදල් යොදවනු ලැබේ.

මෙම වැඩසටහන සියළුම ප්‍රජාව සඳහා සියළුම දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල ක්‍රියාත්මක කෙරේ. දුම්වැටි විරෝධී දිනයට සමගාමීව මත් නිවාරණ වැඩසටහන් පැවැත්වීම හා කොඩි වැඩසටහන තුලින් එක්රැස් කරන ලද අරමුදලින් ප්‍රතිලාභීන්ගේ හා ඔවුන්ගේ පවුල්වල දරුවන්ගේ සුබසාධනය සඳහා යෙදවීම. මත් නිවාරණ වැඩසටහන්, නිවාස ඉදිකිරීම්, නිවාස අලුත්වැඩියා කිරීම්, පාසල් දරුවන් සඳහා ශිෂ්‍යත්ව ලබාදීම, පාසල් දරුවන් සඳහා පොත් උපකරණ ලබාදීම, සනීපාරක්ෂක වැඩසටහන, සෞඛ්‍යය හා පෝෂණ වැඩසටහන්, ආබාධිත සුභසාධනය, කාන්තා හා වැඩිහිටි දින වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලැබේ.

සංඛ්‍යා සටහන - (XXII)

2017 වර්ෂය			2018 වර්ෂය			2019 වර්ෂය		
කොඩි ආදායම (රු.මි)	ආදායමින් 90%	වියදම (රු.මි.)	කොඩි ආදායම (රු.මි.)	ආදායමින් 90%	වියදම (රු.මි.)	කොඩි ආදායම (රු.මි.)	ආදායමින් 90%	වියදම (රු.මි.)
185.56	167.00	134.01	19.13	172.22	141.29	215.15	193.64	50.66

2.1.7.6 ක්‍රියාත්මක වැඩසටහන්වල ප්‍රගතිය

සංඛ්‍යා සටහන - (XXIII)

අ.අ.	වැඩසටහන	වියදම(රු.මි.)	සංඛ්‍යාව
01	සමෘද්ධි ප්‍රජා පුහුණුකරුවන් පුහුණු කිරීම.	4.99	ප්‍රජා පුහුණුකරුවන් 356
02	ප්‍රජාමූල සංවිධානවල යටිතල පහසුකම් සඳහා අවශ්‍ය උපකරණ ලබා දීම.	13.71	1,000 ප්‍රජාමූල සංවිධාන සඳහා උපකරණ ලබා දීම
03	දිස්ත්‍රික් කමිටු රැස්වීම් පැවැත්වීම	0.82	කමිටු රැස්වීම්50
	එකතුව	**19.52**	

2.1.7.7 ක්‍රීඩා සංවර්ධන හා ශාරීරික ක්‍රියාකාරකම් වැඩසටහන

I. සමෘද්ධි ප්‍රතිලාභී දරු දැරියන්ගේ ක්‍රීඩා කුසලතා හඳුනාගෙන ඔවුන් ජාතික හා අන්තර්ජාතික තලයට ගෙන ඒම සඳහා අවශ්‍ය කටයුතු ඉටුකිරීම.

II. ක්‍රීඩා දක්ෂතා ඇති ප්‍රතිලාභී දරුවන්ගේ ක්‍රීඩා හැකියාවන් හා ආකල්ප සංවර්ධනය වෙනුවෙන් දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

III. සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවට අයත් (ප්‍රධාන කාර්යාලය ඇතුළුව) දිවයින පුරා විසිර සිටින සමස්ත කාර්ය මණ්ඩලය /රාජ්‍ය සේවා/ පලාත් / දිස්ත්‍රික් /ජාතික හා අන්තර්ජාතික තරහාවලීන් සඳහා යොමු කිරීම සහ දිස්ත්‍රික් මට්ටමින් ක්‍රීඩා සමිති පිහිටුවීම.

2.1.8 තොරතුරු තාක්ෂණ වැඩසටහන

2.1.8.1 හැඳින්වීම

සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව මඟින් සිදුකරනු ලබන කාර්යයන් තොරතුරු තාක්ෂණයත් සමඟ සම්බන්ධ කොට වඩාත් කාර්යක්ෂම සේවාවක් ලබාදීම මෙම අංශයේ ප්‍රධාන අරමුණයි. දැනට ලිපි ලේඛන තැපෑල භාවිතයෙන් සිදුකරනු ලබන ක්‍රියාවලිය අන්තර්ජාලය භාවිතා කොට Email පණිවුඩ හුවමාරු හා පරිගණක වැඩසටහන් නිර්මාණය කොට සේවාවන් කාර්යක්ෂම කිරීමද තොරතුරු තාක්ෂණ අංශයේ අරමුණ වේ.

2.1.8.2 ක්‍රියාකාරකම්

- සමෘද්ධි සහනාධාරලාභී නාම ලේඛන අන්තර්ජාලය ඔස්සේ යාවත්කාලීන කළ හැකි ආකාරයට ප්‍රතිලාභී කලමනාකරණ මොඩියුලය (CRM) යාවත්කාලීන කර පවත්වාගෙන යාම.
- ප්‍රධාන කාර්යාලය තුළ ලිපි හුවමාරුව අවම කිරීම සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය කොට ක්‍රමවත් අභ්‍යන්තර ජාල පද්ධතියක් (Local Area Network) සකස් කිරීම.
- දිවයින පුරා පැතිරී ඇති සමෘද්ධි බැංකු 1074 හා සමිති පරිගණකගත කිරීම සඳහා මෘදුකාංග සමාගම් දෙකක් දැනට තෝරාගෙන පළාත් 06 ක් සඳහා එක් මෘදුකාංගයකුත් පළාත් 03 ක් සඳහා අනෙක් මෘදුකාංගය වශයෙන් සියලු බැංකු පරිගණක ගත කිරීමට කටයුතු කිරීම.
- දෙපාර්තමේන්තුවේ දුරකථන ඇමතුම් සඳහා වන වියදම් අවම කිරීම සඳහා ඇතිකර ඇති Calling circle දුරකථන ජාලය වඩාත් ශක්තිමත් කිරීම.
- 2021 වර්ෂයට අදාළ සමෘද්ධි නිවාස සංවර්ධන ලොතරැයි දිනුම් ඇදීමේ දත්ත CRM මෘදුකාංගය හරහා ලබා දීම.
- සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව නිල වෙබ් අඩවිය, දෙපාර්තමේන්තු මඟින් නිකුත් කරනු ලබන චක්‍ර ලේඛන, උපදෙස් ලිපි හා දැනුම් දීම් සියල්ල යාවත්කාලීන කරමින් පවත්වා ගෙන යාම.www.samurdhi.gov.lk
- දිවයින පුරා විසිරී ඇති සමෘද්ධි මූලස්ථාන කාර්යාල 331 හා දිස්ත්‍රික් කාර්යාල 25 සඳහා අන්තර්ජාල පහසුකම් ලබාදීම බිල්පත් ගෙවීමට අවශ්‍ය කටයුතු සිදුකිරීම
- සමෘද්ධි මූලස්ථාන කාර්යාල 331 හා දිස්ත්‍රික් කාර්යාල 25 සඳහා අවශ්‍යතා ඇති වන ආකාරයට පරිගණක හා පරිගණක උපාංග ලබාදීම.
- නිලධාරීන්ට අවශ්‍ය තොරතුරු තාක්ෂණ පුහුණුව ලබාදීම.
- සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ නිල විද්‍යුත් තැපැල් සේවාව (e-mail) පවත්වාගෙන යාම.

2.1.8.3 CRM මොඩියුලය ක්‍රියාත්මක කිරීම.

i. අන්තර්ජාලය ඔස්සේ සමෘද්ධිලාභී නාම ලේඛන යාවත්කාලීන කිරීම.

ii. නිවාස සංවර්ධන ලොතරැයි දිනුම් ඇදීම සඳහා යාවත්කාලීන වූ දත්ත පද්ධතියක් ලබා ගැනීමට හැකිවීම

iii.සමාජ ආරක්ෂණ ගෙවීම් කඩිනම් වීම

සියලුම සමෘද්ධි මූලස්ථාන කාර්යාලවල ක්‍රියාත්මක වේ. 2019 වර්ෂයේ සිට ක්‍රියාතමක වන මෙම වැඩසටහන සඳහා 2021 වර්ෂයේ රු.මිලියන 2.8ක් වෙන්කරන ලදි. වැඩසටහන ඉදිරියටත් අඛණ්ඩව ක්‍රියාත්මක වන අතර 2021 වර්ෂයේ මේ සඳහා වියදම් කල මුදල රු.මිලියන 1.43 කි. භෞතික ප්‍රගතිය 85% පමණ වේ.

2.1.8.4 ව්‍යාපෘතිය මඟින් ලබාගත් සමාජ ආර්ථික ප්‍රතිඵලය

i. සමෘද්ධි සහනාධාර නාමලේඛන යාවත්කාලීනව පවත්වාගැනීම.
ii. සමාජ ආරක්ෂණ ගෙවීම් කඩිනම් වීම
iii. සහනාධාර මුදල් නිවැරදිව ලබා දීම

2.1.8.5 දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවිය යාවත්කාලීන කරමින් පවත්වාගෙන යාම

මේ මඟින්, වෙබ් අඩවිය යාවත්කාලීන කරමින් පවත්වාගෙන යාම, දෙපාර්තමේන්තුවේ කටයුතු කාර්යක්ෂම කිරීම සඳහා නිකුත් කරන චක්‍ර ලේඛ, නිවේදන, ලිපි ආදිය නිලධාරීන්ට කඩිනමින් ලබා දීම සිදු කෙරේ.

2.1.8.6 සමෘද්ධි ප්‍රජා මූල බැංකු පරිගණකගත කිරීම

මෙම වැඩසටහන සමෘද්ධි ප්‍රධාන කාර්යාල මඟින් ක්‍රියාත්මක වන අතර .බැංකු සඳහා අඛණ්ඩ මනා සේවාවක් සැපයීම සඳහා පරිගණක මෘදුකාංගය නිෂ්පාදිත ආයතන සමඟ සේවා ගිවිසුමකට එළඹීමත්, මෘදුකාංගයේ දෝෂ සියල්ල හඳුනාගෙන ඒවා නිවැරදි කර සියලු බැංකු වෙත ලබාදීමත් මෙම වැඩසටහනේ ප්‍රධාන අරමුණ වේ. ක්ෂුද්‍ර මූල්‍ය අංශය මඟින් මේ සඳහා වියදම් දරන අතර, 2021.12.31 වන විට බැංකු 1,301ක් පරිගණකගත කර ඇත. මෙහිදී පහත සඳහන් ක්‍රියාකාරකම් සිදු කරනු ලැබේ.

i. ගනුදෙනුකරුවන් ලියාපදිංචිය
ii. ගිණුම් ඇතුලත් කිරීම
iii. ගනුදෙනු ආරම්භය
iv. ණය වර්ග හා තැන්පත් වර්ග ඇතුලත් කිරීම
v. පාස්පොත් මුද්‍රණය
vi. දෛනික ගිණුම් කටයුතු, පොළී ගණනය කිරීම ශේෂ පිරික්සුම ආදී බැංකුවේ කටයුතු හා බැංකුවට අවශ්‍ය වාර්තා සකස් කිරීම

මෙමඟින් ලබාගත් සමාජ ආර්ථික ප්‍රතිඵල

- දැනට ක්‍රියාත්මක නියමු සමෘද්ධි බැංකුවල කාර්යක්ෂමතාවය ඉහළ මට්ටමක පවතී.
- නිළධාරීන්ගේ ශ්‍රමය යොදා කරන ලද ක්‍රියාවලිය පරිගණක මෘදුකාංගය මඟින් කිරීමේ දී නිවැරදිව හා පහසුව කිරීමටත්, කාලය ඉතිරිකර ගැනීමටත් හැකිවීම.
- ප්‍රතිලාභීන්ට ප්‍රමාද දෝෂයකින් තොරව කලට වේලාවට තම ගනුදෙනු කටයුතු කරගැනීමේ පහසුව සැලසීම.

2.1.8.7 HRM මොඩියුලය ක්‍රියාත්මක කිරීම

සමෘද්ධී සංවර්ධන දෙපාර්තමේන්තු සේවකයන්ගේ පෞද්ගලික හා රාජකාරී ආදී තොරතුරු එනම් පෞද්ගලික ලිපි ගොනුවක අඩංගු තොරතුරු ඇතුළත් කිරීම හා නිලධාරියාගේ විශ්‍රාම ලිපි ගොණුව සකස් කිරීම නිර්මාණය කරන ලද පද්ධතියක් වන අතර, මෙය සියලුම දිස්ත්‍රික් සමෘද්ධි මූලස්ථාන කාර්යාල හා ප්‍රධාන කාර්යාලය මඟින් ක්‍රියාත්මක වේ.

වැඩසටහන ක්‍රියාත්මක කිරීම තුලින්,

- ප්‍රමාදයකින් තොරව සේවක ගැටළු විසඳීමට හැකි වීම
- කාර්යාල කටයුතු වල කාර්යක්ෂමතාවය ඉහළ යාම.
- නිවැරදි සහ යාවත්කාලීන දත්ත පහසුවෙන් ලබා ගත හැකි වීම බලා පොරොත්තු වේ.

2.1.9 මාධ්‍ය වැඩසටහන

2.1.9.1 හැඳින්වීම

2030 වසර වන විට දුගී බවෙන් තොර, සමෘද්ධිමත් ශ්‍රී ලංකාවක් බිහි කිරීමට කටයුතු කරන පුරෝගාමී ආයතනය බවට පත්වීම, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ දැක්ම වන අතර,අතිගරු ජනාධිපතිතුමා විසින් ඉදිරිපත් කළ "සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශනයේ සඳහන් ඉලක්ක සාක්ෂාත් කරගැනීමට අදාලව දෙපාර්තමේන්තුවේ එක් එක් අංශ මඟින් ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන් ජනතාව අතරට ගෙනයාම මාධ්‍ය අංශයේ මූලික අරමුණ වේ. මේ සඳහා මුද්‍රිත මාධ්‍ය මෙන්ම විද්‍යුත් මාධ්‍යය ද භාවිතා කරන අතර පහත සඳහන් ප්‍රධාන වැඩසටහන් 2021 වර්ෂයේ ක්‍රියාත්මක කරන ලදි.

ක්‍රියාත්මක කරන ලද ප්‍රධාන වැඩසටහන්

1. සමෘද්ධි E අන්තර්ජාල පුවත්පත
2. සමෘද්ධි උදානය රූපවාහිනී වැඩසටහන
3. සමෘද්ධි FM අන්තර්ජාල රේඩියෝව
4. මාධ්‍ය අංශය සඳහා කැමරා උපකරණ ලබා ගැනීම.

2021 වර්ෂයේ ක්‍රියාත්මක කරන ලද ප්‍රධාන වැඩසටහන්වල ප්‍රගතිය .

සංඛ්‍යා සටහන - (XXIV)

වැඩසටහන්		වැඩසටහන් ගණන	වෙන්කල මුදල රු.මි.	වැය වූ මුදල රු.මි.
1.	සමෘද්ධි E පුවත්පත.	සිංහල 24 දෙමළ 24 ඉංග්‍රීසි 24	2.64	2.64
2.	රූපවාහිනී වැඩසටහන.	50	13.59	13.59
3.	සමෘද්ධි FM අන්තර්ජාල රේඩියෝව	150	1.27	1.27
4.	මාධ්‍ය අංශය සඳහා අවශ්‍ය කැමරා උපකරණ මිලදී ගැනීම.	1	1.5	1.48
එකතුව			**19.00**	**18.98**

2.1.10 සැලසුම් හා මෙහෙයුම් වැඩසටහන

2.1.10.1 හැඳින්වීම

සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය යටතේ පවතින ආයතන අතුරින් ජනතාවගේ දිළිඳුබව තුරන් කිරීමේ අරමුණ වෙනුවෙන් කටයුතු කරන ප්‍රධානතම ආයතනය සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවයි.

සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව වෙනුවෙන් ක්‍රමෝපාය සැලසුම් සකස් කිරීම, වාර්ෂික සැලසුම් සකස් කිරීම, ඒ සඳහා අවශ්‍ය අනුමැතීන් ලබා ගැනීම,හා එම සැලසුම් අනුව ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති පිළිබඳ පසු විපරම් කිරීම, ආයතනික තීන්දු තීරණ ගැනීම සඳහා ඵලදායී දත්ත ඉදිරිපත් කිරීම හා තොරතුරු වාර්ෂික වියදම් සීමාව තුළ ඊට සරිලන ප්‍රතිඵල ළඟා කරගෙන ඇත්ද යන වග නිරීක්ෂණය කිරීම, ආයතනික ඉදිරි විභවතා පිළිබඳ පර්යේෂණ සිදු කර දිළිඳු බව තුරන් කිරීමේ මෙරට ජාතික මෙහෙවරට උරදෙන ප්‍රමුඛතම ආයතනය බවට පත් කිරීමේ මෙහෙවර අප අංශය මඟින් සිදු කරයි.

2.1.10.2 සැලසුම් හා මෙහෙයුම් අංශය මඟින් ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන්

(I) ජාතික මට්ටමේ ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම.

ප්‍රධාන කාර්යාලය මඟින් මෙම රැස්වීම් සංවිධානය කරනු ලබන අතර, අධ්‍යක්ෂ ජනරාල්ගේ ප්‍රධානත්වයෙන් සෑම මසකට වරක්ම පැවැත්වේ. දෙපාර්තමේන්තුවේ වාර්ෂික සැලැස්ම අනුව ක්‍රියාතමක වන ව්‍යාපෘති වල ප්‍රගතිය මෙන්ම, අනෙකුත් සියළුම පරිපාලන කරුනු පිලිබඳව සාකච්ඡා කරනු ලබන අතර, මේ සඳහා දිස්ත්‍රික් 25 නියෝජනය කරමින් දිස්ත්‍රික් අධ්‍යක්ෂවරුන්, නියෝජ්‍ය/සහකාර අධ්‍යක්ෂවරුන් හා ප්‍රධාන කාර්යාලයේ අංශ ප්‍රධානීන් සහභාගී වේ. මේ යටතේ, 2021 වර්ෂය සඳහා ප්‍රගති සමාලෝචන රැස්වීම් 06 ක් පවත්වා ඇති අතර, වියදම් කළ මුදල රු.මි.0.10 කි.

(II) දිස්ත්‍රික් මට්ටමින් ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම.

සෑම මාසයකම දිස්ත්‍රික් කාර්යාලවල දිස්ත්‍රික් අධ්‍යක්ෂකගේ ප්‍රධානත්වයෙන් පැවැත්වෙන ප්‍රගති සමාලෝචන රැස්වීම් මූලස්ථාන කළමණාකරුවන්ගේ සහභාගීත්වයෙන් සිදු කෙරේ. දිස්ත්‍රික්කයේ සෑම ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයකම ප්‍රගතිය සාකච්ඡා කිරීම මෙහි දී සිදු වේ. 2021 වර්ෂය සඳහා රැස්වීම් 175 ක් පවත්වා ඇති අතර, වියදම් කල මුදල රු.මි.2.45 කි.

(III) ප්‍රාදේශිය මට්ටමින් ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම.

සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකම මාසිකව ප්‍රාදේශීය ලේකම්ගේ ප්‍රධානත්වයෙන් සමෘද්ධි වැඩසටහන්වල වසම් මට්ටමේ ප්‍රගතිය පිළිබඳවත් ගැටළු පිළිබඳවත් සාකච්ඡා කිරීම මෙහිදී සිදු කෙරේ. මේ සඳහා සෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකම සිටින සමෘද්ධි මූලස්ථාන කළමණාකරුවන්, විෂය භාර කළමණාකරුවන්, බැංකු කළමණාකරුවන් හා අදාල අනෙකුත් නිලධාරීන් සහභාගී වේ. මේ යටතේ, 2021 වර්ෂය සඳහා රැස්වීම් 1,986 ක් පවත්වා ඇති අතර, වියදම් කල මුදල රු.මි.2.98 කි.

(IV) වාර්ෂික කාර්ය සාධන වාර්තාව සකස් කිරීම.

පෙර වර්ෂයට අදාලව ඒ ඒ අංශ මගින් ක්‍රියාත්මක කරන ලද දෙපාර්තමේන්තුවේ සමස්ථ කාර්ය සාධනය පදනම් කරගෙන වාර්ෂික කාර්යසාධන වාර්තාව සකස් කරනු ලැබේ. එය පොතක් වශයෙන් සකස් කර සෑම වසරකම අමාත්‍යාංශය හරහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම සිදු කෙරේ. මේ යටතේ 2020 වර්ෂය සඳහා දෙපාර්තමේන්තුවේ කාර්යසාධන වාර්තාව සකස් කර, ඉන් පිටපත් 375 ක් ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන ලදී.

2.2 දෙපාර්තමේන්තුවේ ඉදිරි ඉලක්ක

1. 2022 වර්ෂයේ සිට සමෘද්ධි සහනාධාර ලබන පවුල් 1,767, 236 සඳහා දැනට ගෙවනු ලබන මාසික සමෘද්ධි සහනාධාර මුදල් පහත පරිදි වැඩිකර ගෙවීමට කටයුතු කිරීම.

    - රු.3,500.00 දීමනාවරු.4,500.00 දක්වා වැඩිකිරීම
    - රු.2,500.00 දීමනාවරු.3,200.00 දක්වා වැඩිකිරීම
    - රු.1,500.00 දීමනාවරු.1,900.00 දක්වා වැඩිකිරීම
    - රු.420.00 දීමනාව එලෙසම ලබාදීම

2. සමෘද්ධි සහනාධාර වැඩසටහන තුල සිටින ඉහල ආර්ථික මට්ටමක් ලඟාකරගෙන ඇති පවුල් හඳුනාගෙන ඔවුන් "රන්පත්ලාභීන්"ලෙස ඇගයීමට ලක්කර, සහනාධාර මානසිකත්වයෙන් මුදවා ගැනීමට කටයුතු කිරීම.
3. ඉහතින් සඳහන් **"රන්පත්ලාභී"**පවුල් සඳහා ක්ෂුද්‍ර මූල්‍ය ණය පහසුකම්, නිවාස ආධාර හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ දිගටම ලබාදීමට කටයුතු කිරීම.
4. සමෘද්ධි බැංකු ජාලය තව දුරටත් ප්‍රාදේශීය මට්ටමට ව්‍යාප්ත කිරීම සඳහා සමෘද්ධි බැංකු ශාඛා ගණන 1,100 දක්වා වැඩි කිරීමට කටයුතු කිරීම.
5. සියළුම සමෘද්ධි බැංකු ස්වාධීන බැංකු ඒකක බවට පරිවර්ථනය කිරීමට කටයුතු කිරීම.

6. 2022 අයවැය මඟින් යෝජනා කර ඇති පරිදි සමෘද්ධි බැංකුව One Stop Shop ආයතනික ව්‍යුහයක් බවට පත් කිරීමේ පලමු අදියර යටතේ, බැංකු සමිති මට්ටමින් One Stop Shop ආයතන ඇති කිරීමට කටයුතු කිරීම.
7. සියළුම සමෘද්ධි බැංකු ගණුදෙනු Online System හරහා සිදු කිරීමට කටයුතු කිරීම.
8. සමෘද්ධි බැංකු සඳහා ATM පහසුකම් ලබා දීමට කටයුතු කිරීම.
9. 2022 අයවැය මඟින් යෝජනා කර ඇති ප්‍රාදේශීය ජීවනෝපාය සංවර්ධන වැඩසටහන යටතේ සමෘද්ධිලාභී පවුල් 100,000 ක ආර්ථික මට්ටම ඉහල නැංවීමට කටයුතු කිරීම.
10. හරිත දැයක් ජාතික කෘෂි ගෙවතු වගා සංවර්ධන වැඩසටහන යටතේ ගෙවතු 2,200,000 ක් සඳහා සමෘද්ධිලාභී තවාන් කරුවන් හරහා තවාන් පැල (වම්බටු,මිරිස්,තක්කාලි,මාළු මිරිස් හා වැරණිය මිරිස්) ලබා දීමට කටයුතු කිරීම.
11. වසමකින් එක් අයකු බැගින් වන පරිදි කාබනික පොහොර නිෂ්පාදකයින් 14,000ක් ඇති කිරීමට කටයුතු කිරීම.
12. උතුරු පළාතේ සිටින සමෘද්ධිලාභී පවුල් 172,942 ගේ ජීවන තත්ත්වය ඉහල නැංවීම සඳහා සමීක්ෂණයක් මගින් අවශ්‍යතා හඳුනා ගැනීමට කටයුතු කිරීම.
13. සමෘද්ධි අලෙවි ජාලය පුළුල් කිරීම.
14. සමෘද්ධි නිෂ්පාදකයින්ගේ අළෙවි පහසුකම් පුළුල් කිරීම සඳහා සුව බොජුන්හල් 10 ක් ඉදි කිරීම.
15. "දිරිය පියස" නිවාස වැඩසටහන යටතේ නිවාස 79ක් ඉදි කිරීම.
16. සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කිරීම යටතේ වැසිකිළි නොමැති පවුල් සඳහා වැසිකිළි 41,666 ක් ඉදි කිරීම සඳහා මූල්‍යාධාර ලබාදීම.
17. ක්ෂුද්‍ර මූල්‍ය ණය වැඩසටහන යටතේ සමෘද්ධිලාභීන් 346,615 කට සමෘද්ධි බැංකු හරහා ක්ෂුද්‍රමූල්‍ය ණය පහසුකම් ලබා දීමට කටයුතු කිරීම.
18. සමෘද්ධි නිවාස ලොතරැයි වැඩසටහන යටතේ සමෘද්ධි හා අඩු ආදායම්ලාභී පවුල් 6,155 ට නිවාස ආධාර ලබා දීම.
19. සිප්දොර ශිෂ්‍යත්ව වැඩසටහන යටතේ උසස්පෙල හදාරණ සමෘද්ධිලාභී පවුල්වල දරුවන් 314,039 ක් සඳහා ශිෂ්‍යත්ව ආධාර ලබා දීම.
20. සමාජ ආරක්ෂණ වැඩසටහන යටතේ සමෘද්ධිලාභීන් 164,360ක් සඳහා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ ලබා දීමට කටයුතු කිරීම.



ආර්.පී.බී.තිලකසිරි
අධ්‍යක්ෂ ජනරාල්
සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව

පරිච්ඡේදය-03 -2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වනසමස්ත මූල්‍ය කාර්යසාධනය

1.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

අයවැය 2021		සටහන	කත්‍ය 2021	නැවත ගලපන ලද 2020	
රු.			රු.	රු.	
-	**ආදායම් ලැබීම්**		-	-	
-	ආදායම් බදු	1	-	-	
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-	-	ඒසිඒ-1
-	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	3	-	-	
-	බදු නොවන ආදායම් හා වෙනත්	4	-	-	
-	**මුළු ආදායම් ලැබීම් (අ)**		-	-	
-	**ආදායම් නොවන ලැබීම්**		-	-	
78,714,274,286	භාණ්ඩාගාර අග්‍රිම		78,714,274,286	83,191,806,000	ඒසිඒ-3
12,989,691,125	තැන්පතු		12,989,691,125	39,120,393,893	ඒසිඒ-4
215,973,409	අත්තිකාරම් ගිණුම්		215,973,409	48,124,268	ඒසිඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්		-	-	
91,919,938,820	**මුළු ආදායම් නොවන ලැබීම් (ආ)**		**91,919,938,820**	**122,360,324,161**	
-	**මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)**		**91,919,938,820**	122,360,324,161	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඈ)		316,134,657	380,538.	
	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඈ)		91,603,804,163	**122,359,943,623**	
	අඩු කළා : වියදම්				
-	**පුනරාවර්තන වියදම්**		-	-	
17,019,000,000	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	15,467,985,544	14,441,127,717	ඒසිඒ-2(ii)

402,048,800.00	අනෙකුත් භාණ්ඩ හා සේවා	**6**	376,433,426	276,018,405	
65,186,121,200	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	**7**	63,081,203,584	65,223,308,276	**ඒසිඒ-2(ii)**
-	පොළී ගෙවීම්	**8**	-	-	
-	වෙනත් පුනරාවර්තන වියදම්	**9**	-	-	
82,607,170,000	**මුළු පුනරාවර්තන වියදම් (ඊ)**		**78,925,622,554**	**79,940,454,398**	
	මූලධන වියදම්				
3,100,000	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්	**10**	2,124,153	2,553,361	
2,800,000	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	**11**	2,779,460	2,426,871	
-	ප්‍රාග්ධන මාරුකිරීම්	**12**		-	**ඒසිඒ-2(ii)**
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම	**13**		-	
7,000,000	හැකියා වර්ධනය	**14**	5,977,172	806,455	
600,000,000	වෙනත් මූලධන වියදම්	**15**	504,591,582	156,128,629	
612,900,000	**මුළු මූලධන වියදම් (උ)**		**515,472,367**	**161,915,316**	
	තැන්පතු ගෙවීම්		12,714,847,116	38,966,919,946	**ඒසිඒ-4**
	අත්තිකාරම් ගෙවීම්		215,773,203	46,749,209	**ඒසිඒ-5**
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්		-	-	
	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)		**12,930,620,319**	**39,013,669,155**	
	මුළු වියදම් එ = (ඊ+උ+ඌ)		92,371,715,240	119,116,038,869	
-	**දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ=(ඉ-එ)**		**(767,911,077)**	**3,243,904,754**	
	අග්‍රිම සැසඳුම් ප්‍රකාශය අනුව ශේෂය		(767,911,077)	3,243,904,754	**ඒසිඒ-7**
	දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය		116,134,657	380,538	**ඒසිඒ-3**
			(651,776,420)	3,244,285,292	

3.3 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

එසිඒ-පී

2021 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

	සටහන	තක්සා 2021 රු.	2020 රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියක හා උපකරණ	එසිඒ-6	1,446,929,717	1,314,952,921
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	එසිඒ-5/5(ඒ)	47,456,219	47,656,425
මුදල් හා මුදල් සමාන දෑ	එසිඒ-3		
මුළු වත්කම්		**1,494,385,935**	**1,362,609,346**
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්		(2,793,663,071)	(2,518,618,856)
දේපළ පිරියක හා උපකරණ සංචිතය		1,446,929,717	1,314,952,921
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	එසිඒ-5(බී)	-	
ප්‍රංගම වගකීම්			
නැන්පතු ගිණුම්	එසිඒ-4	2,841,119,290	2,566,275,281
අග්‍රිම ශේෂය	එසිඒ-3		
මුළු වගකීම්		**1,494,385,935**	**1,362,609,346**

පිටු අංක 1 සිට 32 දක්වා එසිඒ 1 සිට එසිඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් පිටු අංක 33 සිට 41 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මගින් හෙළදිරවී කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිත කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

.....	.....	.....
ප්‍රධාන ගණන්දීමේ නිලධාරි	ගණන්දීමේ නිලධාරි	ප්‍රධාන නිලධාරි
නම : නීල් බණ්ඩාර හපුහිත්න	නම : ආර්.පී.බී.තිලකසිරි	නම : කේ.ආර්.කුමාරදාස
තනතුර : ලේකම්	තනතුර : අධ්‍යක්ෂ ජනරාල්	
දිනය : 2022.02.28	දිනය :2022.02.28	දිනය : 2022.02.

නීල් බණ්ඩාර හපුහිත්න
ලේකම්
සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා හා ධීවර ශාඛාවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය
1 වන මහල "සෙත්සිරිපාය". - II අදියර, බත්තරමුල්ල.

R. P. B. Thilakasiri
Director General
Department of Samurdhi Development
4th Floor, "Sethsiripaya" Stage 1
Battaramulla.

K.R. Kumaradasa
Chief Accountant
Department of Samurdhi Development
1st Step, 4th Floor, "Sethsiripaya"
Battaramulla.

3.4 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	තක්සා	
	2021 රු.	නැවත ගලපන ලද 2020 රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
මුළු බදු ලැබීම්	-	-
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	-	
වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්	849,936,347	741,844,910
අග්‍රිම ලැබීම්	78,714,274,286	83,191,806,000
අත්තිකාරම් අයකර ගැනීම්	216,687,068	48,124,268
තැන්පතු ලැබීම්	12,989,691,125	39,120,393,893
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	**92,770,588,825**	**123,102,169,071**
අඩුකළා : මුදල් වැය කිරීම්		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	15,841,482,225	14,708,432,237
සහනාධාර සහ මාරුකිරීම්	63,081,203,584	64,260,119,151
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	85,517,520	5,000,281,664
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	316,134,657	380,538
අත්තිකාරම් ගෙවීම්	215,931,357	43,407,148
තැන්පතු ගෙවීම්	12,714,847,116	38,966,919,946
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	**92,255,116,458**	**122,979,540,684**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ) = (අ) - (ආ)	**515,472,367**	**122,628,387**

ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී		-
ලාභාංශ		-
හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම		-
උපණය අයකර ගැනීම්		-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඇ)		-
අඩුකළා : මුදල් වැය කිරීම්		
භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම්	515,472,367	122,628,387
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	**515,472,367**	**122,628,387**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඇ)-(ඉ)	**(515,472,367)**	**(122,628,387)**
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	**(0)**	**0**
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)		-
අඩුකළා : මුදල් වැය කිරීම්		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	**-**	**-**
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	**-**	**-**
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)	**(0)**	**0**
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	**-**	**-**
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	**-**	**-**

3.5 මූල්‍ය ප්‍රකාශ සටහන්

3.6. ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය

ආදායම් ක්ෂේත්‍රය	ආදායම් ක්ෂේත්‍රයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම	
		මුල් ඇස්තමේන්තුව	අවසන් ඇස්තමේන්තුව	ප්‍රමාණය	අවසන් ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස
	අදාල නොවේ				

3.7. වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		තක්ෂ වියදම (රු.මි.)	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුල් ප්‍රතිපාදනය (රු.මි.)	අවසාන ප්‍රතිපාදනය (රු.මි.)		
පුනරාවර්තන	82,607,170	82,607,170	78,925,623	96
ප්‍රාග්ධන	612,900	612,900	515,472	84

3.8.මු.රෙ.208 ප්‍රකාරව වෙනත් අමාත්‍යාංශ / දෙපාර්තමේන්තුවල නියෝජිතයකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට /දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රධානය කරන ලද ප්‍රතිපාදන

අ. අං	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව	ප්‍රතිපාදනයේ අරමුණ	ප්‍රතිපාදන		තක්ෂ වියදම (රු.මි.)	උපයෝගී කර ගන්නාලද ප්‍රතිපාදන,ලබාදුන් අවසාන ප්‍රතිපාදන වල% ලෙස
			මුල් ප්‍රතිපාදන (රු.මි.)	අවසාන ප්‍රතිපාදන (රු.මි.)		
01	රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය	අභ්‍යාසලාභී උපාධිධාරීන්ගේ දීමනා ගෙවීම	0.16	0.16	0.13	81
02	ජාතික අයවැය දෙපාර්තමේන්තුව	ගැබිණි මාතාවන්ට පෝෂණ සහනාධාර ගෙවීම - ලෝක ආහාර වැඩසටහන	15,460	15,460	15,170	98
03	විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව	මියගිය සමෘද්ධි සංවර්ධන නිලධාරීන්ගේ පාරිතෝෂික නිරවුල් කිරීම	28,067	28,067	28,067	100

අ. අං	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය /දෙපාර්තමේන්තුව	ප්‍රතිපාදනයේ අරමුණ	ප්‍රතිපාදන		තක්සේරු වියදම (රු.මි.)	උපයෝගී කර ගන්නාලද ප්‍රතිපාදන, ලබාදුන් අවසාන ප්‍රතිපාදන වල% ලෙස
			මුල් ප්‍රතිපාදන (රු.මි.)	අවසාන ප්‍රතිපාදන (රු.මි.)		
04	බහු කාර්ය සංවර්ධන දෙපාර්තමේන්තුව	මාතර පුහුණු මධ්‍යස්ථානයේ විදුලි වියදම් දැරීම	0.03	0.03	0.03	100
05	සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා සහ ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය	පවුල් ලක්ෂ 02ක් සවිබල ගැන්වීම	49,582	49,582	42,117	85

3.9. මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය

වත්කම් කේතය	කේත විස්තරය	2021.12.31දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	2021.12.31 දිනට භාණ්ඩ මූල්‍ය තත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේදී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලි හා ව්‍යුහයන්	368,610	368,610	-	100
9152	යන්ත්‍රෝපකරණ	845,286	845,286	-	100
9153	ඉඩම්	233,033	233,033	23,336	100
9154	අස්පෘශ්‍ය වත්කම්	-	-	-	-
9155	ජීව විද්‍යාත්මක වත්කම්	-	-	-	-
9160	කෙරීගෙන යන වැඩ	-	-	-	-
9180	බදු දෙන ලද වත්කම්	-	-	-	-

3.10 විගණකාධිපතිවරයාගේ වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

LSW/A/SDD/27/21/FS 2022 ජූනි 08 දින

ගණන්දීමේ නිලධාරී
සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව

සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශය 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2021 දෙසැම්බර් 31 දිනට සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදය දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම්, විගණකගේ වගකීම් යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම් මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම් ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- මෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ මෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට ,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනයේ භාණ්ඩාගාර අශ්‍රිම ශේෂය රු. 78,714,274,286 ක් වුවද, භාණ්ඩාගාර ශේෂ පිරික්සුම් අනුව එය රු. 78,714,283,000 ක් විය.

(ආ) 2021 දෙසැම්බර් 31 දින භාණ්ඩාගාරයට ප්‍රේෂණය කරන ලද රු. 116,134,657 ක මූදල මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනයේ දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය ලෙස දක්වා තිබුණි.

1.6.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

1.6.2.1 මූල්‍ය නොවන වත්කම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල ACA-6 ආකෘතියෙහි දක්වා තිබූ නිල නිවාස වටිනාකම රු. 3,751,000 ක් හා සංචාරක බංගලා වටිනාකම රු. 17,900,000 ක ශේෂ 2021 ජනවාරි 01 දිනට ඉදිරියට ගෙන ඒමේදී නිවාස නොවන කාර්යාල ගොඩනැගිලි වටිනාකම වන රු. 319,764,000 ක ශේෂයට එකතු කර දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ මිලදී ගන්නා ලද රු. 70,000 ක් වටිනා රූපවාහිනී යන්ත්‍රය සහ රු. 930,000 ක් වටිනා කැමරා සහ උපාංග යන වත්කම් මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයෙහි ඇතුළත් කර නොතිබුණි.

1.6.2.2 කැන්පතු ගිණුම් ශේෂ

තෙවන පාර්ශවයන් වෙත ගෙවීම් සඳහා තාවකාලිකව රඳවාගන්නා කැන්පතු ගිණුමේ දෙසැම්බර් 31 දිනට රු. 2,798,770,935 ක් වූ ශේෂය තුළ වර්ෂ 8ක සිට වර්ෂ 10 ක් අතර කාලයක් පැරණි රු. 2,374,500,000 ක කැන්පතු ශේෂයක් විය.

1.6.2.3 නොසැසඳුනු පාලන ගිනුම්

මූල්‍ය ප්‍රකාශන අනුව කැන්පත් ගිණුම් 5 ක එකතුව රු. 2,841,119,289 ක් වූ අතර උපලේඛන අනුව එය රු. 2,818,748,994 ක් වූයෙන් රු. 22,370,295 ක වෙනසක් විය.

1.6.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

පොදු කැන්පත් ගිණුම් අංක 6000-0-0-20-19 වියදම් ප්‍රතිපූරනය කිරීම සඳහා අරමුදල් ලැබීම රු. 1,098,324 කට අදාළ උපලේඛන විගණනය සඳහා ඉදිරිපත් නොකෙරුණි.

1.6.3 ලේඛන හා පොත්පත් පවත්වා නොගැනීම

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.

ලේඛන වර්ගය	අදාළ රෙගුලාසිය	නිරීක්ෂණය
(අ) රජයේ නිලධාරීන්ගේ ඇප ලේඛනය	ර.නි. ඇප ආඥා පනත 612 (4) වගන්තිය	ලේඛනයක් පවත්වා නොතිබුණි.
(ආ) භාණ්ඩ පාඩු ලේඛනය	මූදල් රෙගුලාසි 110 හා 104	යාවත් කාලීන කර නොතිබුණි.
(ඇ) වාහන ලයිස්තු ගත කිරීමේ ලේඛනය	මූදල් රෙගුලාසි 1647(ඉ)	ලේඛනයක් පවත්වා නොතිබුණි.

2. මූල්‍ය සමාලෝචනය

2.1 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2020 අංක 07 දරන විසර්ජන පනතේ 6 වැනි වගන්තිය අනුව පරිපූරක ඇස්තමේන්තු ප්‍රතිපාදන වෙන් කිරීමේදී ඒවා සම්පූර්ණයෙන්ම උපයෝජනය කරගත යුතු බව දක්වා තිබුණද 331-2-2-1-1501 සුභසාධන වැය විෂය සඳහා 2021 ජූලි 29 දින ලබාගත් පරිපූරක මූදල රු. 4,500,870,000 ක්ද මූල් ඇස්තමේන්තුගත මූදල් වන රු. 53,000,000,000 ක්ද ඇතුළුව ශුද්ධ එකතුව රු. 57,500,870,000 කින් රු. 55,400,092,366 වියදම් වූ පසු රු. 2,100,777,634 ක් ඉතිරි වී තිබුණි.

(ආ) 2020 අංක 7 දරන විසර්ජන පනතේ 5 (1) හා 5 (2) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු මු.රෙ 66 හා 69 ප්‍රකාරව විරමණ පරිපාටිය අනුගමනය කර ප්‍රතිපාදන ලබා ගෙන තිබුණද වර්ෂය අවසාන වන විට එම මූදල් වැයකර නොතිබූ අවස්ථා 5 කට අදාලව රු. 7,824,698 ක ඉතිරිවීම් තිබූ අතර ඒ සම්බන්ධයෙන් ඉදිරිපත් කර තිබූ හේතු ද විගණනයේදී පිළිගත නොහැකි විය.

(ඇ) වැය විෂයන් 29 ක එකතුව රු. 5,950,096,700 ක ශුද්ධ ප්‍රතිපාදනයෙන් වර්ෂයේ වියදම රු.4,466,687,414 ක් වූ අතර රු. 1,483,429,286 ක් උපයෝජනය කිරීමකින් තොරව ඉතිරි වී තිබුණි.

2.2 බැරකම් හා බැඳීම්වලට එළඹීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) දෙපාර්තමේන්තුව විසින් අවස්ථා 9 කදී ලබාගත්, විවිධ සේවාවන් හා සැපයුම්වලට අදාළව ගෙවියයුතු රු. 183,098 ක වටිනාකම බැරකම් ප්‍රකාශනයට ඇතුළත් කර නොතිබුණි. තවද විවිධ සේවාවන් වෙනුවෙන් වෙන්කරන ලද බැරකම් 4 කට අදාළව රු. 344,507 ක් අඩුවෙන් බැරකම්වල දක්වා තිබුණි.

(ආ) දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කර තිබූ බැරකම් ලේඛනය හා මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බැරකම් අතර වැය විෂය දෙකකට අදාළව රු. 320,619 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඇ) 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය සහ 2017 අප්‍රේල් 27 දිනැති අංක 255/2017 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ ප්‍රකාරව මුදල් වර්ෂයට අදාළ සියලුම බැරකම් ඊලඟ වර්ෂයට ගෙන නොයා එම මුදල් වර්ෂයේදීම ගෙවා නිදහස් කළ යුතු අතර, කිසිදු බැරකමක් ඊලඟ වර්ෂය තුළ නිරවුල් කිරීමේ අරමුණ ඇතිව ඉදිරියට ගෙන නොයා යුතු බවත්, එම උපදෙස්වලට පටහැනිව ඇති කරගන්නා බැරකම් නිරවුල් කිරීම සඳහා භාණ්ඩාගාරය තවදුරටත් කටයුතු කරනු නොලබන බවටත් උපදෙස් දී තිබියදී වැය විෂයයන් 8 ක ඉතිරි කිරීම් එකතුව රු. 99,432,128 ක් ඉක්මවා රු. 182,849,545 ක බැරකම් ඇති කරගෙන තිබුණි.

2.3 ගණන්දීමේ නිලධාරී විසින් සිදුකළ යුතු සහතික වීම

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතිකවීම් කළයුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(අ) විගණකාධිපතිවරයාට අවශ්‍යවන පරිදි නිශ්චිත කාල සීමාවක් තුළ සියළුම විගණන විමසුම්වලට පිළිතුරු සැපයීම සිදුවන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී විසින් සහතික විය යුතු වුවත් වාර්තාවේ 3.8 ඡේදය ප්‍රකාරව විගණන විමසුම්වලට පිළිතුරු ලබා දී නොතිබුණි.

2.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම.

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

නීති, රීති හා රෙගුලාසිවලට යොමුව	අනුකූල නොවීම
(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මූදල් රෙගුලාසි	
(i) මූදල් රෙගුලාසි 135 හා 381 (i)	පුහුණු මධ්‍යස්ථානවල සියළුම කාර්යයන් මූල්‍ය පාලන බලතල පවරා දීමකින් තොරව අනුයුක්ත කාර්ය මණ්ඩලය විසින් සිදු කර තිබූ අතර පුහුණු මධ්‍යස්ථාන 03 ක භාණ්ඩාගාර අනුමැතියෙන් තොරව බැංකු ජංගම ගිණුම් පවත්වා ගෙනගොස් තිබුණි.
(ii) මූදල් රෙගුලාසි 189 සහ 486	2021 දෙසැම්බර් මස බැංකු සැසඳීම් ප්‍රකාශනය අනුව මාස 11 ක සිට වසර 4 ක් දක්වා කාල පරාසයක් ඇතුළත තැන්පත් කළ නමුත් උපලබ්ධි නොවූ චෙක්පත් 22 කට අදාළව එකතුව රු. 2,887,765 ක් සම්බන්ධයෙන් මූදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.
(iii) මූදල් රෙගුලාසි 396	2021 දෙසැම්බර් 31 දිනට නිකුත් කර මාස 6 ඉක්ම වූ එකතුව රු. 164,300 ක් වූ චෙක්පත් 12 ක් සම්බන්ධව රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.
(iv) මූදල් රෙගුලාසි 756,757 සහ 1647 (ආ) හා 1994 අගෝස්තු 3 දිනැති අංක 26/92(1) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය	වාහන 146 ක් සම්බන්ධයෙන් භෞතික සමීක්ෂණයක් සිදුකිරීමට කටයුතු කර නොතිබුණි.
(ආ) 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මූදල් චක්‍රලේඛය	චක්‍රලේඛයේ උපදෙස් පරිදි අනුමත තනතුරු සඳහා දෙපාර්තමේන්තුවේ සංවිධාන ව්‍යුහය සකස් කර අනුමත කරවා ගෙන නොතිබුණි.
(ඇ) 2018 ජනවාරි 24 දිනැති 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය	චක්‍රලේඛය ප්‍රකාරව මානව සම්පත් සැලැස්මක් සකස් කර නොතිබූ අතර, සමස්ථ කාර්යමණ්ඩලය සඳහා කාර්ය මණ්ඩල ගිවිසුම් සකස්කර නොතිබුණි.

(ඇ) 2020 අගෝස්තු18 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ 01/2020 දරන චක්‍රලේඛයේ 15 ඡේදය

අරමුදල් ලෙස ස්ථාපිත කර ඇති දිවිනැඟුම් අරමුදල, සමාජ ආරක්ෂණ භාර අරමුදල, නිවාස සංවර්ධන ලොතරැයි අරමුදල, බැංකු සංගම් ලිපි ද්‍රව්‍ය වක්‍රීය අරමුදල හා සේවක ණය වක්‍රීය අරමුදල පවත්වා ගෙනයාමේ අවශ්‍යතාවය සලකා බලා ඒවා ව්‍යවස්ථාපිත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) මුදල් අමාත්‍යාංශයේ 2020 ඔක්තෝබර් 02 දිනැති අංක 05/2020 වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 13.2 ඡේදය මාර්ගෝපදේශ අංක 3

ධාවන තත්ත්වයේ නොපවතින වාහන අපහරණය කිරීම හෝ අලුත්වැඩියා කර භාවිතයට ගැනීම පිළිබඳව සහ මාර්ගෝපදේශ විධිවිධාන ප්‍රකාරව අපහරණ ක්‍රියාවලිය සිදුකළ යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොමැති වාහන 29 ක් විය.

2.5 අත්තිකාරම් නිකුත් කිරීම හා පියවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ජාතික අයවැය අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක BD/AA/LR/01/2022 දරන 2021 දෙසැම්බර් 31 දිනැති ලිපිය මඟින් අත්තිකාරම් ගිණුමේ සීමා සංශෝධනයට මුදල් අමාත්‍යවරයා වෙත නිර්දේශ ඉදිරිපත් කර තිබුණු නමුත් 2022 අප්‍රේල් 08 වගඋත්තර දිනය වන විටත් ඒ සඳහා අනුමැතිය ලැබී නොතිබුණි.

(ආ) ස්ථාන මාරුවීම් , මියයෑම, වැඩ තහනම් කිරීම සහ සේවය හැරගිය සේවකයින් 147 දෙනෙකුගෙන් 2021 දෙසැම්බර් 31 දිනට වසර 01 සිට වසර 05 ඉක්මවූ හිඟ හිටි ණය ශේෂය රු. 2,188,931 ක් විය. මෙම ණය ශේෂය තුළ වසර 05 ඉක්ම වූ ශේෂය රු. 657,719 ක් ද වසර 4 ත් 5 ත් අතර හිඟ හිටි ශේෂය රු. 648,198 ක් ද වසර 3-4 අතර හිඟ හිටි ණය ශේෂය රු. 407,269 ක් ද වසර 1-3 අතර හිඟහිටි ශේෂය රු. 307,780 ක් වශයෙන් පැවතුණි.

(ඇ) අමාත්‍යාංශය හා දෙපාර්තමේන්තුවලට ස්ථාන මාරු වී ගිය නිලධාරීන්ගෙන් අයවිය යුතු ණය ශේෂය තුළ බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට රු. 34,360 ක ගෙවිය යුතු ශේෂයක් ඇතුළත්ව තිබූ අතර එය වසර 2-3 ත් අතර කාලයක් ගත වී ඇතත් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) සේවයේ නියුතු නිලධාරීන් 11 දෙනෙකුගෙන් සමාලෝචිත වර්ෂය සඳහා අයවිය යුතු ආපදා හා ගංවතුර ණය ශේෂය රු. 672,348 ක් අයකර ගැනීමට කටයුතුකර නොතිබුණි.

(ඉ) සමෘද්ධි අධිකාරිය පැවති කාලයේදී නිලධාරීන්ට ණය ලබා දෙනු ලැබූ සේවක ණය චක්‍රීය අරමුදල අබණ්ඩව පවත්වාගෙනයාම සම්බන්ධයෙන් භාණ්ඩාගාරයේ උපදෙස් ලබා ගැනීමකින් තොරව රජයේ නිලධාරීන්ට අත්තිකාරම් නිකුත් කිරීම යටතේ 2020 වර්ෂයේදී නිලධාරීන් 302 දෙනෙකු සඳහා රු. 66,257,360 ක ආපදා ණය ලබා දී තිබුණි. මේ ආකාරයට සේවක ණය චක්‍රීය අරමුදලින් අබණ්ඩව ණය ලබා දෙනු ලැබුවද, ඒ සඳහා 2014 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා වර්ෂ 8 ක මූල්‍ය ප්‍රකාශන සකස් කර විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. 2021 වර්ෂය වන විට චක්‍රීය අරමුදල මඟින් ණය ගෙවීම් නතර කර තිබූ අතර සේවක ණය චක්‍රීය අරමුදලේ 2022 වර්ෂයේ මාර්තු මස බැංකු ප්‍රකාශනය අනුව රු. 94,216,546 ක වාසි සහගත ශේෂයක් ජංගම ගිණුමේ පැවතුණි.

(ඊ) සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුගත නිලධාරීන් සඳහා පමණක් ලබාදෙන බැංකු මූල්‍ය අංශයේ විශේෂ සේවක ණය හා සමෘද්ධි බැංකු වලින් ලබාදෙනු ලබන සමෘද්ධි බැංකු විශේෂ ණය, ලබාදීමේදී වෙනත් සේවාවන් වලින් දෙපාර්තමේන්තුවට ස්ථාන මාරුවී පැමිණි නිලධාරීන් සඳහා අවස්ථා 4 ක දී රු. 2,850,836 ක ණය ලබාදී තිබූ අතර එම ණය මුදල් දෙපාර්තමේන්තු සේවයෙන් ඉවත්ව යන අවස්ථාවලදී අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.6 නැන්පතු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පුහුණු මධ්‍යස්ථානවලින් රැස්කල ආදායම් රජයේ ආදායමට බැර කිරීමට කටයුතු නොකර එමඟින් වියදම් දැරීමෙන් අනතුරුව, ඉතිරි වූ මුදල් රු. 2,380,951ක් පොදු නැන්පත් ගිණුමේ රඳවා ගැනීමට කටයුතු කර තිබුණි.

(ආ) ක්ෂුද්‍ර මූල්‍ය බැංකු අංශය මඟින් 2020/2021 වර්ෂවල කොවිඩ් සහනාධාර ලබාදීම් සඳහා දිස්ත්‍රික් සමෘද්ධි කාර්යාලවලට ලබා දී තිබූ මුදලින් ඉතිරි වී ආපසු එවා තිබූ රු. 231,162,935 ක් එම අංශයට නිරවුල් කිරීමට කටයුතු නොකර පොදු නැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණි.

(ඇ) 2019 මැයි සිට 2021 ජූනි දක්වා කාලය තුළ නිකුත් කල නමුත් ගෙවීමට ඉදිරිපත් නොවූ එකතුව රු. 1,374,632 ක් වූ කල් ඉකුත් වූ චෙක්පත් 105 ක් මුදල් රෙගුලාසි 396 (අ) ප්‍රකාරව නිරවුල් කිරීම කටයුතු නොකර, පොදු නැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණි.

(ඈ) 2020 දෙසැම්බර් 31 සිට 2021 ඔක්තොම්බර් 27 දක්වා කාලය තුළ අවස්ථා 212 කදී දෙපාර්තමේන්තු නිල බැංකු ගිණුමට බැර වී තිබූ රු. 112,334,568 ක් මූල්‍ය ප්‍රභවය හඳුනාගැනීමට නොහැකිව පොදු නැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණි.

(ඉ) හම්බන්තොට දිස්ත්‍රික් කාර්යාලයට විවිධ කාර්යයන් සඳහා ලබාදුන් මුදලින් ඉතිරි වී ආපසු එවා තිබූ රු. 452.688 ක් රාජ්‍ය ආදායමට බැර කිරීමට කටයුතු නොකර පොදු නැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණි.

2.7 බැංකු ගිණුම් මෙහෙයවීම

දෙසැම්බර් මස බැංකු සැසඳුම් තුළ හඳුනා නොගත් කැන්පතු රු. 25,971,852 ක් සහ උපලබ්ධි නොවූ කැන්පතු රු. 85,131,426 ක් ඇතුළත්ව පැවති අතර 2022 පෙබරවාරි මස වන විට රු. 4,477,765 ක ශේෂයක් මාස 2 සිට වසර 4 ක කාලයක් ගත වී ඇතත් උපලබ්ධිවී නොතිබුණි.

2.8 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

සමෘද්ධි ප්‍රතිලාභීන් වෙත ගෙවනු ලබන සහනාධාර මුදලින් යම් දායකත්වයක් ගෙන විවිධ අරමුණු ඉටුකර ගැනීම සඳහා ඇතිකර ගත් අරමුදල් සහ අනිවාර්ය ඉතුරුම් ලෙස රඳවාගනු ලබන සමෘද්ධි බැංකු සතු අරමුදල් මහා භාණ්ඩාගාරයේ එකභතාවය මත 2004 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා අවස්ථා 6 කදී එකතුව රු. 47,653,794,136 ක් රජයේ විවිධ කටයුතු වෙනුවෙන් ලබාගෙන තිබූ අතර මේ වන තෙක් එම මුදල් අදාල සමෘද්ධි බැංකු හා අරමුදල් වෙත ආපසු ගෙවා නොතිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්ය සාධනය

3.1.1 දැක්ම හා මෙහෙවර

දුප්පත්කම නැති කිරීම මූලික අරමුණු කොට ගෙන පවුල ඒකකය පදනම් කරගත් සංවර්ධන ව්‍යාපෘති උපයෝගි කරගනිමින්, ආදායම් හා සමාජීය තත්ත්වයන් නගා සිටුවීමෙන් දුප්පත්කම පිටුදැකීමත්, තරුණ තරුණියන් රටෙහි සංවර්ධන ක්‍රියාදාමයට හා පරිපාලනයට සාපූර්වම දායක කරගැනීමටත් සමෘද්ධි ව්‍යාපාරය ආරම්භ කර තිබුණි. 2022 අප්‍රේල් මස වන විට මුළු සමෘද්ධි ප්‍රතිලාභීන් සංඛ්‍යාව 1,760,865 ක් වූ අතර 2013 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා වර්ෂ 09 ක කාල පරිච්ඡේදය තුළ රු. මිලියන 337,645 ක සමෘද්ධි සහනාධාර වියදම් දරා තිබුණි. දීර්ඝ කාලයක සිට ක්‍රියාත්මක කරනු ලබන සමෘද්ධි වැඩසටහන තුළින් මේ වන විට ආර්ථික හා සාමාජීය වශයෙන් ඉහළ ජීවන තත්ත්වයක් ළඟාකරගෙන ඇති ස්වශක්තියෙන් ඉදිරියට යා හැකි සවිබල ගැන්වෙන පවුල් හඳුනාගැනීම විධිමත්ව සිදු වී නොමැති බව සිදුකරනලද නියැදි පරීක්ෂාවේදී පහත කරුණු අනුව නිරීක්ෂණය විය.

(අ) 1994 සිට 2011 දක්වා වසර 13 ක නියැදි පරීක්ෂාව අනුව සමෘද්ධි ප්‍රතිලාභ හිමි වූ සමෘද්ධිලාභීන් සංඛ්‍යාව 593,169 දෙනෙක් 2022 වර්ෂය වන විට වසර 10 ත් 27 ත් අතර කාලයක් තිස්සේ සහනාධාර ලබාගනිමින් පැවතීම.

(ආ) 1994 වර්ෂයේදී ආරම්භකරන ලද සමෘද්ධි වැඩසටහන තුළ ඉහළ ආදායම් මට්ටම් කරා ළඟාවී ඇති ප්‍රතිලාභීන් ඉවත්කර නව ප්‍රතිලාභීන් ඇතුළත් කිරීම සඳහා කාලානුරූපිව ඔවුන් ලබන ආදායම් මට්ටම් පසු විපරම් කිරීමට නිසි ක්‍රමවේදයක් නොමැතිවීම.

3.1.2 කොවිඩ්- 19 වසංගත තත්ත්වයෙන් පීඩාවට පත් වූ ජනතාව සඳහා රු. 5,000 ක දීමනා ගෙවීම

ගිණුම් අංශය විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව අදියර දෙකකදී ප්‍රතිලාභීන් 4,542,865 ක් වෙනුවෙන් රු. 5,000 ක දීමනා ගෙවීමට එකතුව රු. මිලියන 22,302.85 ක වැය දැරීමට අදාළව පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) ගිණුම් අංශයෙන් ලබාගත් තොරතුරු අනුව ඉහත සඳහන් සහනාධාර ගෙවීමට අවශ්‍ය මුදල් ලබාගැනීම සම්බන්ධි ක්ෂුද්‍ර මූල්‍ය බැංකු අරමුදල, සම්බන්ධි නිවාස සංවර්ධන ලෙකරැයි අරමුදල සහ සම්බන්ධි අරමුදල යන අරමුදල් සතුව මහජන බැංකුව හා ලංකා බැංකුවේ ඇති වටිනාකම රු. 11,352,242,292 ක ස්ථාවර තැන්පතු 91 ක් ඇපයට තබා රු. බිලියන 14 ක ණය ලබාගෙන තිබුණි. ණය පියවීම සඳහා පරිපූරක ඇස්තමේන්තු මඟින් රු. 7,164,971,000 ක් ලබා දී තිබුණි. ඒ අනුව තවදුරටත් ගෙවිය යුතු ණය මුදල රු. 6,835,029,000 ක් වූ අතර මෙහිදි අයකරනු ලබන පොළි වටිනාකම ණය මුදල සම්පූර්ණයෙන්ම ගෙවන අවස්ථාවේදී ගණනය කිරීමට එකඟ වී තිබුණි.

(ආ) ණය ලබාදීමේදී ගෙවීම් කාලය මාස 6 ක් ලබා දී තිබූ අතර නැවත මාස 3 ක් දිර්ඝ කර තිබුණද ණය ගෙවීමට කටයුතු නොකර 2022 ඔක්තෝබර් දක්වා කාලය දිර්ඝ කරගෙන තිබුණි.

(ඇ) සහනාධාර ගෙවීමට දිස්ත්‍රික් කාර්යාල වෙත ලබාදුන් මුදලින් රු. 236,353,120 ක ඉතිරි මුදල් ආපසු එවා තිබුණද එම මුදල් 2021 දෙසැම්බර් 31 දින වන විටත් පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි.

(ඈ) මේ අනුව සම්බන්ධි දෙපාර්තමේන්තුවේ ක්ෂුද්‍ර මූල්‍ය බැංකු පද්ධතියෙන් ලබාගෙන ඇති මුදල් පියවීමට කටයුතු නොකිරීම පිළිබඳව අධ්‍යක්ෂ ජනරාල් විසින් ජාතික අයවැය අධ්‍යක්ෂ ජනරාල් අමතන ලද 2022 පෙබරවාරි 28 දිනැති ලිපියෙන් දන්වා තිබුණි.

3.1.3 සුවබොජුන්හල් ඉදිකිරීම

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2021 වර්ෂයේදී නව බොජුන්හල් 9 ක් ඉදිකිරීම සඳහා රු. 51.333,146 ක ප්‍රතිපාදන ලබා දී තිබූ අතර ඉන් රු. 49,154,249 ක් වැයකර බොජුන් හල් 9 ක් ඉදිකර තිබුණි. 2021 වර්ෂයේදී ඉදි කරන ලද සුවබොජුන්හල් 2022 මාර්තු මස වන විටත් විවෘත කර නොතිබුණි.

(ආ) 2016 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා කාලය තුළදී ප්‍රාදේශිය ලේකම් කාර්යාල 5 ක සුව බොජුන්හල් ඉදිකිරීම වෙනුවෙන් රු. 33,269,239 ක් ලබා දී තිබුණද ඒවායේ වැඩ නිමකර විවෘත කිරීමට මේ දක්වා කටයුතු කර නොතිබුණි.

3.1.4 ප්‍රතිලාභී කළමනාකරන මොඩියුලය (CRM) ක්‍රියාත්මක කිරීම

සමෘද්ධිලාභීන් මිලියන 1.76 ක් සඳහා සහනාධාර ගෙවීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, ප්‍රතිලාභී කළමනාකරණ මොඩියුලය (CRM) හරහා ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2021 ජනවාරි මස සිටම මොඩියුලය හරහා වාර්තා ලබා නොගෙන දිස්ත්‍රික් ලේකම් කාර්යාලවලින් එවනු ලබන උපරිම වාර්තා පදනම් කරගෙන සහනාධාර ප්‍රතිපාදන සකස්කර තිබුණි. ඒ අනුව දිස්ත්‍රික්ක 2 ක මාස 2 සිදුකරන ලද නියැදි පරීක්ෂාවට අනුව මොඩියුලය සහ උපරිම වාර්තා අතර ප්‍රතිලාභීන් 924 ක වෙනසක් පැවතුණි.

(ආ) 2022 මාර්තු 16 වගණිත දින වූ මොඩියුලය හරහා ලබාගත් යාවත්කාලීන වූ සමෘද්ධිලාභීන් සංඛ්‍යාව 1,765,819 ක් වූ අතර එදිනට මුදල් අංශයෙන් ලබාගත් වාර්තා අනුව සමෘද්ධිලාභීන් 2409 ක ශුද්ධ වෙනසක් වාර්තා දෙක අතර නිරීක්ෂණය විය. මෙම පද්ධතිය මඟින් සහනාධාර නාම ලේඛනය වෙනස්වීමට කරනු ලබන ඉවත්වීම්, නව එකතු කිරීම්, නම් හෝ වටිනාකම් සංශෝධනය, පදිංචිය වෙනස්වීම් දිනපතා යාවත්කාලීන කළ යුතු අතර සෑම මසකම පළමු රාජකාරි දින තුළ සහනාධාර මුදල් බැංකු වෙත ලබාදීම පිළිබඳ වාර්තා මොඩියුලය හරහා ලබා දිය යුතු වුවත් එසේ යාවත්කාලීනවීමක් සිදු නොවන බව 2020 සහ 2021 වර්ෂ තුල අතිරික්ත මුදල් පිළිවෙලින් රු. 37,579,986 ක් හා රු. 680,738,364 ක් ආපසු එවා තිබීමෙන් නිරීක්ෂණය විය.

(ඇ) සෑමට විදුලිය ලබාදීමේ ව්‍යාපෘතියට අදාළ දත්ත කළමනාකරණය මෙම මොඩියුලය හරහා සිදුකර තිබූ අතර මොඩියුලය තුළින් Dashboard අනුව සහ Count report වාර්තා අනුව ලබාදෙනු ලබන තොරතුරුවල නොගැලපීම් නිරීක්ෂණය විය. කවද විදුලි බල මණ්ඩලයේ තොරතුරු අනුව විදුලි සම්බන්ධතාවය ලබාදී ඇති නිවාස සංඛ්‍යාව 33,202 ක් ලෙසත් මොඩියුලය හරහා ලබාගත් තොරතුරු අනුව නිවාස සංඛ්‍යාව 12,658 ක් ලෙසත් දැක්වුණි.

(ඈ) දෙපාර්තමේන්තුව විසින් සිදුකරනු ලබන ව්‍යාපෘති පිළිබඳව තොරතුරු CRM මොඩියුලය හරහා සිදු කරන ලබන අතර දිස්ත්‍රික් 2 ක් පිළිබඳව සිදුකරන ලද නියැදි පරීක්ෂාවට අනුව ව්‍යාපෘති ආරම්භ කළ දිනය, අනුමත කිරීම, ඉදිරි කටයුතු සිදුකිරීම, ප්‍රසම්පාදන කටයුතු සිදුකිරීම, නිමකිරීම පිළිබඳ තොරතුරු මොඩියුලයට ඇතුළත් කර නොතිබූ අවස්ථා නිරීක්ෂණය විය.

(ඉ) Covid -19 සහනාධාර ලබාදීම සම්බන්ධ තොරතුරු CRM මොඩියුලයට අන්තර්ගත කළ යුතු බව වක්‍රලේඛ මඟින් දැනුවත්කර තිබුණද එය නිසි පරිදි යාවත්කාලීන කර නොතිබුණි.

3.1.5 2013 අංක 01 දරන දිවි නැගුම පනතේ 26 ඡේදයට අනුව දිවිනැගුම ප්‍රජාමූල බැංකුවල පරමාර්ථ ලෙස දිවිනැගුම ප්‍රතිලාභීන්ගේ ඉතිරි කිරීමේ සුරුද්ද ප්‍රවර්ධනය කිරීම, ආයෝජන හැකියාව වැඩි දියුණු කිරීම සහ ප්‍රතිලාභීන්ට ණය පහසුකම් සැපයීම දක්වා තිබුණි. සමෘද්ධි බැංකු හා බැංකු සමිතිවල 2014-2018 කාලය තුල සිදුවූ වංචා 135 කට අදාලව රු. 115,723,619 ක් සම්බන්ධයෙන් 2018 සහ 2019 විගණකාධිපති වාර්තාවලින් පෙන්වාදී තිබූ අතර වාර්ෂිකව වාර්තාවී ඇති මූල්‍ය වංචා හා අක්‍රමිකතා වල ප්‍රමාණාත්මක වර්ධනයක් සිදු වී තිබියදීත් මේ සම්බන්ධයෙන් ඉහළ කළමනාකරණය විසින් අවධානය යොමුකොට ඒවා වලක්වා ගැනීම සඳහා නිසි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. බැංකු මුදල් අයථා පරිහරණය හේතුවෙන් දිවිනැගුම ප්‍රතිලාභීන්ගේ අවශ්‍යතා සඳහා යෙදවීමට ඇති මුදල් ඒ සඳහා යෙදවිය නොහැකි වී තිබුණි. අනුයුක්ත කර ඇති කාර්ය මණ්ඩලය විසින් සිදුකර ඇති මූල්‍ය වංචා හා අක්‍රමිකතා වාර්තා වීම ප්‍රමාණාත්මක අගයක් ගන්නා බැවින් දිවිනැගුම පනත අනුව ඉටුකිරීමට බලාපොරොත්තු වන අරමුණු ඉටුකර ගැනීම සඳහා ඔවුන්ගෙන් ඉටුවිය යුතු රාජකාරී නිසි පරිදි ඉටු වී ඇද්ද යන්න විගණනයේදී ප්‍රශ්න ගත විය.

3.2 ආර්ථිකමය නොවූ ගනුදෙනු

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සමෘද්ධි එෆ්එම් අන්තර්ජාල රේඩියෝව සඳහා විකාශන මධ්‍යසථානයේ උපකරණ සහ පාලන මැදිරියේ වියදම් වෙනුවෙන් රු. 1,127,000 ක් ද නිලධාරීන් පුහුණු කිරීම හා අවශ්‍ය තාක්ෂණික සහාය වෙනුවෙන් රු. 1,200,000 ක් ගෙවා තිබුණු අතර මේවන විට ගිවිසුම්ගත කාලය අවසන්වීමෙන් එම වැඩසටහන ක්‍රියාත්මක කිරීම නතර වී තිබුණි. සමෘද්ධි FM අන්තර්ජාල රේඩියෝව ඇතිකිරීමේ මූලික අරමුණ වූයේ දුගීබව අවම කිරීමේ සංවර්ධන කාර්යයන්ට හා අඩු ආදායම්ලාභී ජන කොටස්වල උත්සාහයන්ට උරදෙන සන්නිවේදන රටාවක් ගොඩනගමින් සමෘද්ධි ව්‍යාපාරය පුළුල් සංවාදයකට භාජනය කරමින් එහි ඉලක්ක වඩාත් කාර්යක්ෂමව හා ඵලදායීව ජනතාව අතරට සන්නිවේදනය කිරීම වුවද, එසේ සිදුකිරීමට අන්තර්ජාල පහසුකම් නොමැති, ස්මාර්ට් ජංගම දුරකථන නොමැති සහ අනෙකුත් අවම පහසුකම් නොමැති සමෘද්ධිලාභී, අඩු ආදායම්ලාභීන්ට මෙම FM අන්තර්ජාල ගුවන් විදුලි සේවයෙන් ඵලදායී හා කාර්යක්ෂම සේවාවක් ලබාගැනීමේ හැකියාවක් පවතිද යන්න ප්‍රශ්න සහගත විය.

(ආ) 2020 වර්ෂයේදී "e" පුවත්පත එළිදැක්වීම සඳහා වසර 3 ක කාලයක් සඳහා සේවා ලබා ගැනීමේ පදනමින් මෘදුකාංග මිලදී ගැනීම, "e" පුවත්පත් ප්‍රකාශයට පත්කිරීම සහ මූලික පිටු සැකසිම වෙනුවෙන් රු. 9,403,900 ක් ගෙවීමට පෞද්ගලික ආයතනයක් සමඟ එකඟ වී තිබුණි. 2022 අප්‍රේල් මාසය වන විට අදාළ පෞද්ගලික ආයතනය විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව "e" පුවත්පත බාගත කරගත් සංඛ්‍යාව 15279 ක් හෙවත් මුළු සමෘද්ධිලාභීන්ගෙන් සියයට 0.86 ක් විය. සමාලෝචිත වර්ෂය අවසන් වන විට මේ වෙනුවෙන් දරන ලද වියදම රු.5,358,400 ක් විය.

3.3 අපේක්ෂිත නිමවුම මවටම ලබා නොගැනීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමෘද්ධිලාභී පවුල් ලක්ෂ 2 ක් සවිබලගැන්වීමේ වැඩසටහනට අදාල සැලැස්ම සකස් කිරීම සහ සමෘද්ධි ප්‍රතිලාභීන් 1,777,086 ක් කාණ්ඩගත කිරීමේ සම්ක්ෂණය සඳහා රු. මිලියන 10.83 ක ප්‍රතිපාදනවලින් පවුල් 714,900 ක් සම්ක්ෂණය වෙනුවෙන් අවශ්‍ය පවුල් කාණ්ඩ ගත කිරීමට අවශ්‍ය පෝරම මුද්‍රණය කර ගැනීම සඳහා රු.මිලියන 10.03 ක් වැයකර තිබුණි. ඒ අනුව භෞතික ප්‍රගතිය සියයට 40 ක් හා මූල්‍ය ප්‍රගතිය සියයට 93 ක් විය.

(ආ) සවිබලගැන්වීමේ වැඩසටහනට අවශ්‍ය තාක්ෂණික සහාය ලබාගැනීම හා දැනුවත් කිරීමේ වැඩසටහන් වෙනුවෙන් සමාලෝචිත වර්ෂය සඳහා රු. මිලියන 6.23 ක් ලබාදී තිබුණද දෙසැම්බර් 31 දිනට එහි මූල්‍ය ප්‍රගතිය රු. මිලියන 4.81 ක් වෙත් සියයට 77 ක් විය. මෙම මුදලින් සියයට 91 ක් නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීමට වැයකර තිබූ අතර පොළොන්නරුව හා මන්නාරම යන දිස්ත්‍රික්කවල පමණක් විවිධ ව්‍යාපෘති 9 ක් සඳහා රු. 414,883 ක් වැයකර අදාළ පුහුණුවීම් ලබා දී තිබුණි.

(ඇ) බලංගොඩ පුහුණු මධ්‍යස්ථානයේ යෝජිත පොහොර අංගනය ඉදිකිරීම සඳහා රු. 530,000 ක ප්‍රතිපාදන ලබා දී ඇතත් දෙසැම්බර් 31 දින වන විටත් එය ආරම්භකර නොතිබුණි.

(ඈ) සමෘද්ධි පවුල් ලක්ෂ 2 ක් සවිබලගැන්වීමේ වැඩසටහනේ සමාරම්භක වැඩසටහන සම්බන්ධයෙන් ජනතාව දැනුවත් කිරීම සඳහා කාර්යාල 1736 ක බැනර් ප්‍රදර්ශනය කිරීම වෙනුවෙන් විශේෂ ජීවනෝපාය ව්‍යාපෘති සංවර්ධන වැඩසටහන යටතේ වෙන්කර ඇති ප්‍රතිපාදනවලින් රු. 3,364,505 ක් වැය කර තිබුණි.

(ඉ) මානව සම්පත් සංවර්ධන යටතේ ප්‍රජා සංවර්ධන හා සැලසුම්කරණය පිළිබඳ පශ්චාත් උපාධි පාඨමාලාව සඳහා දිස්ත්‍රික් 25 න් නිලධාරීන් 50 ක් පාඨමාලාව හැදෑරීම සඳහා ඉලක්කගත කර තිබුණද දිස්ත්‍රික්ක 9 ක නිලධාරීන් 33 දෙනෙක් සහ ප්‍රධාන කාර්යාලයේ නිලධාරීන් 6 දෙනෙක් සඳහා රු. 2,340,000 ක් දෙසැම්බර් මස පේරාදෙණිය විශ්ව විද්‍යාලයට ගෙවා තිබුණි. ගෙවීම් ලේඛනය අනුව නිලධාරීන් සංඛ්‍යාව 37 ක් වූයෙන් රු. 120,000 ක් වැඩියෙන් ගෙවා ඇති බවත්, ප්‍රාදේශිය වශයෙන් තෝරා ගැනීම් නිසි පරිදි සිදුකර නොමැති හෙයින් අපේක්ෂිත අරමුණු ඉටු වී නොමැති බවත් නිරීක්ෂණය විය.

3.4 අපේක්ෂිත ප්‍රතිලාභ ලබා නොගැනීම

ප්‍රජාමූල සංවර්ධන වැඩසටහන යටතේ ප්‍රාදේශිය ලේකම් කාර්යාල 331 ක සමෘද්ධි ප්‍රජාමූල සංවිධාන හා සමෘද්ධි ප්‍රාදේශිය සංවිධාන 30842 ක යටිතල පහසුකම් සැපයීම සඳහා වූ රු. 19,000,000 ක ප්‍රතිපාදිත මුදලින් සමෘද්ධි ප්‍රජාමූල සංවිධාන හා සමෘද්ධි ප්‍රාදේශිය සංවිධාන 2742 කට කාර්යාල උපකරණ මිලදීගැනීම් සඳහා රු. 13,710,000 ක් වියදම් කර තිබුණි.

3.5 ප්‍රසම්පාදනයන්

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) රාජ්‍ය මූදල් චක්‍රලේඛ අංක 2/2020 හි 3 හා 4 ඡේදවල දැක්වෙන පරිදි හා 2021 දෙසැම්බර් 23 දිනැති 7/2020 දරන අයවැය චක්‍රලේඛය අනුව ක්‍රියාකාරී සැලැස්ම හා ප්‍රසම්පාදන සැලැස්ම සකස්කළ යුතු වුවද එසේ නොමැතිව සුවඛොජුන්හල් ඉදිකිරීම, අළුත්වැඩියාව, උපකරණ මිලදී ගැනීම බැනර් සුවරු සෑදීම ආදිය සඳහා 2021 දෙසැම්බර් මාසයේ දී රු. 10,642,564 ක් වැය කර තිබුණි.

(ආ) ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කිරීමේදී රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 (ඇ) සහ 4.2.2 (අ) ප්‍රකාරව ප්‍රසම්පාදන කටයුතු විස්තරාත්මකව සහ ප්‍රසම්පාදන කාල සටහන ඇතුළත් වන පරිදි පිළියෙළ කර නොතිබුණි. සමාලෝචිත වර්ෂයේ රු. 7,371,546 ක් වටිනා කාර්යාල උපකරණ මිලදී ගැනීම ප්‍රසම්පාදන සැලැස්මට හා ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් කර නොතිබුණි.

(ඇ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 1.2.1 පරිච්ඡේදයේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය මඟින් සහතික විය යුතු කරුණු වලට පටහැනිව සහ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.5 (ආ), (ඇ) ඡේද පරිදි සෘජු කොන්ත්‍රාත් ක්‍රමය යටතේ මිලදිගැනීම් කළයුතු අවස්ථානුගත කරුණුවලට පටහැනිව රු. 5,864,485 ක් වටිනා භාණ්ඩ උපකරණ හා ලිපිද්‍රව්‍ය 2021 ජූලි 05 දිනැති අංක අමප/21/1118/313/036 දරන අමාත්‍ය මණ්ඩලය තීරණය පරිදි රාජ්‍ය වාණිජ (විවිධ) නීතිගත සංස්ථාවෙන් මිලදී ගෙන තිබුණි.

3.6 රජයේ නිලධාරීන් ඇප කැබීම

මූදල් රෙගුලාසි 880 සඳහන් විධිවිධාන ප්‍රකාරව රජයේ මූදල්, ආදායම්, මුද්දර හා බඩු බාහිරාදිය භාර ගැනීම හෝ භාරව සිටින හා පරිපාලනමය වශයෙන් වගකිව යුතු සහ රජයේ ගිණුමට අදාළව වගකීම් පැවරී ඇති නිලධාරීන් ඇප ආඥාපනතට අනුකූලව ඇප කැබීම් කර නොතිබුණි.

3.7 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමෘද්ධි දෙපාර්තමේන්තුවේ වාහන ලේඛනයේ යතුරු පැදි 14 ක් පවතින අතර මෙම යතුරු පැදි දෙපාර්තමේන්තුවේ වත්කම් වශයෙන් පවරාගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සමෘද්ධි දෙපාර්තමේන්තුව සතුව පවතින වාහන 146 කින් වාහන 33 ක් කාර්මික දෝෂ වලට ලක්ව දීර්ඝ කාලයක සිට දෙපාර්තමේන්තු පරිශ්‍රයේ හා ඩෙන්සිල් කොඩිඛැකඩුව මාවත රථගාලේ අනාරක්ෂිතව ගාල් කර තිබුණු බව නිරීක්ෂණය විය. ඉන් වාහන 14 ක් අළුත්වැඩියා කර ධාවනය කිරීමට සුදුසු තත්ත්වයේ පවතින බව 2020 ඔක්තෝබර් මස හා 2021 ජූලි මස කාර්මික නිලධාරීන් විසින් පරීක්ෂා කර ඉදිරිපත් කරන ලද වාර්තාවලින් නිරීක්ෂණය විය. මෙම වාහන අළුත්වැඩියා කිරීමට විගණිත දිනය වූ 2022 අප්‍රේල් 24 දින දක්වා කළමනාකරණය විසින් ක්‍රියා කර නොතිබුණි. මේ හේතුවෙන් අනාරක්ෂිත පවතින මෙම වාහන කඩිනමින් අළුත්වැඩියා නොකිරීමෙන් හාවිතා කළ නොහැකි තත්ත්වයකට පත් වීම, අළුත්වැඩියා වියදම් අධිකවීම, වාහනවල අමතර කොටස් අස්ථානගතවීම සිදුවිය හැකි බවත් එය වළක්වා ගැනීම කළමනාකරණයේ වගකීම බවත් විගණනයේදී නිරීක්ෂණය විය.

3.8 විගණන විමසුම්වලට පිළිතුරු ලබා නොදීම

ඉකුත් වර්ෂයේ ඉදිරිපත් කරන ලද විගණන විමසුම් 3 හා සමාලෝචිත වර්ෂයේදී ඉදිරිපත් කරන ලද විගණන විමසුම් 3 කට පිළිතුරු ඉදිරිපත් කර නොතිබූ අතර, ප්‍රමාද කාලය මාස 1 ක සිට මාස 29 ක් ඉක්ම වූ කාල පරාසයක් වී තිබුණි. එම විමසුම්වලට අදාළව ගණනය කළ හැකි ගනුදෙනුවල වටිනාකම රු. 192,875,829 ක් විය.

3.9 කළමනාකරන දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2019 මැයි 31 දිනැති අංක DSD/HO/6/EP/2/55/10 අංක දරන දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරුන් වෙත යොමුකරන ලද අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය ප්‍රකාරව ඛොජුන්හල් ඉදිකිරීමේදී අදාළ ඉඩම දෙපාර්තමේන්තුවට පවරාගැනීමට හැකි ඉඩමක් විය යුතු බවත් අවම වශයෙන් පර්චස් 20 ක ඉඩමක් විය යුතු බවත් දක්වා තිබුණද 2016 සිට 2021 වර්ෂය දක්වා කාලය තුළ සුවඛොජුන්හල් 31 ඉදිකිරීම සඳහා දෙපාර්තමේන්තුව විසින් රු. 171,370,352 ක වියදම් දරා තිබුණද එම ඉඩම්වල නීත්‍යානුකූල අයිතිය ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2016 සිට 2021 වර්ෂය දක්වා කාලය තුලදි සුවඛොජුන්හල් ස්ථාපිත කිරීම, වැඩිදියුණු කිරීම හා අළුත්වැඩියාවන් සඳහා දෙපාර්තමේන්තුව විසින් මේ දක්වා රු. 171,370,352 ක් වියදම් දරා තිබුණද, එයින් කිසිදු ආදායමක් ලබා ගැනීමට ක්‍රමෝපායන් යොදා නොමැති බව නිරීක්ෂණය විය.

(ඇ) අධ්‍යක්ෂ ජනරාල්වරයා සඳහා වෙන්කර තිබූ නිලවාහනය සඳහා 2021 ජනවාරි සිට සැප්තැම්බර් දක්වා කාලයට අදාල රු. 323,390 ක් ඉන්ධන වියදම් දෙපාර්තමේන්තුවෙන් ලබා නොගෙන බැංකු මූල්‍ය අංශයෙන් ප්‍රතිපූර්ණය කරගෙන තිබූ අතර භාවිතා කරනු ලබන සංචිත වාහනයට අදාළ රු. 173,947 ක් වූ ඉන්ධන වියදම් දෙපාර්තමේන්තුවෙන් වැය කර තිබූ බව නිරීක්ෂණය විය. මේ අනුව අධ්‍යක්ෂ ජනරාල්වරයාට මෙම කාලසීමාවට හිමි ඉන්ධන ලීටර් 1530 ක ප්‍රතිපාදනය ඉක්මවූ රු. 255,597 ක් වැයවී තිබූ බව නිරීක්ෂණය විය.

(ඇ) ක්ෂුද්‍රමූල්‍ය අංශය වෙත වෙන්කර ඇති වාහනය එම අංශයේ සහකාර අධ්‍යක්ෂ (රා.ඉ) විසින් නිවස හා කාර්යාලය වෙත ගමන් කිරීම සඳහා භාවිතා කර තිබූ අතර වාහනය රාත්‍රී කාලයේ නිවසේ නවතා ඇති බවත් එම නිලධාරියා විසින්ම වාහනය ධාවනය කරන බවත් විගණනයේදී නිරීක්ෂණය විය. මේ අනුව වාහනය ධාවනය කිරීමට අවශ්‍ය බලය දීම, නිවසේ නවතා තැබීමට අනුමැතිය දීම පිළිබඳව සාක්ෂි හා සනාථ කිරීම් විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(ඉ) සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ වාහන ලේඛනය අනුව දෙපාර්තමේන්තුව සතුව වාහන 146 කට අදාළව වාහන ලිපිගොනු ලොග්පොත්, භාණ්ඩාඛ්‍ය ලේඛන විධිමත් පරිදි පවත්වාගෙන නොයෑම, වාහන නිසි පරිදි නඩත්තු නොකිරීම හා වාහන සම්බන්ධ අභ්‍යන්තර පාලනයේ පැවති දුර්වලතා හේතුවෙන් 2021 මූල්‍ය ප්‍රකාශන අනුව වාහන නඩත්තු වියදම් සහ මෙහෙයුම් කල්බදු වාහන කුලී වශයෙන් එකතුව රු. 36,072,853 ක් වැය දරා තිබුණි.

3.10 භාණ්ඩාඛ්‍ය පිළිබඳ පරීක්ෂාව

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2016,2017 සහ 2018 වර්ෂවලදී සිදු වූ වාහන අනතුරු 5 කට අදාළව, අනතුරු සිදු වී වසර 2 ½ සිට වසර 5 දක්වා කාලයක් ගතවීමෙන් පසු මු.රෙ 104(3), 104 (4) ප්‍රකාරව කටයුතු සිදුකර තිබුණි.

(ආ) වාහන 6 ක් සම්බන්ධයෙන් සිදු වූ අනතුරු පිළිබඳව භාණ්ඩ හා පාඩු ලේඛනයට ඇතුළත් කිරීමට කටයුතු කර නොතිබුණු බව නියැදි විගණනයේදී නිරීක්ෂණය විය.

(ඇ) මූදල් රෙගුලාසි 104 (3) ප්‍රකාරව අනතුරු සිදුවීමෙන් පසු ප්‍රාරම්භක වාර්තාව හා මූදල් රෙගුලාසි 104 (4) ප්‍රකාරව පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කළ යුතු වුවත් දෙපාර්තමේන්තුවේ වාහන 7 ක් සම්බන්ධයෙන් එම වාර්තා ඉදිරිපත් කර නොමැති බව සිදුකරන ලද නියැදි පරීක්ෂාවේදී අනාවරණය විය.

(ඇ) 2016 මැයි 05 දින අනතුරට ලක්වූ වාහනය සම්බන්ධයෙන් 2016 අගෝස්තු 10 දිනැති අධිකරණ නඩු තීන්දුව මඟින් රියදුරු වරදකරුබව තීරණය කර තිබුණි. මෙම රථය අළුත්වැඩියාව සඳහා රක්ෂණ වන්දි වශයෙන් ලැබූ රු. 564,840 ක් වැයකර තිබුණි. හානියට වගකිව යුතු පාර්ෂවයන්ගෙන් අදාළ මුදල අයකර ගැනීමට දෙපාර්තමේන්තු කළමනාකරණය විසින් සැලකිල්ලට ගෙන නොතිබුණි.

3.11 2019 /41/04 දරන ජාතික සභා තීරණය අනුව සමෘද්ධි ප්‍රජාමූල සංවිධාන හා ප්‍රාදේශිය සංවිධාන වෙත අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පනතේ 4 (3)(2) වගන්තිය අනුව සහතිකයක් නිකුත් කිරීමේදී හා වාර්ෂිකව අළුත් කිරීමේදී අයකරන ගාස්තු සමෘද්ධි ජාතික සමාජ සංවර්ධන අරමුදල බැර කිරීම සඳහා අනුමැතිය ලබා දී තිබුණි. ඒ අනුව නව සහතික සඳහා රු. 500 ක් ද අළුත් කිරීම සඳහා රු. 300 ක් ද වශයෙන් අයකරන ලද රු. 34,157,800 ක මුදලක් 2021 දෙසැම්බර් 31 දිනට සමෘද්ධි ජාතික සමාජ සංවර්ධන අරමුදලේ පැවතුණි. 1995 අංක 30 දරන ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය පනත අනුව මැයි 31 දිනට යෙදෙන ජාත්‍යන්තර දුම්වැටි විරෝධී දිනයට සමගාමීව ක්‍රියාත්මක කරන ලද කොඩි හා ස්ටිකර් අලෙවි කිරීම මඟින් ඉපයූ ආදායම රු. 46,822,495 ක් මෙම අරමුදලට බැර කර තිබුණි. මෙම සමෘද්ධි සමාජ සංවර්ධන පදනම් සම්බන්ධයෙන් භාණ්ඩාගාරයෙන් උපදෙස් ලබාගෙන එහි කටයුතු විධිමත් කර ව්‍යවස්ථාපිත තත්ත්වයක් ඇතිකර ගැනීමට කටයුතු නොකර මුදල් රැස්කිරීම හා රු. 87,500,000 ක මුදලක් ස්ථාවර තැන්පතුවල ආයෝජනය කිරීමට කටයුතු කර තිබුණි.

4. යහපාලනය

4. 1 විගණන හා කළමනාකරණ කමිටුව

විගණන හා කළමනාකරණ කමිටුව මඟින් විගණකාධිපති වාර්තා නිසි පරිදි සමාලෝචනය කර ඌනතාවයන් යළි ඇතිවීම වළක්වාලීම පිණිස අවශ්‍ය නිවැරදි පියවර ගෙන නොමැති බැවින් 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 41 වගන්තිය ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටුවේ කාර්යයන් නිසි පරිදි ඉටු වී නොතිබුණි.

5. මානව සම්පත් කළමනාකරණය

2021 දෙසැම්බර් 31 දිනට අනුමත හා තත්‍ය කාර්ය මණ්ඩලය පහත සඳහන් පරිදි විය.

වර්ගීකරණය	අනුමත	තත්‍ය කාර්ය මණ්ඩලය	පුරප්පාඩු	අතිරික්ත
ජ්‍යෙෂ්ඨ	106	66	40	
තෘතීය	2501	2,388	259	146
ද්විතීය	24,952	21,757	3942	747
ප්‍රාථමික	516	434	90	8
	28,075	24,645	4,331	901

මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2021 දෙසැම්බර් 31 දින වන විට අනුමත අධ්‍යක්ෂ තනතුරු 11 ක් , අනුමත ගණකාධිකාරී තනතුරු 20 ක් සහ දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ තනතුරු 6 ක් ද පුරප්පාඩුව පැවතුණි. මෙම පුරප්පාඩු තනතුරු සඳහා රාජකාරි ඉටුකිරීම, වැඩබැලීම සහ රාජකාරි ආවරණය කිරීම වශයෙන් පත්කිරීම් සිදු කිරීමට දෙපාර්තමේන්තුව විසින් ආරම්භයේ සිටම කටයුතු කර තිබුණි. තවද දෙපාර්තමේන්තුවේ ද්විතීක, තෘතීක හා ප්‍රාථමික මට්ටම්වල තනතුරු 4,291 ක් පුරප්පාඩුව පැවතුණ අතර අනුමත නොවූ සංවර්ධන නිලධාරී තනතුරු 746 ක් තත්‍ය කාර්ය මණ්ඩලයට අයත් විය.

(ආ) නියැදි විගණන පරීක්ෂාව අනුව පොළොන්නරුව දිස්ත්‍රික්කයේ සමෘද්ධි කාර්යාල, බැංකු හා බැංකු සමිති, කාර්යාල වල සිටිය යුතු සමෘද්ධි කළමනාකාරුවන් සංඛ්‍යාව 54 ක් වූවත් 2021 ජූනි 30 දිනට තත්‍ය සංඛ්‍යාව 27 ක් විය. සමෘද්ධි කළමනාකරුවන් 9 දෙනෙකු විසින් වසර 5 කට වැඩි කාලයක සිට ස්ථිර සේවා ස්ථානයට අමතරව පුරප්පාඩු වූ ස්ථානවල වැඩ බැලීම සිදු කරමින් පැවතුණි. තවද, සමෘද්ධි සංවර්ධන නිලධාරීන් 476 ක් අනුමත තර තිබුණද තත්‍ය සේවක සංඛ්‍යාව 410 ක් විය.

(ඇ) දෙපාර්තමේන්තුවේ බලතල සහ කාර්ය ක්‍රියාත්මක කිරීම සහ ඉටුකිරීම සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරයකු පත්කල යුතු අතර මෙම තනතුර සඳහා දෙපාර්තමේන්තුව පිහිටුවා වසර 8 ක කාලයක් තුළ අධ්‍යක්ෂ ජනරාල්වරු 11 දෙනෙකු පත්කර තිබූ අතර එම පත්වීම් බොහොමයක්ම කොන්ත්‍රාත් පදනම මත සිදුකර තිබීම දෙපාර්තමේන්තුවේ කාර්යසාධනයට අයහපත් ලෙස බලපාන බව නිරීක්ෂණය විය.

(ඈ) විශ්‍රාම වැටුප් භිමිකම් රහිත සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලට හා සේවක අර්ථ සාධක අරමුදලට අඛණ්ඩ දායකත්වයක් දරමින් දෙපාර්තමේන්තු සේවයට එක්වීමට කැමැත්ත පලකල නිලධාරීන් 870 දෙනෙකු රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කර තිබූ නමුත් උසස්වීම් පරිපාටි අනුමත කර අදාල බදවා ගැනීම් සිදු කිරීමට 2021 දෙසැම්බර් 31 දින දක්වා කටයුතු කර නොතිබුණි. තවද, පරිපාලන නිලධාරි, කාර්මික නිලධාරි, විගණන නිලධාරි තනතුරු සඳහා බදවා ගැනීම් පරිපාටි අනුමත කර ගැනීමට මේ දක්වා කටයුතු කර නොතිබුණි.

(ඉ) 2018 පෙබරවාරි 20 දිනැති අංක 3/2018 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 03 II හා III අනුව අනුප්‍රාප්තිකයෙකු පත් කිරීමට අපහසු වූද, වැඩ බැලීම වැනි විකල්ප ක්‍රියාමාර්ග මඟින් දැනට සේවාවේ සිටින නිලධාරීන්ගෙන් ඉටුකර ගත නොහැකි වූද, අත්‍යවශ්‍ය තනතුරුවලට පමණක් අදාළ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ පෞද්ගලික නිර්දේශ මත මාස 12 ක උපරිමයට යටත්ව කොන්ත්‍රාත් පදනම මත බදවා ගත හැකිය යන්න දක්වා තිබුණද, අනුප්‍රාප්තිකයෙකු පත්කිරීමට අපහසු තනතුරත් නොවන අධ්‍යක්ෂ පාලන තනතුරට විශ්‍රාමික නිලධාරියෙකු පත්කර මාස 20 ක් ගතවී තිබුණි. එම කාලසීමාවේදී සුදුසු අනුප්‍රාප්තිකයෙකු පුහුණු කිරීමේ කාර්ය, නැවත සේවයේ යොදවනු ලබන විශ්‍රාමික නිලධාරියාගේ වගකීමක් බව දැක්වුණද, චක්‍රලේඛය ප්‍රකාරව එසේ කටයුතු කර නොතිබුණි.

(ඊ) 2019 ජූලි 05 දිනැති කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය අනුව දිවි නැඟුම පනතේ 25 (3) වගන්තිය අනුව ප්‍රජා මූල බැංකු කාර්ය මණ්ඩලය සඳහා විශ්‍රාම වැටුප් සහිත රාජ්‍ය සේවකයින් ස්ථිර පදනමින් පත් කිරීම නීතියට පටහැනි බව ගරු නීතිපතිතුමා විසින් දැනුම් දී ඇති බවත් ප්‍රජා මූල බැංකු සමිතිවල දැනටමත් සේවයේ යෙදී සිටින දිවි නැඟුම පනතේ 44 (ඉ) i හා ii යටතේ දෙපාර්තමේන්තුවේ සේවයට එක් වූ නිලධාරීන් තාවකාලික පදනමින් එම ආයතනවලට මුදා "හැර ඇති බවට සැලකිය යුතු වන අතර , ඉදිරියේදී බැංකු කාර්ය මණ්ඩලය සඳහා වෙනම තනතුරු අනුමත කරවා ගැනීමටත් ඉන් අනතුරුව ස්ථිරප්පාඩු වන තනතුරු සඳහා ඒ අනුව බඳවා ගැනීම් කිරීමට කටයුතු කළ යුතු බවට දන්වා තිබුණද, 2021 දෙසැම්බර් 31 දක්වා ඒ සම්බන්ධයෙන් කටයුතු සිදු කර නොතිබූ අතර, 2021 ජනවාරි සිට 2021 දෙසැම්බර් 31 දක්වා බැංකුවල සිටින 6,444 ක් වූ සමෘද්ධි කාර්යමණ්ඩලය සඳහා දෙපාර්තමේන්තුව විසින් දල වශයෙන් රු. 3,944,366,634 ක වැටුප් ගෙවා තිබුණි.

(උ) 2017 අංක 02 දරන දිවිනැඟුම (සංශෝධිත) පනතින් සංශෝධිත 2013 අංක 1 දරන දිවිනැඟුම පනතේ 4(ඉ) iii හා iv වගන්තිය යටතේ අන්තර්ග්‍රහණය වීමට කැමැත්ත පලකරන ලද නිලධාරීන්ගේ මනාපය සංශෝධනය කිරීමට 2018 අගෝස්තු 30 දිනැති සමෘද්ධි චක්‍රලේඛ 2018/6 මඟින් අවස්ථාව ලබා දී තිබූ අතර තම මනාපය නැවත ඉදිරිපත් කර පැරණි සේවා කාලය සඳහා ද හිමිකම ලබා ගෙන තිබුණි. චක්‍රලේඛයේ II යටතේ අධිකාරියේ සේවා කාලය වෙනුවෙන් 1983 අංක 12 දරන පාරිතෝෂික පනතේ නියමයන්ට අනුව මේ වන විට එම නිලධාරීන්ගෙන් කොටසක් පාරිතෝෂික මුදල් ලබාගෙන තිබූ අතර එම මුදල් රජය වෙත ආපසු ගෙවීම් කල යුතුබව දැක්වුවද, මේ දක්වා අයකර ගෙන නොතිබුණි.

කේ. සී. පී. සේනාරත්න

ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති

විගණකාධිපති වෙනුවට

පිටපත - අධ්‍යක්ෂ ජනරාල්- රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව

පරිච්ඡේදය – 04 - කාර්යය සාධන දර්ශක

4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක

අ. අ	වැඩසටහන	විශේෂිත දර්ශක		අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්ත්ව නිමැවුම		
				100% -90%	75% -89%	50% -74%
01	සමාජ සුභසාධන වැඩසටහන	1	දිළිඳු පවුල් 1,760,485 ක් සඳහා සමෘද්ධි සහනාධාර ලබා දීම.	100%		
		2	COVID 19 වෛරසය හේතුවෙන් පීඩාවට පත්වූ පවුල් 2,817,862ක් සඳහා වාර දෙකක් යටතේ රු.5000/= බැගින් මූල්‍ය ආධාර ලබා දීම.	100%		
02	සමාජ ආරක්ෂණවැඩසටහන	1	සමෘද්ධි සහනාධාරලාභී පවුල් 161,874 දෙනෙකුට සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ ලබා දීම	100%		
		2	උසස් පෙළ හදාරන ළමුන් 314,039 ක්සඳහා සිප්දොර ශිෂ්‍යත්ව ලබා දීම	100%		
03	ජීවනෝපාය සංවර්ධන වැඩසටහන	1	ජීවනෝපාය ව්‍යාපෘති 2,608 ක් ක්‍රියාත්මක කිරීම.	100%		
		2	‘‘සෞභාග්‍යා’’ගෙවතු සංවර්ධන වැඩසටහන යටතේ හඳුනාගත් ගෙවතු හිමියන් 1,000,000 ක් සඳහා පැල හා බීජ පැකට් ලබා දීම.		76%	
04	ව්‍යවසාය සංවර්ධන වැඩසටහන	1	සුව බොජුන් හල් 12 ක් අලුතෙන් ඉදි කිරීම හා පවතින සුව බොජුන් හල් 24 ක් සංවර්ධනය කිරීම	94%		
		2	සෞභාග්‍යා අලෙවි පොලවල් 1,000 ක් පැවැත්වීම	95%		
		3	ව්‍යවසායකත්ව පුහුණු වැඩසටහන් 29 ක් පැවැත්වීම	96%		
05	නිවාස සංවර්ධන වැඩසටහන	1	“දිරිය පියස” නිවාස වැඩසටහන යටතේ නිවාස ඒකක 179 ක් සංවර්ධනය සඳහා මූල්‍යාධාර ලබාදීම	100%		

අ. අ	වැඩසටහන	විශේෂිත දර්ශක		අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්ත්ව නිමැවුම		
				100% -90%	75% -89%	50% -74%
		2	"සෞභාග්‍යා" නිවාස වැඩසටහන යටතේ නිවාස ඒකක 6,150 ක් සංවර්ධනය සඳහා මූල්‍යාධාර ලබාදීම.	97%		
06	සමාජ සංවර්ධන වැඩසටහන	1	සනීපාරක්ෂක පහසුකම් වැඩසටහන යටතේ වැසිකිළි 41,666 ක් ඉදිකිරීම සඳහා මූල්‍යාධාර ලබාදීම	100%		
		2	කසළ කළමණාකරන වැඩසටහන් 02 ක් ක්‍රියාත්මක කිරීම			50%
		3	සමාජ සංවර්ධන නිලධාරීන් සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන් 07 ක් ක්‍රියාත්මක කිරීම	100%		
07	ප්‍රජාමූල සංවිධාන වැඩසටහන	1	ප්‍රජාමූල සංවිධාන සාමාජිකයින් සඳහා පුහුණු වැඩසටහන් 356 ක් පැවැත්වීම	100%		
		2	ප්‍රජාමූල සංවිධාන හා ප්‍රාදේශීය සංවිධාන 2,660 ක යටිතල පහසුකම් සංවර්ධනය කිරීම		79%	
08	තොරතුරු තාක්ෂණ වැඩසටහන	1	සමෘද්ධි කාර්යාල 357 ක ඩිජිටල් යටිතල පහසුකම් සංවර්ධනය කිරීම			60%
		2	සමෘද්ධි ප්‍රජාමූල බැංකු 1,074ක් පරිගණකගත කිරීම			65%
		3	තොරතුරු තාක්ෂණ පුහුණු වැඩසටහන් 10 ක් පැවැත්වීම	90%		
09	මනව සම්පත් සංවර්ධන වැඩසටහන	1	දෙපාර්තමේන්තු සේවකයින්ගේ ධාරිතා සංවර්ධනය සඳහා පුහුණු වැඩසටහන් 35ක් ක්‍රියාත්මක කිරීම		88%	
		2	දෙපාර්තමේන්තුව සතු පුහුණු මධ්‍යස්ථාන 03ක් සංවර්ධනය කිරීම			67%
10	ක්ෂුද්‍ර මූල්‍ය වැඩසටහන	1	සමෘද්ධි ප්‍රතිලාභීන් 600,000 ට ක්ෂුද්‍ර මූල්‍යණය පහසුකම් සැපයීම.			58%

අ. අ	වැඩසටහන	විශේෂිත දර්ශක		අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්ත්ව නිමැවුම		
				100% -90%	75% -89%	50% -74%
		2	නව සමෘද්ධි ප්‍රජාමූල බැංකු 40ක් ස්ථාපිත කිරීම			70%
11	මාධ්‍ය හා ප්‍රචාරණ වැඩසටහන	1	"සමෘද්ධි උදානය" රූපවාහිනී වැඩසටහන් 52ක් ප්‍රචාරය කිරීම	100%		
			සමෘද්ධි FM රේඩියෝ වැඩසටහන් 363 ක් පැවැත්වීම	100%		
		3	E සමෘද්ධි පුවත්පත් 24 ක් පල කිරීම	100%		
12	සැලසුම් හා මෙහෙයුම් වැඩසටහන	1	දිස්ත්‍රික් ප්‍රගති සමාලෝචන රැස්වීම් 250 ක් පැවැත්වීම			70%
		2	ප්‍රාදේශීය ප්‍රගති සමාලෝචන රැස්වීම් 3,310 ක් පැවැත්වීම			60%
		3	දෙපාර්තමේන්තුවේ 2020 කාර්ය සාධන වාර්තාව සකස් කිරීම හා එහි පිටපත් 375 ක් මුද්‍රණය කර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම.	100%		

පරිච්ඡේදය – 05 - තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය

5.1. හඳුනාගන්නා ලද තිරසර සංවර්ධන අරමුණු

ඉලක්කය / අරමුණ		ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රතිශතය (%)		
				0% -49%	50% -74%	75% -100%
01	දුගීබව අවසන් කිරීම	2030 වන විට ලෝකයේ සියලුම ස්ථානවල වෙසෙන සියලුම පුද්ගලයින්ගේ අන්ත දරිද්‍රතාව තුරන් කිරීම.	සමෘද්ධි ප්‍රතිලාභී පවුල් ලක්ෂ 17කගේ පරිභෝජන අවශ්‍යතා සපුරාලීම සඳහා මාසිකව සහනාධාර මුදලක් ලබා දීම.			100%
			සමෘද්ධි සහනාධාරලාභී පවුල් 75,768 ක් ආර්ථික වශයෙන් සවිබල ගැන්වීම.	45%		
			ජීවනෝපාය ව්‍යාපෘති 2,608ක් ක්‍රියාත්මක කිරීම තුලින් අඩු ආදායම්ලාභීන් 762,117 කගේ ජීවන තත්වය උසස් කිරීම.		55%	
			සෞභාග්‍යා ගෙවතු සංවර්ධන වැඩසටහන යටතේ, ගෙවතු හිමියන් 1,840,469 සඳහා පැල හා බීජ පැකට් හා කුකුල් පැටවුන් ලබා දීම තුලින් එම පවුල්වල ජීවන තත්වය උසස් කිරීම.			90%
		පහළඅාදායම් මට්ටමේ අයද ඇතුලත්ව සියලුම පුද්ගලයින් සම්බන්ධයෙන් ජාතික වශයෙන් සුදුසු වන්නා වූ සමාජ ආරක්ෂණ ක්‍රම ක්‍රියාවට නැංවීම.	සමෘද්ධි සහනාධාරලාභී පවුල් 161,874 ගේ සමාජ ආරක්ෂණය ඉහල නැංවීම සඳහා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ ලබා දීම.		70%	
			සිප්දොර ශිෂ්‍යත්ව වැඩසටහන යටතේ සහනාධාරලාභී පවුල්වල උසස් පෙළ හදාරණ ළමුන් 314,039 සඳහා මාසිකව ශිෂ්‍යත්ව මුදලක් ලබා දීම තුලින් එම ළමුන්ගේ අධ්‍යාපන මට්ටම ඉහල නැංවීම			75%

ඉලක්කය / අරමුණ		ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රතිශතය (%)		
				0% -49%	50% -74%	75% -100%
			COVID-19 වෛරසය හේතුවෙන් පීඩාවට පත්වූ පවුල් 2,817,862ක් සඳහා වාර 2ක් යටතේ රු.5000/= බැගින් මූල්‍ය ආධාර ලබා දීම.			100%
		සුදුසු නව තාක්ෂණය සහ ක්ෂුද්‍රමූල්‍ය ඇතුළුව මූල්‍ය සේවාවන් සඳහා ප්‍රවේශ වීමට සමාන අයිතිවාසිකම් තහවුරු කිරීම.	සමඅද්ධිප්‍රතිලාභීන් හා අඩු ආදායම්ලාභීන් 346,615 ගේ ආර්ථික හා ජීවන මට්ටම ඉහල නැංවීම සඳහා ක්ෂුද්‍ර මූල්‍ය ණය පහසුකම් සැපයීම.		60%	
08	ආර්ථික වර්ධනය,පූර්ණ, ඵලදායී සහ යහපත් රැකියා ප්‍රවර්ධනය	කුඩා පරිමාණ සහ මධ්‍යම ප්‍රමාණයේ ව්‍යවසායන් පිහිටුවීම සහ සංවර්ධනය කිරීම දිරිගැන්වීම	සුව බොජුන් හල් 10 ක් අලුතෙන් ඉදි කිරීම හා පවතින සුව බොජුන් හල් හා අළෙවි මධ්‍යස්ථාන 25 ක් සංවර්ධනය කිරීම		70%	
09	නගර හා ජනාවාස පරිපූර්ණ, ආරක්ෂිත,සවිමත් සහ තිරසර ලෙස සකස් කිරීම.	සියලුම දෙනාට ප්‍රමාණවත් ආරක්ෂාකාරී සහ අඩු මිළට ලබා ගත හැකි නිවාස සහ මූලික සේවාවන් වෙත ප්‍රවේශය තහවුරු කිරීම සහ පැල්පත් නිවාස වැඩි දියුණු කිරීම.	සමඅද්ධි ප්‍රතිලාභී පවුල්වල නිවාස 6,164ක් වැඩි දියුණු කිරීම සඳහා මූල්‍ය ආධාර ලබාදීම. සනීපාරක්ෂක පහසුකම් නොමැති අඩු ආදායම්ලාභී පවුල් සඳහා සනීපාරක්ෂක වැසිකිළි 41,666 ක් ඉදිකිරීම			75%

5.2. තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග

i. දිළිඳු පවුල් 1,760,485 ක් සඳහා සමෘද්ධි සහනාධාර ලබා දී ඔවුන්ගේ පරිභෝජන අවශ්‍යතා සපුරා ලීම. මේ යටතේ ,රු.3,500/=, රු. 2,500/=, රු.1,500/= හා රු.420/= වශයෙන් කාණ්ඩ 04 ක් යටතේ මූල්‍ය සහනාධාරයන් මාසිකව ප්‍රතිලාභීන්ට ලබාදෙන ලද අතර, 2021 වර්ෂය තුල ලබාදුන් සහනාධාරයන් හි මූල්‍ය වටිනාකම රු.මි. 55,400.04ක් වේ.

ii. සමෘද්ධි ප්‍රතිලාභී පවුල්වල උසස් පෙළ හදාරන දරු දැරියන්ගේ අධ්‍යාපන මට්ටම ඉහල නැංවීම අරමුණු කරගෙන ක්‍රියාත්මක කරනු ලබන සිප්දොර ශිෂ්‍යත්ව වැඩසටහන යටතේ, මසකට රු.1,500/= බැගින් මාස 24 ක කාලයක් සඳහා රු.36,000/= මූල්‍ය ආධාරයක් ලබා දෙන ලද අතර, ඒ අනුව 2021 වර්ෂය තුල සමෘද්ධි සිසු දරු දැරියන් 314,039ක් සඳහා සිප්දොර ශිෂ්‍යත්ව ලබා දී ඇති අතර, ප්‍රධානය කල ශිෂ්‍යත්ව වටිනාකම රු.මි. 471.22 ක් වේ.

iii. සමෘද්ධි ප්‍රතිලාභී පවුල් වල සමාජ ආරක්ෂණය ඉහළ නැංවීම සඳහා, එම පවුල්වල දරු උපත් 15,542 ක් සඳහාත්, විවාහ 31,097 ක් සඳහාත්, ලෙඩ රෝග සඳහා 74,992 ක් සඳහාත්, මරණ 38,415 ක් සඳහාත්, නිවුන් දරු උපත් 1,828 ක් වශයෙන් මුළු පවුල් 161,874ක් සඳහා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ ලබා දීම. මේ යටතේ, ලබාදී ඇති සමාජ ආරක්ෂණ ප්‍රතිලාභයන්හි මූල්‍ය වටිනාකම රු.මි. 1,540.84 ක් වේ.

iv. COVID 19 වෛරසය හේතුවෙන් පීඩාවට පත්වූ පුද්ගලයින් සඳහා සමාජ ප්‍රතිලාභ ලබාදීමේ වැඩසටහන යටතේ, සමෘද්ධි ප්‍රතිලාභී පවුල් 1,737,120 කටත්, අඩු ආදායම්ලාභී පවුල් 726,890කටත්, වැඩිහිටි සහනාධාර ලබන පවුල් 213,593ක ටත් ආබාධ සහිත සහනාධාර ලබන පවුල් 22,951කටත් වකුගඩු සහනාධාර ලබන පවුල් 16,034ක් සඳහා වශයෙන් මුළු පවුල් 2,817,862 ක් සඳහා වාර දෙකක් යටතේ රු.5000.00/= ක මූල්‍ය ආධාර දිවයින පුරා පිහිටි සමෘද්ධි ප්‍රජාමූල බැංකු පද්ධතිය හරහා ලබාදෙන ලදි. ලබාදෙන ලද මුළු ප්‍රතිලාභ ගෙවීම්වල වටිනාකම රු.මි. 22,302.84 ක් වේ.

v. සමෘද්ධි ප්‍රතිලාභී පවුල්වල ජීවන මට්ටම ඉහල නැංවීම අරමුණු කරගෙන කෘෂිකාර්මික, ධීවර,සත්ව පාලන හා කුඩා කර්මාන්ත යන ක්ෂේත්‍රයන් යටතේ ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘති 2,608 ක් ක්‍රියාත්මක කර ප්‍රතිලාභීන් 762,117 දෙනෙකුගේ ජීවන මට්ටම ඉහළ නැංවීමට කටයුතු කිරීම. වැයකරන ලද මුදල රු.මි. 160.85 ක් වේ.

vi. "සෞභාග්‍යා"ගෙවතු සංවර්ධන වැඩසටහන යටතේ, වසම් මට්ටමින් සංවර්ධනය සඳහා ගෙවතු හිමියන් 1,840,469 හඳුනා ගන්නා ලදි. ඒ යටතේ පලතුරු පැල ප්‍රතිලාභීන් 712,142 ක් සහ එළවළු බීජ පැකට් 01 බැගින් 841,949 ක් ,පොල් පැල ප්‍රතිලාභීන් 253,964 ක් සහ කුකුළු පැටව් එක් අයකුට 10 බැගින් ප්‍රතිලාභීන් 32,414 ක් ද වශයෙන් දිස්ත්‍රික්ක 25තුල හඳුනාගත් ප්‍රතිලාභීන් සඳහා බෙදා දෙන ලදි. වැයකල මුදල රු.මි. 624.40 ක් වේ.

vii. නිවාස ලොතරැයි වැඩසටහන යටතේ රු.200,000/- නිවාස ආධාර, ප්‍රතිලාභීන් 5,650 දෙනෙකු සඳහා ද රු.600,000/-නිවාස ආධාර, ප්‍රතිලාභීන් 335 දෙනෙකු සඳහා ද ලබා දෙන ලදී. ප්‍රධානය කරන ලද මූල්‍ය ආධාර ප්‍රමාණය රු.මි. 1,331.00 ක් වේ.

viii. දිරිය පියස නිවාස වැඩසටහන යටතේ එක් අයකුට රු. 200,000.00 ක් බැගින් වන පරිදි පවුල් 179 ක් සඳහා නිවාස 179 ක් ඉදි කිරීම සඳහා රු.මි. 35.80 ක මූල්‍ය ආධාර ලබාදීම.

ix. සනීපාරක්ෂක පහසුකම් නොමැති අඩු ආදායම්ලාභී පවුල් සඳහා සනීපාරක්ෂක වැසිකිළි ඉදිකිරීමේ වැඩසටහන යටතේ ප්‍රතිලාභී පවුල් 41,666 ක් සඳහා සනීපාරක්ෂක වැසිකිළි ඉදිකිරීම. මූල්‍ය වියදම රු.මි. 1,249.87 ක් වේ.

x. සමෘද්ධි සුව බොජුන් හල් 10 ක් අලුතෙන් ඉදි කිරීම හා සුව බොජුන් හල් 25 ක් සංවර්ධනය කිරීම තුලින් සමෘද්ධි ප්‍රතිලාභී පවුල් 850 ගේ ජීවන මට්ටම ඉහල නැංවීමට හැකිවීම. වැයකරන ලද මුදල රු.මි. 105.23ක් වේ.

xi. දිවයින පුරා පිහිටි සමෘද්ධි ප්‍රජාමූල බැංකු1,074 ක් මගින් සහන පොළි ප්‍රතිශතයන් යටතේ,සමෘද්ධි හා අඩු ආදායම්ලාභීන්ගේ ව්‍යවසාය සංවර්ධනය, ජීවනෝපාය සංවර්ධනය, ස්වයං රැකියා හා පාරිභෝගික අවශ්‍යතා වෙනුවෙන්, ප්‍රතිලාභීන් 346,615 දෙනෙකු සඳහා රු.මි. 38,164 ක් වටිනා ක්ෂුද්‍ර මූල්‍ය ණය පහසුකම් සැපයීම.

xii. බැංකු සාමාජිකයින්ගේ කොටස් මුදල් වල වර්ධනය 2020 වර්ෂයට සාපේක්ෂව 2021 වර්ෂයේ රු.මි. 991 කින් වර්ධනය වී තිබීම.

xiii. පසුගිය වසරට සාපේක්ෂව සමෘද්ධි බැංකු තැන්පතු වටිනාකමෙහි වර්ධනය රු.මි. 2,497ක් වේ. ඒ අනුව සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ මූලික අරමුණු හා අනුගත වෙමින් ක්ෂුද්‍රමූල්‍යකරණය තුලින් අඩු ආදායම්ලාභී ප්‍රජාව සවිබල ගැන්වීමේ මහඟු කර්තව්‍ය ඉටුකර ගැනීම සඳහා පවතින බැංකු පද්ධතිය ශක්තිමත් වීම.

xiv. සමෘද්ධි ප්‍රජාමූල බැංකු සේවාව පුළුල්කර ණය පහසුකම් වැඩි කිරීමේ අරමුණින් නව බැංකු හා බැංකු සමිති 24 ක් ඉදිකිරීම. වැය කරන ලද මුළු මුදල රු.මි.16.19.

xv. ‘‘සෞභාග්‍යා’’වෙළඳ පොළ පැවැත්වීම තුලින් සමෘද්ධි ප්‍රතිලාභීන් ගේ නිෂ්පාදන අලෙවි කිරීම සඳහා අලෙවි පහසුකම් සැපයීම අරමුණු කර ගනිමින් දිස්ත්‍රික් 25 තුල අලෙවි පොළවල් 950ක් පැවැත්වීම. වැය කල මුදල රු.මි.35.88 ක් වේ.

xvi. ව්‍යවසායකයින් සඳහා දේශීය ආහාර නිෂ්පාදන පුහුණු වැඩමුළු පැවැත්වීම, රූපලාවන්‍ය පුහුණු වැඩසටහන් පැවැත්වීම, ව්‍යවසායක සංගම් වැඩිදියුණු කිරීම හා අන්තර්ජාල වෙළඳ කටයුතු සඳහා ව්‍යවසායකයින් යොමු කිරීම වැනි වැඩසටහන් තුලින් ව්‍යවසායකයින් 965 දෙනෙකු සඳහා ප්‍රතිලාභ ලබා දෙන ලද අතර, ඒ වෙනුවෙන් වැය කරන ලද මූල්‍ය වටිනාකම රු.මි. 4.35 ක් වේ.

පරිච්ඡේදය - 06 - මානව සම්පත් පැතිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමණාකරණය

අනුමත සේවක සංඛ්‍යාව		පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු
ජ්‍යෙෂ්ඨ	107	67	40
තෘතීයික	1,942	1,683	259
ද්විතීයික	25,510	22,461	3,049
ප්‍රාථමික	516	434	82
එකතුව	**28,075**	**24,645**	**3,430**

6.2 ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපානු ලැබ ඇති ආකාරය

මෙම දෙපාර්තමේන්තුව සඳහා අවශ්‍ය ප්‍රශස්ථ කාර්යමණ්ඩල සංයුතිය සකස් කර ඔක්තෝබර් මාසයේ දී කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත. ඒ සඳහා අනුමැතිය අවසන් අදියරේ පවතින බැවින් අනුමැතිය ලද වහාම පුරප්පාඩු තනතුරු සඳහා විධිමත් බඳවා ගැනීම් සිදු කිරීමට අපේක්ෂා කෙරේ.

6.3 මානව සම්පත් සංවර්ධනය

6.3.1 හැඳින්වීම.

සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ දැක්ම වන"වසර 2030 විට දුගී බවින් තොර සවිබලගැන්වූ සමෘද්ධිමත් ශ්‍රී ලංකාවක් බිහි කිරීම" සැබෑ කර ගැනීම සඳහා ක්‍රියාකාරීව මැදිහත් වන ශක්තිමත් මානව සම්පතක් බිහිකළ යුතුව ඇත. එබැවින් 2021 වර්ෂයේ මානව සම්පත් සංවර්ධන අංශයේ ඉලක්කය වුයේ ප්‍රතිලාභී පවුල් සවිබල ගන්වා සමෘද්ධිමත් ජාතියක් ගොඩනගා ජාතික ආර්ථිකයට දායක වීමට වෙර දරන නිළධාරීන් ශ්‍රී ලාංකික මානව ප්‍රාග්ධනයක් බවට පත්කරමින් ඔවුන් දැනුමෙන් සන්නද්ධ කරමින් සේවා තෘප්තියක් ලබා දීමයි. මෙම මානව සම්පත ඵලදායිතා කාර්යක්ෂම ගති ලක්ෂණවලින් හා දැනුම, කුසලතා හා ධනාත්මක ආකල්ප හා සුසමාදර්ශන්ගෙන් සමන්විත වූ කල්හි සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ දැක්ම හා මෙහෙවර ලඟා කර ගැනීමට හැකි මානව ප්‍රාග්ධනයක් සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව තුළම ජනිත කළ හැකිවේ. මෙවන් මානව ප්‍රාග්ධනයක් බිහි කිරීම උදෙසා මානව සම්පත් සංවර්ධන අංශයේ 2021 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම සකස් කරන ලදී. මානව සම්පත් සංවර්ධන අංශයේ සමස්ථ පුහුණුව තුලින් කාර්ය මණ්ඩලය සවිබලගැන්වීමත්, එනම් කාර්යමණ්ඩලයේ දැනුම,කුසලතා,හැකියාවන්, ධනාත්මක ආකල්ප, වටිනාකම, මනෝ රාමුව (සිතුවිලි රාමුව) හා සුසමාදර්ශයන් වැඩි දියුණු කිරීමත් අපේක්ෂා කරන ලදී.

6.3.2 මානව සම්පත් සංවර්ධන අංශයේ කාර්යභාරය

- අභ්‍යන්තර කාර්ය මණ්ඩලයේ දැනුම, කුසලතා හා ආකල්ප සංවර්ධනය කිරීම.
- සමෘද්ධි පුහුණු මධ්‍යස්ථාන කාර්යක්ෂමව හා ඵලදායීව පවත්වා ගනිමින් පුහුණු කටයුතු සඳහා යෙදවීම.

6.3.3. 2021 වර්ෂයේ ක්‍රියාත්මක කල ව්‍යාපෘති

01.සමෘද්ධි සංවර්ධන නිළධාරීන් සඳහා කාර්යක්ෂමතා කඩයිම් විභාග පැවැත්වීම.

සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ සේවය කරන සමෘද්ධි සංවර්ධන නිළධාරීන් අතරින් පළමු වන කාර්යක්ෂමතා කඩයිම් විභාගවලට පෙනී නොසිටි නිළධාරීන් සඳහා ඔවුන් විසින් සමත් විය යුතු 1 වන කාර්යක්ෂමතා කඩයිම් විභාගය සියළුම දිස්ත්‍රික් නියෝජනය වන පරිදි ඒ ඒ දිස්ත්‍රික්කවල පහසුකම් සහිත ස්ථාන වලදී පවත්වන ලදී.

මෙම නිළධාරීන් කාර්යක්ෂමතා කඩයිම් විභාගයට පෙනී සිටීමට පෙර අදාළ විෂය නිර්දේශයේ සඳහන් විෂය කරුණු සම්බන්ධයෙන් දැනුවත් කිරීම සඳහා දිස්ත්‍රික් මට්ටමින් සම්මන්ත්‍රණ පවත්වා දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වන ලදී.

02. ආයතනික, පරිපාලන හා සංවර්ධන විෂයන්ට අදාළව නිළධාරී පුහුණුව ලබා දීම.

මේ යටතේ අවශ්‍ය විෂයානුබද්ධ දැනුම ලබා දීම සඳහා, පහත සඳහන් වැඩසටහන් පවත්වන ලදී.

I. බැංකු පරිගණක ගත කිරීම පිළිබඳව විගණන නිළධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන් 04ක් සහ ප්‍රජා මූල සංවිධානවල ගිණුම් ක්‍රියාවලිය පිළිබඳව උපාධිධාරී සංවර්ධන නිලධාරීන් පුහුණු වැඩසටහන් 09 ක් පවත්වා දැනුවත් කරන ලදී. එමෙන්ම ජීවනෝපාය සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරන ආකාරය පිළිබඳව අනුරාධපුර දිස්ත්‍රික් කාර්ය මණ්ඩලය දැනුවත් කරන ලදී.

II. දිස්ත්‍රික් ගිණුම් විෂයභාර නිළධාරීන් සඳහා වැටුප් පරිවර්තනය හා වැටුප් සකස් කිරීම පිළිබඳව දැනුම යථාවත් කිරීම.

දිවයිනේ දිස්ත්‍රික් 25 නියෝජනය කරමින් ගණකාධිකාරීවරුන් හා දිස්ත්‍රික් ගිණුම් විෂයභාර නිළධාරීන් දැනුවත් කිරීම මේ යටතේ සිදු කරන ලදී. ගිණුම් විෂය පිළිබඳ දැනුම යථාවත් කිරීම සහ නවීන දැනුම ලබාදීම සඳහා මෙම වැඩසටහන සංවිධානය කරන ලදී.

III. විශ්‍රාම වැටුප් ලිපිගොනු සකස් කිරීම පිළිබඳව නිළධාරීන් දැනුවත් කිරීම.

ක්‍රම 02 ක් යටතේ නිළධාරීන් දැනුවත් කිරීම සිදු කරන ලදී.
Zoom තාක්ෂණය ඔස්සේ සියළුම දිස්ත්‍රික් නියෝජනය කරමින් විශ්‍රාම වැටුප් ලිපිගොනු සකස් කරන නිළධාරීන් දැනුවත් කරන ලදී.

මීට අමතරව විශ්‍රාම වැටුප් ලිපිගොනු සකස් කිරීමේ ප්‍රමාදවීම් පවතින විශේෂ ගැටළු පවතින දිස්ත්‍රික් වලට ප්‍රධාන කාර්යාලයේ විශ්‍රාම වැටුප් අංශයේ කාර්ය මණ්ඩල ගොස් ඔවුන් හමු වී ගැටළු විසඳා විශ්‍රාම වැටුප් ලිපිගොනු සකස් කිරීම කඩිනම් කිරීමේ කාර්යය මේ යටතේ ක්‍රියාත්මක කරන ලදී.

03. සමෘද්ධි කළමණාකරුවන් ප්‍රජා සංවර්ධනය හා සැළසුම්කරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලා හැදෑරීම සඳහා යොමු කිරීම.

පේරාදෙණිය විශ්ව විද්‍යාලය මඟින් පවත්වනු ලබන ඉහත සඳහන් පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව හැදෑරීම සඳහා අප දෙපාර්තමේන්තුවේ නිළධාරීන් යොමු කර ඇත. මෙහි අන්තර්ගතයේ සඳහන් කරුණු දිළිඳුකම පිටු දැකීම සඳහා ප්‍රජාව වෙනුවෙන් ක්‍රියාත්මක කරනු ලබන සංවර්ධන වැඩසටහන් සහ ක්‍රමෝපායන්ට අදාලව සකස් කර ඇත. එම දැනුම අප නිලධාරීන්ට ලබාදීම දිළිඳුකම පිටු දැකීම සඳහා ක්‍රියාත්මක කරනු ලබන වැඩසහටහන් වඩාත් නිවැරදි කිරීමේදී උපකාරී වේ.

04. 2022 රජයේ අයවැය යෝජනා අනුව සමෘද්ධි වැඩසටහන යටතේ ක්‍රියාත්මක කරනු ලබන සංවර්ධන වැඩසටහන් පිළිබඳව නිළධාරීන් හා ප්‍රජා නායකයින් බැංකු කලාප මට්ටමින් දැනුවත් කිරීම.

මේ යටතේ දිවයිනේ පවතින සියළුම බැංකු කලාපය අනුව රාජකාරී කරන නිළධාරීන් සහ එම බැංකු කලාපයේ ප්‍රජා නායකයින්ට 2022 වර්ෂයේ අයවැය යෝජනා අනුව රජය විසින් දිළිඳු ජනයා ඉලක්ක කර දියත් කරනු ලබන ප්‍රජා සංවර්ධන වැඩසටහන් සඳහා ප්‍රතිලාභීන් තෝරා ගැනීම, ව්‍යවසායකයින් තෝරා ගැනීම, ප්‍රතිපාදන ලබා ගැනීම හා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම මෙන්ම එහිදී එක් එක් ආයතන වලට පැවරෙන කාර්යය පිළිබඳව ද මෙහිදී දැනුවත් කිරීම් කරන ලදී.

05. A+ කණ්ඩායම සඳහා NVQ LEVEL 1V සහතිකය RPL ක්‍රමවේදය යටතේ ලබා දීම.

සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ සියළුම දිස්ත්‍රික්කවල තොරතුරු තාක්ෂණ අංශයට අනුයුක්තව බැංකු හා වෙනත් කාර්යාල මට්ටමින් සේවය කරන A+ පාඨමාලාව හදාරණ ලද වසර 04 ක සේවා පළපුරුද්දක් ඇති නිළධාරීන්ට අමතර අධ්‍යාපන සුදුසුකම් ලබා දීම සඳහා NVQ LEVEL 1V සහතිකය RPL ක්‍රමවේදය යටතේ ලබා දීම සඳහා ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය වෙත යොමු කරන ලදී. 2022 මාර්තු/අප්‍රේල් මාසය තුළ නිලධාරීන් ප්‍රායෝගික පරීක්ෂණවලට යොමුකර මෙම සහතික පත් නිකුත් කිරීමේ වැඩපිළිවෙල නිමාවට පත්වීමට නියමිතය.

06. නවක උපාධිධාරී සංවර්ධන නිළධාරීන් සඳහා තම රාජකාරීන් පිළිබඳව දැනුවත් කිරීම.

සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවට අනුයුක්ත කරන ලද උපාධිධාරී සංවර්ධන නිළධාරීන්ට පැවරී ඇති රාජකාරීන් පිළිබඳව දැනුවත් කිරීම හා සමෘද්ධි ව්‍යාපාරය සහ එය ක්‍රියාත්මක වන කරන ආකාරය පිලිබඳව දැනුවත් කිරීම සඳහා වැඩමුළු පවත්වා පැහැදිලි කර දීම මෙම වැඩසටහන යටතේ සිදු විය.

07. සමාජ වැඩ පිළිබඳ කුසලතා සංවර්ධන කිරීම.

සමාජ වැඩ පිළිබඳ කුසලතා වර්ධනය සඳහා නවක උපාධිධාරීන් සඳහා සමාජ වැඩ පිළිබඳ මූලික කුසලතා වර්ධනය කිරීමේ අරමුණින් දිස්ත්‍රික් 25 ක් පුරා පිහිටි සේවා ස්ථානවලට අනුයුක්ත කර සේවය කරන නිලධාරීන්ට ZOOM තාක්ෂණය ඔස්සේ දින 06 ක පුහුණු වැඩසටහනක් පවත්වා අමතර දැනුම ලබා දෙන ලදී. මෙම වැඩසටහන ජාතික සමාජ සංවර්ධන ආයතනේ පුර්ණ අනුග්‍රහය යටතේ සිදුකරන ලදී.

08. YOULEAD ආයතනය හා ඒකාබද්ධව ව්‍යවසායකත්ව සංවර්ධන පුහුණු වැඩසටහන් පැවැත්වීම.

ව්‍යාපාරයක් ආරම්භ කර තම ජීවනෝපාය නඟා සිටුවා ගැනීමට කැමති ප්‍රතිලාභීන් තෝරා ඔවුන්ට ව්‍යවසායකත්වය පිළිබඳව දැනුම හා පුහුණුව ලබා දී ඔවුන් ව්‍යවසායකයින් බවට පත් කර ඔවුන් ජාතික ආර්ථිකයේ හවුල්කරුවන් බවට පත් කිරීමේ අරමුණින් මෙම පුහුණු වැඩසටහන ක්‍රියාත්මක කරන ලදී.

ඒ අනුව, මෙම දැනුවත් කිරීමේ පුහුණු වැඩසටහන් පැවැත්වීම සඳහා දිවයිනේ සියළුම දිස්ත්‍රික් නියෝජන කරමින් නිළධාරීන් 172 කු ගෙන් යුත් පුහුණු සංචිතයක් සකස් කරන ලදී. මෙම පුහුණුකරු සංචිතයේ නිළධාරීන් සඳහා පළමුව දින 06 ක zoom තාක්ෂණය ඔස්සේද, ඉන් අනතුරුව දින 03 ක පුහුණුකරු පුහුණුව සියළු පහසුකම්වලින් සමන්විත හෝටල්වලට කැඳවා භෞතිකව පුහුණුව ලබා දී දැනුමෙන් සන්නද්ධ කරන ලදී.

ඉහත ආකාරයට පුහුණු කරන ලද පුහුණුකරු සංචිතයේ පුහුණුකරුවන් මඟින් දිස්ත්‍රික්ක 08 ක ක්ෂේත්‍ර නිළධාරීන් දැනුවත් කර සුදුසු නිර්ණායක යටතේ ප්‍රතිලාභීන් හඳුනා ගෙන ඔවුන් ව්‍යවසායකින් බවට පත් කිරීම සඳහා අවශ්‍ය පුහුණු වැඩසටහන් පවත්වනු ලැබේ.

09. විදේශ ශිෂ්‍යත්ව සඳහා නිළධාරීන් යොමු කිරීම.

කලාපීය රටවල් දිළිඳුකම පිටු දැකීම සඳහා යොදා ගන්නා උපක්‍රම හා උපාය මාර්ග ඇතුළත් සංවර්ධන වැඩසටහන්වල අත්දැකීම් අප දෙපාර්තමේන්තුවේ නිළධාරීන්ට ලබා දීමේ අරමුණින් විදේශ සම්පත් දෙපාර්තමේන්තුව විසින් එවනු ලබන විදේශ පුහුණු වැඩමුළු අත්දැකීම් හුවමාරු වැඩසටහන් ඇතුළු විදේශ ශිෂ්‍යත්ව සඳහා නිළධාරීන් යොමු කිරීම මේ යටතේ සිදු කරන ලදී.

10. ක්ෂුද්‍ර මූල්‍ය බැංකු කාර්ය මණ්ඩලය සඳහා ගිණුම්කරණය සහ ව්‍යාපාර අධ්‍යනය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලා පැවැත්වීම.

ශ්‍රී ලංකා වරලත් ගිණුම්කරණ හා ව්‍යාපාර අධ්‍යනය ආයතනය හා ඒකාබද්ධව සමෘද්ධි ක්ෂුද්‍ර මූල්‍ය බැංකු හා බැංකු සමිතිවල සේවය කරන සමෘද්ධි කළමණාකරුවන් හා සමෘද්ධි සංවර්ධන නිළධාරීන් සඳහා ඉහත පුහුණු වැඩසටහන පවත්වන ලදී. දේශීය රාජ්‍ය හා පෞද්ගලික බැංකුවල අනුගමනය කරනු ලබන කළමනාකරණය, ගිණුම්කරණය, බැංකුකරණය ඇතුළු අනෙකුත් සම්මත ක්‍රම පිළිබඳ දැනුම සහ පුහුණුව ලබා දී එතුළින් අපගේ බැංකු පද්ධතිය වඩාත් කාර්යක්ෂම හා සඵලදායී තත්වයට පත් කිරීමේ අරමුණින් දේශීය හා ජාත්‍යන්තරව පිළිගත් විෂය නිර්දේශයන් යටතේ ඉහත පුහුණු වැඩසටහන දින 06 ක් පුරා නේවාසිකව පවත්වා අවශ්‍ය දැනුම ලබා දීමට කටයුතු කරන ලදී.

11. සමෘද්ධි පුහුණු මධ්‍යස්ථානය නඩත්තු කිරීම.

සමෘද්ධි දෙපාර්තමේන්තුවට අයත් නිල්ලඹ, සමනළවැව සහ මාතර පිහිටි සමෘද්ධි පුහුණු මධ්‍යස්ථාන නඩත්තුව සහ අධීක්ෂණය කිරීම මේ යටතේ සිදුවේ.

ඒ අනුව මාතර සහ නිල්ලඹ පුහුනු මධ්‍යස්ථානවල අත්‍යාවශ්‍ය අළුත්වැඩියා කටයුතු පසුගිය වසරේ කරන ලදී. එමෙන්ම අත්‍යවශ්‍ය උපකරණ මිලදී ගැනීම ද කරන ලදී.

සංඛ්‍යා සටහන - (XXIV)

2021-ක්‍රියාත්මක කල ව්‍යාපෘතිවල භෞතික ප්‍රගතිය හා මූල්‍ය ප්‍රගතිය (සාරාංශය)

වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාල සීමාව	සමස්ථ ආයෝජනය (Rs 000)		වැඩසටහනේ ස්වභාවය (දේශය / විදේශීය)	නිමැවුම / ලබාගත් දැනුම
			දේශීය	විදේශීය		
සමෘද්ධි සංවර්ධන නිළධාරීන් සඳහා කාර්යක්ෂමතා කඩයිම් විභාග පැවැත්වීම	නිළධාරීන් 1,601	දින 01	1.69		දේශීය	සමෘද්ධි සංවර්ධන නිළධාරීන් සඳහා පළමු වන කාර්යක්ෂම කඩයිම් විභාගයේ සම්මන්ත්‍රණ පැවැත්වීම
ආයතන හා පරිපාලන විෂයන්ට අදාළ පුහුණු වැඩසටහන් (කාර්යාල කටයුතු/ විනය කාර්යය පටිපාටිය/ ගිණුම් පුහුණුව / විගණන පුහුණුව)	නිළධාරීන් 267	දින 03 දින 03	0.69		දේශීය	විගණන නිළධාරීන් සඳහා බැංකු පරිගණක ගත කිරීම පිළිබඳ පුහුණුව. **වැඩමුළු 04 ක් පැවැත්වීම.** උපාධිධාරී සංවර්ධන නිළධාරීන් සඳහා ප්‍රජා මූල සංවිධාන වල ගිණුම් ක්‍රියාවලිය පිළිබඳ දැනුවත් කිරීම. **වැඩමුළු 01.**

වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාල සීමාව	සමස්ථ ආයෝජනය (Rs 000)		වැඩසටහනේ ස්වභාවය (දේශය / විදේශීය)	නිමැවුම / ලබාගත් දැනුම
			දේශීය	විදේශීය		
දිළිඳු ජනතාව සවිබල ගැන්වීමේ දී සමෘද්ධි නිලධාරීන්ගේ කාර්යභාරය පිළිබඳ දැනුවත් කිරීම.	නිළධාරීන් 862	දින 1/2	0.04		දේශීය	අනුරාධපුර දිස්ත්‍රික් කාර්ය මණ්ඩලයේ නිළධාරීන් 2021 ජීවනෝපාය සංවර්ධන වැඩසටහන් පවත්වන ආකාරය පිළිබඳ දැනුවත් කිරීම. **වැඩසටහන් 01**
සමෘද්ධි කළමණාකරුවන් සඳහා ප්‍රජා සංවර්ධන හා සැළසුම්කරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලා පැවැත්වීම.	නිළධාරීන් 39	වර්ෂ 01	2.43		දේශීය	පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පශ්චාත් උපාධි පාඨමාලා ආයතනය මඟින් පවත්වන ප්‍රජා සංවර්ධනය හා සැලසුම් කරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව හැදෑරීම සඳහා සමෘද්ධි කළමණාකරුවන් යොමුකර ඇත. **වැඩසටහන් 01**
2022 අයවැය යෝජනා අනුව සමෘද්ධි වැඩසටහන පිළිබඳව බැංකු කාර්ය මණ්ඩලය හා ප්‍රජා නායකයින් කලාප මට්ටමින් දැනුවත් කිරීම.	නිළධාරීන් 64,320	දින 1/2	10.71		දේශීය	බැංකු කලාප මට්ටමින් නිළධාරීන් හා ප්‍රජා නායකයින් දැනුවත් කිරීමේ වැඩසටහන් 915 පවත්වා ඇත.
A+ නිළධාරීන් සඳහා NVQ LEVEL 4 සහතික පත් ලබා දීම.	නිළධාරීන් 188	මාස 03	1.83		දේශීය	ශ්‍රී ලංකා ව්‍යාත්තීය පුහුණු අධිකාරිය වෙත නිළධාරීන් ඇගයීම් හා පරීක්ෂණ සඳහා යොමු කර ඇත. වැඩසටහන් 01
සමෘද්ධි පුහුණු මධ්‍යස්ථාන නඩත්තු කිරීම						
නිල්ලඹ පුහුණු මධ්‍යස්ථානය						
ක්‍රීඩාපිටිය, ගොඩනැගිල්ලේ අත්‍යාවශ්‍ය අළුත්වැඩියා කටයුතු කිරීම.			1.64		දේශීය	ගොඩනැගිල්ලේ අත්‍යාවශ්‍ය අළුත්වැඩියා කටයුතු අළුත්වැඩියා කටයුතු කර ඇත.

වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාල සීමාව	සමස්ථ ආයෝජනය (Rs 000)		වැඩසටහනේ ස්වභාවය (දේශය / විදේශීය)	නිමැවුම / ලබාගත් දැනුම
			දේශීය	විදේශීය		
මාතර පුහුණු මධ්‍යස්ථානය						
මාතර පුහුණු මධ්‍යස්ථානයේ විදුලි සෝපානය අළුත්වැඩියා කිරීම, උපකරණ මිලදී ගැනීම,			0.38		දේශීය	වතුර මෝටරය, Fax mechine උපකරණ මිළදී ගෙන ඇත. මාතර පුහුණු මධ්‍යස්ථානයේ විදුලි සෝපානය අළුත්වැඩියා කර ඇත.
මාතර පුහුණු මධ්‍යස්ථානයේ කාබනික පොහොර ව්‍යාපෘතිය			0.03		දේශීය	කාබනික පොහොර ව්‍යාපෘතිය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වා ඇත.
ගොඩනැගිල්ලේ අත්‍යාවශ්‍ය අළුත්වැඩියා කටයුතු කිරීම.			4.44		දේශීය	ගොඩනැගිල්ලේ අත්‍යාවශ්‍ය අළුත්වැඩියා කටයුතු කරඇත.
දිස්ත්‍රික් නිලධාරීන්ගේ ආකල්ප සංවර්ධනය / ආතති කළමනාකරණය/ නායකත්ව හැකියා වර්ධන පුහුණු වැඩසටහන්	නිළධාරීන් 702	දින 01	0.72		දේශීය	අළුතින් බඳවා ගන්නා ලද උපාධිධාරී සංවර්ධන නිලධාරි විෂයානු බද්ධව දැනුවත් කිරීමේ **වැඩ සටහන් 14 ක් පැවැත්වීම.**
ප්‍රධාන කාර්යාලයේ සහ දිස්ත්‍රික් නිලධාරීන් පුහුණු කිරීම						
නව පත්වීම්ලාභී සමෘද්ධි සංවර්ධන නිලධාරීන් සඳහා සමාජ වැඩ මූලික කුසලතා පුහුණුව පිළිබඳ කෙටි කාලීන පුහුණු වැඩසටහන	නිළධාරීන් 55	දින 02	0.28		දේශීය	ගිණුම් විෂයට අදාල දිස්ත්‍රික් කාර්ය මණ්ඩලය ට වැටුප් සකස් කිරීමේ පුහුණුව ලබාදීම
විශ්‍රාම වැටුප් ගෙවීම් කටයුතු කඩිනම් කිරීම.Zoom තාක්ෂණය ඔස්සේ නිලධාරීන්ට පුහුණුව ලබාදීම	නිළධාරීන් 656	දින 06 දින 01	0		දේශීය	Zoom තාක්ෂණය ඔස්සේ දින 06 ක් පුරා නිලධාරීන් 736 දෙනෙකු සඳහා වැඩසටහන් 06 ක් පවත්වන ලදී. Zoom තාක්ෂණය ඔස්සේ දිස්ත්‍රික් 25 නියෝජනය වන පරිදි වැඩසටහන් 09 ක් පවත්වන ලදී.

වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාල සීමාව	සමස්ථ ආයෝජනය (Rs 000)		වැඩසටහනේ ස්වභාවය (දේශය / විදේශීය)	නිමැවුම / ලබාගත් දැනුම
			දේශීය	විදේශීය		
විශ්‍රාම වැටුප් ගෙවීම් කටයුතු කඩිනම් කිරීම-දිස්ත්‍රික් නිලධාරීන්ට පුහුණුව ලබා දීම	නිළධාරීන් 345	දින 01	0.26		දේශීය	විෂය භාර නිලධාරීන් සඳහා විශ්‍රාම වැටුප් ලබා දීම පිළිබඳව පුහුණුවලබා දී ඇත.
ව්‍යවසායකත්ව සංවර්ධන පිළිබඳ දැනුම යාවත්කාලීන කිරීම	නිළධාරීන් 5,333	දින 06	1.87		දේශීය	නිලධාරීන් 172 දෙනෙකු සඳහා ව්‍යවසායකත්ව සංවර්ධනය පිළිබඳ පුහුණුකරු පුහුණු (TOT) කර අවසන් කර ඇත. දිස්ත්‍රික් 08 ක්ෂේත්‍ර නිලධාරීන් ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන පිළිබඳ දැනුවත් කිරීම
නිලධාරීන්ගේ උසස් අධ්‍යාපන කටයුතු සඳහා පාඨමාලා ගාස්තු ලබා දීම. (පශ්චාත් උපාධි/ උපාධි/ ඩිප්ලෝමා පාඨමාලා.	නිළධාරීන් 37	1Month/ 01Year	1.69		දේශීය	නිළධාරීන් 37 දෙනෙකුගේ අයදුම් පත් විශ්ලේෂණය කර පාඨමාලා ගාස්තු ලබා දී ඇත.
ක්ෂුද්‍ර මූල්‍ය බැංකු කාර්ය මණ්ඩලය පුහුණු කිරීම.						
ගිණුම්කරණය සහ ගණකාධිකරණය පිළිබඳ පුහුණු පාඨමාලාව		දින 06	9.95			CMA ආයතනය හා ඒකාබද්ධව වැඩසටහන් 11 ක් යටතේ ප්‍රජා මූල බැංකු හා බැංකු සමිති වල නිළධාරීන් 585 දෙනෙකු පුහුණු කර ඇත.
නිලධාරීන්ගේ උසස් අධ්‍යාපන කටයුතු සඳහා පාඨමාලා ගාස්තු ලබා දීම. (පශ්චාත් උපාධි/ උපාධි/ ඩිප්ලෝමා පාඨමාලා.)						
විදේශීය - පුහුණු වැඩසටහන් -						
විදේශ සම්පත් දෙපාර්තමේන්තුව විසින් යොමු කරනු ලබන විදේශ පුහුණු අවස්ථා සඳහා සුදුසු නිලධාරීන් යොමුකිරීම.	නිළධාරීන් 8	දින 03	0	විදේශීය		කොරියානු /තායිලන්ත/ ජපන් රජය විසින් පවත්වන පශ්චාත් උපාධි පාඨමාලාව/ පුහුණු වැඩසටහන්, හැදෑරීම සඳහා සුදුසුකම් ලැබූ නිළධාරීන්ට අයදුම් කරන ලෙස සියළුමකාර්ය මණ්ඩල දැනුවත් කර ඇත.

පරිච්ඡේදය -07 - අනුකූලතා වාර්තාව

අංකය	අදාල කර ගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වලක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ / ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ.**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ.		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ.		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම (වාණිජ අත්තිකාරම් ගිණුම)	අදාල නොවේ.	වානිජ අත්තිකාරම් ගිණුම් පවත්වාගෙන නොයයි.	
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම	අදාල නොවේ.	ගබඩා අත්තිකාරම් ගිණුම් පවත්වාගෙන නොයයි.	
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම	අදාල නොවේ.	විශේෂ අත්තිකාරම් ගිණුම් පවත්වාගෙන නොයයි.	
1.6	වෙනත්	අදාල නොවේ.	වෙනත් අත්තිකාරම් ගිණුම් පවත්වාගෙන නොයයි.	
2	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම. (මු.රේ. 445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.5	සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ.		

අංකය	අදාල කර ගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වලක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
2.6	චෙක්පත් හා මුදල් ඇනවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත් කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.9	හානි පාඩු ලේඛනය යාවත් කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA-N20) යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ.		
03	**මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මු.රෙ.135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුල බලතල පවරා තිබීම	අනුකූල වේ.		
3.2	මූල්‍ය බලතල පවරා දීම පිළිබඳ ආයතනය තුල දැනුවත් කර තිබීම	අනුකූල වේ.		
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම	අනුකූල වේ.		
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ.		
04	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ.		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ.		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ.		
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ.		

අංකය	අදාල කර ගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වලක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		
5	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට , සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම	අනුකූල වේ.		
6	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ. 134(2) DMA/1-2019 වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ.		
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුල දී පිළිතුරු සපයා තිබීම	අනුකූල නොවේ.	දිස්ත්‍රික් ප්‍රාදේශීය මට්ටම් දක්වා විහිදීම හේතුවෙන් විගණන විමසුම් සඳහා පිලිතුරු ප්‍රමාද වන අවස්ථා ඇත.	දිස්ත්‍රික් විගණන ඒකකය හරහා පිළිතුරු ගෙන්වා ගැනීමට කටයුතු කර ඇත.
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියළුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ.		
6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියළුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපති වරයාට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		
7	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාල වර්ෂය තුළ පවත්වාගෙන තිබීම	අනුකූල වේ.		

අංකය	අදාල කර ගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වලක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
8	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිල දී ගැනීම් හා අපහරණය කිරීම් පිලිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත්කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම	අනුකූල වේ		
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාල වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌනතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුල සිදුකොට තිබීම	අනුකූල වේ		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රේ. 772 අනුව සිදු කිරීම	අනුකූල වේ		
9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස්කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
9.2	වාහන ගර්හිත වී මාස 06 ට වඩා අඩු කාලයකදී අපහරනය කර තිබීම	අනුකූල නොවේ	තාකිෂණික කමිටු වාර්තා අනුව සුදුසු වාහන අපහරණය කිරීමට කටයුතු කරනු ලැබේ.	

අංකය	අදාල කර ගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වලක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103,104,109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	අනුකූල වේ		
9.6	කල් බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම	අනුකූල වේ		
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		
10.2	සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අනුකූල වේ.		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කල යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුලත නිරවුල් කර තිබීම	අනුකූල වේ.		
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල නොවේ.	ගමන් වියදම් ප්‍රතිපාදනය පවත්නා වර්ෂයේ වැය දැරීමට ප්‍රමාණවත් නොවීම.	
11.2	මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කල පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම් වලට එලඹීම	අනුකූල නොවේ.	ගමන් වියදම් ප්‍රතිපාදනය පවත්නා වර්ෂයේ වැය දැරීමට ප්‍රමාණවත්නොවීම.	

අංකය	අදාල කර ගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වලක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
12	**රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම**			
12.1	සීමාවන් වලට අනුකූල වීම	අනුකූල වේ.		
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදුකර තිබීම.	අනුකූල වේ.		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟ හිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	අනුකූල නොවේ.	සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ සුවිශේෂ තත්ත්වයන් තුල තව දුරටත් නිරවුල් කලයුතු ණය ශේෂ පවතී.	ණය ශේෂ නිරවුල් කිරීමට අවශ්‍ය විධි විධාන සලසා ඇත.
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම	අනුකූල වේ.		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූල වේ.		
14.2	මු.රේ. 371 ප්‍රකාරව නිකුත් කල තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුලත නිරවුල් කර තිබීම	අනුකූල නොවේ.	කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් ඇතැම් අත්තිකාරම් නියමිත කාල සීමාව තුල පියවා ගැනීමට නොහැකි වීම.	ප්‍රමාදයන් වැලැක් වීම සඳහා ක්‍රියාමාර්ග ගෙන ඇත.
14.3	මු.රේ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූල නොවේ.	පුහුණු මධ්‍යස්ථාන සඳහා නිකුත් කරන ලද අත්තිකාරම් රු.250000.00කට සීමාකර නිවැරදි කර ඇත.	

අංකය	අදාල කර ගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වලක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම	අනුකූල වේ.		
15	**ආදායම් ගිණුම**			
15.1	අදාළ රෙගුලාසිවලට අනුකූලව, රැස්කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදුකොට තිබීම	අදාල නොවේ.	වෙන් කල ආදායම් ශීර්ෂයක් නොමැත	
15.2	රැස්කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම	අදාල නොවේ.	වෙන් කල ආදායම් ශීර්ෂයක් නොමැත	
15.3	මු.රේ. 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අදාල නොවේ.	වෙන් කල ආදායම් ශීර්ෂයක් නොමැත	
16	**මානව සම්පත් කළමණාකරනය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම	අනුකූල වේ		
16.2	කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයින් වෙත රාජකාරී ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම	අනුකූල වේ		
16.3	20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියළුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත්කර තිබීම.	අනුකූල වේ.		
17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම**			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබාදීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය තුළ තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම	අනුකූල වේ		
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		

අංකය	අදාල කර ගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වලක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2008 හා 05/2018 (1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කොට තිබීම.	අනුකූල වේ.		
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම.	අනුකූල වේ.		
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම.	අනුකූල වේ		
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 ට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම.	අනුකූල වේ		
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ථ කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්යසාධන ගිවිසුම් අත්සන් කර තිබීම.	අනුකූල වේ		
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිළධාරියෙකු පත්කර තිබීම.	අනුකූල වේ		
20	**විගණන ඡේදවලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම.	අනුකූල වේ		

09. සංවර්ධන වැඩසටහන්වලට අදාල ඡායාරූප

සුව හොජුන් හල් සංවර්ධන වැඩසටහන



ගම්පහ දිස්ත්‍රික්කයේ මිරිගම ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ සමෘද්ධි සුව බොජුන්හල



මාතලේ දිස්ත්‍රික්කයේ ගලේවෙල ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ සමෘද්ධි සුව බොජුන්හල

“ සෞභාග්‍යා” නිවාස සංවර්ධන වැඩසටහන

කුරුණෑගල දිස්ත්‍රික්කය -මහව ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසය අයි.එම්.ලිලාරත්න මහතාගේ නිවස ඉදි කිරීම සඳහා ආධාර කිරීම.



පෙර



පසු

ගම්පහ දිස්ත්‍රික්කය - බියගම ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ කේ. සුරංගනී මියගේ නිවස ඉදි කිරීම සඳහා ආධාර කිරීම



පෙර



පසු

“දිරිය පියස” නිවාස සංවර්ධන වැඩසටහන

මහව ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයේ 157 අටවරල ග්‍රාම නිලධාරි වසම - බී.එම්.ජයරත්න මැණිකේ මියගේ නිවස ඉදි කිරීම සඳහා ආධාර කිරීම.



පෙර



පසු

සනීපාරක්ෂක සංවර්ධන වැඩසටහන



පුත්තලම දිස්ත්‍රික්කය ආණමඩුව ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසය



ගාල්ල දිස්ත්‍රික්කය කරන්දෙනිය ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශය

පුස්තකාල සංවර්ධන වැඩසටහන



පුත්තලම ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසය ළමා සමාජ පුස්තකාල වැඩසටහන



අනුරාධපුරය දිස්ත්‍රික්කය මනුපේ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශය ළමා සමාජ පුස්තකාල වැඩසටහන